

# 2018
## වාර්ෂික වාර්තාව

LECO

සීමාසහිත ලංකා විදුලි (පෞද්ගලික) සමාගම



## ඩිජිටල්කරණය සඳහා පරිවර්තනය

# සංවර්ධනය සඳහා අපගේ මග

ලංකා විදුලි සමාගම එහි බෙදාහැරීම් සේවාවන්හි ඉල්ලුම සැපයුම
යන අංශ දෙක පිළිබඳ කාර්යසාධනයෙහිලා සැලකිය යුතු වර්ධනයක් හා
ව්‍යාපාරය පෙර වර්ෂයන්ට වඩා ගුණාත්මක සැපයුම සහ ඒකාකාරී මිනුම් හා
එහි ආරම්භයේ සිට කිසිඳු ඉකුත් වර්ෂයක නොවූ වීරු ලෙස
ඉහළ ගනුදෙනුකරු තෘප්තිමත්භාවය ළඟා කර ගත් බව සාඩම්බරව ප්‍රකාශ කෙරේ.



# අපගේ දැක්ම

නව්‍ය පරිසර හිතකාමී ව්‍යාපාරය තුළින්
ජන ජීවිතය එළිය කරමින් සතුට දැනවීම

# අපගේ දැක්ම

ඵලදායීත්වය වර්ධනයට තුඩුදෙන පරිසර විද්‍යාත්මක තිරසාර වටපිටාවක් තුළ බෙදුම් සේවා නව්‍යකරණය කරමින් හා වැඩිදියුණු කරමින් නිරන්තර කුතුහලය නිසා ලබාදෙන නව්‍ය සේවා මඟින් අපගේ පාරිභෝගිකයින් විශ්මිත කිරීම හා හැකියාවන් සහිත තෘප්තිමත් කාර්ය මණ්ඩලයක් මඟින් ලාභදායීත්වය ඇති කිරීම.

# අපගේ මෙහෙවර

අඛණ්ඩ නව්‍යකරණය මඟින් වඩාත් යහපත් බලශක්ති විසඳුම් සමාජයට අත්කර දීම.





# පටුන


| | |
|---|---|
| ආයතනික තොරතුරු | 06 |
| සාමාන්‍යාධිකාරීවරයාගේ පණිවුඩය | 07 |
| ඩිජිටල්කරණයට පරිවර්තනය වීම | 08 |
| ඩිජිටල්කරණ ක්‍රියාවලිය | 10 |
| අධ්‍යක්ෂවරුන්ගේ වාර්තාව | 11 |
| ඉංජිනේරු අංශය | 18 |
| ජාල ඩිජිටල්කරණය | 21 |
| මෙහෙයුම් අංශය | 22 |
| මානව සම්පත් හා පරිපාලනය | 25 |
| මූල්‍ය සමාලෝචනය | 28 |
| අභ්‍යන්තර විගණන අංශය | 29 |
| පාරිභෝගික සම්බන්ධතාවය ඩිජිටල්කරණය | 30 |
| විගණකාධිපතිවරයාගේ වාර්තාව | 32 |
| ලාභ හෝ පාඩු සහ වෙනත් විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය | 36 |
| මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය | 37 |
| හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය | 38 |
| මුදල් ප්‍රවාහ ප්‍රකාශනය | 40 |
| මූල්‍ය ප්‍රකාශනවලට සටහන් | 41 |
| කාර්යසාධන අවධානයන් | 85 |
| වාර්ෂික මහසභා රැස්වීම | |
| පෙර කලාසි ආකෘතිය | |

# ආයතනික තොරතුරු

**නෛතික ආකෘතිය**

1982 අංක 17 දරන සමාගම් පනතේ හා 2007 අංක 7 දරන සමාගම් පනතේ විධිවිධාන යටතේ වගකීමෙන් සීමිත පුද්ගලික සමාගමක් ලෙස 1983 වර්ෂයේදී සංස්ථාපනය කරන ලදී.

**2018 දෙසැම්බර් 31 දිනට සමාගමේ අධ්‍යක්ෂවරුන්ගේ නාම ලේඛනය පහත දැක්වේ.**

කේ.ආර්.එච්.එල්.ගුණසේකර මයා (සභාපති) - 2018 දෙසැම්බර් 20 දින සිට ධූරයෙන් ඉවත් වන ලදී.
ඩබ්ලිව්.බී.ගනේගල මයා - 2019 ජනවාරි 01 දින සිට බලපැවැත්වෙන පරිදි ධූරයෙන් ඉවත් වන ලදී.
ඒ.කේ.සමරසිංහ මයා - 2019 ජනවාරි 15 දින සේවයෙන් විශ්‍රාම ගන්නා ලදී.
පී.අල්ගම මයා
ජේ.වී.එම්.පී.ජයසූරිය මයා - 2018 දෙසැම්බර් 29 දින සිට ධූරයෙන් ඉවත් වන ලදී.
ඩී.එස්.එම්.සිල්වා මයා - 2019 ජනවාරි 16 සිට ධූරයෙන් ඉවත් වන ලදී.

**2018 දෙසැම්බර් 31 දිනට පරිපාලිත සමාගම්වල අධ්‍යක්ෂවරුන්ගේ නාම ලේඛනය**

**සීමාසහිත අන්ටෙ ලෙකෝ මීටරින් (පුද්ගලික) සමාගම**

කේ.ආර්.එම්.එල්.ගුණසේකර මයා (සභාපති) - 2018 දෙසැම්බර් 20 සිට ධූරයෙන් ඉවත් වන ලදී.
ලිව් ජිඅන්වු මයා
ශෙන් ඩින්ග්කින් මයා
ඒ.කේ.සමරසිංහ මයා - 2019 ජනවාරි 15 දින සේවයෙන් විශ්‍රාම ගන්නා ලදී.
එච්.එන්.ගුණසේකර මයා

**සීමාසහිත ලෙකෝ ප්‍රොජෙක්ට්ස් (පුද්ගලික) සමාගම**

කේ.ආර්.එච්.එල්.ගුණසේකර මයා (සභාපති) - 2018 දෙසැම්බර් 20 දින සිට ධූරයෙන් ඉවත් වන ලදී.
ජේ.එම්.වී.පී.ජයසූරිය මයා - 2018 ඔක්තෝබර් 29 දින සිට ධූරයෙන් ඉවත් වන ලදී.
එච්.එන්.ගුණසේකර මයා - 2018 ඔක්තෝබර් 29 දින සිට ධූරයෙන් ඉවත් වන ලදී.
එස්.එල්.ජයසේකර මයා

**සමාගමේ ලේකම්වරු**

පී.ඩබ්ලිව්.කෝපරේට් සෙක්‍රටේරියල් (පුද්ගලික) සමාගම
නො.3/17, කින්සි පාර, කොළඹ 08

**ලියාපදිංචි කාර්යාලය**

411, ගාලු පාර
ඊ එච් කුරේ ගොඩනැගිල්ල
කොළඹ 03

**බැංකුකරුවන්**

ලංකා බැංකුව
කොමර්ෂල් බැංකුව පීඑල්සී
හැටන් නැෂනල් බැංකුව පීඑල්සී
නේෂන්ස් ට්‍රස්ට් බැංකුව පීඑල්සී
මහජන බැංකුව
සම්පත් බැංකුව පීඑල්සී
සෙලාන් බැංකුව පීඑල්සී
ස්ටෑන්ඩ් චාටඩ් බැංකුව
රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව
නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුව
නැෂනල් ඩිවෙලොප්මන්ට් බැංකුව පීඑල්සී
හොංකොං ඇන්ඩ් ෂැංහයි බෑන්කින් කෝපරේෂන් ලිමිටඩ් (එච්එස්බීසී)
ජාතික ඉතිරිකිරීමේ බැංකුව (එන්එස්බී)
ඩී එෆ් සීසී වර්ධන බැංකුව පීඑල්සී
සිටි බෑන්ක් එන්ඒ
පෑන් ඒෂියා බෑන්කින් කෝපරේෂන් පීඑල්සී (පීඒබීසී)
යූනියන් බෑන්ක් ඔෆ් කලම්බු පීඑල්සී

# සාමාන්‍යාධිකාරීවරයාගේ පණිවුඩය



සීමාසහිත ලංකා විදුලි (පෞද්ගලික) සමාගම විසින් 2018 වර්ෂයේදී ද සාර්ථක කාර්යසාධනයක් අත්කර ගැනීමට හැකිවීම පිළිබඳව සතුටට පත්වෙයි.

පසුගිය වසරට වඩා සියයට 3.4 ක වර්ධනයක් පෙන්නුම් කරමින් රු.බිලියන 30.94 ක ආදායමක් සමාගම විසින් වාර්තා කර ඇත. සීමාසහිත වෙස්ට් කෝට්ස් පවර් (පුද්ගලික) සමාගමේ රු.බිලියන 2 ක ආයෝජනයෙන් ලැබූ ප්‍රතිලාභය 2018 වර්ෂයේ මෙම කාර්යසාධනය සඳහා ප්‍රධාන වශයෙන් දායක විය. එබැවින් රු.මිලියන 700 ක ලාභාංශ එහි කොටස් හිමියන් සඳහා ගෙවීමට හැකි විය.

විදුලි බලය බෙදාහැරීමේ ප්‍රධාන ව්‍යාපාරය ශ්‍රී ලංකා මහජන උපයෝගීතා කොමිෂන් සභාව විසින් නියාමනය කරනු ලබන අතර ඒ සඳහා ආදායම් නියාමන අයකිරීම් ක්‍රමවේදයක් යොදා ගනු ලැබේ. එබැවින් මෙහෙයුම් වියදම් පිළිබඳ සමාගම සවිඥානක වන අතර අනුමත ඇස්තමේන්තු ඇතුළත මෙහෙයුම් කෙරේ.

වර්ෂය තුළදී පාරිභෝගික සේවා නියාමනය කර වර්ධනය කර ඇති අතර පාරිභෝගික සේවා මධ්‍යස්ථාන මෙහෙයුම් පිළිබඳ වැඩිදියුණු කිරීම් සිදු කර ඇත.

වර්ධනය වෙමින් පවතින ඉල්ලුම් සඳහා සැපයීමට මෙම අවස්ථාවේදී ක්ෂණිකව අවශ්‍ය වන ප්‍රධාන ජාල වැඩිදියුණු කිරීම් යෝජනා කර ඇත. ව්‍යාපෘති වර්ෂ 30 කට පෙර ක්‍රියාත්මක කළ බැවින් ජාල කාර්යයන් සඳහා විශාල ආයෝජනයක් සිදු වී නැත. ආසන්න වශයෙන් ඇ.එ.ජ.ඩො. මිලියන 73.2 වන ව්‍යාපෘති සඳහා මූලික අනුමැතිය අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ලබා දී ඇත.

රජයේ ප්‍රතිපත්තියට අනුකූලව ස්මාර්ට් මීටර් යෙදවීමේ කාර්යය සැලසුම් කරන ලදී. 2018 වර්ෂය තුළදී යහපත් ප්‍රගතියක් පෙන්නුම් කරන ලද අපගේ පරිපාලිත සමාගම වන අන්ටෙ ලෙකෝ මීටරින් සමාගමෙහි නිෂ්පාදනය කරන ලද ස්වයංක්‍රීයව හැකියා සහිත නව මීටර් ලෙකෝ විසින් ස්ථාපනය කරනු ලැබේ. ස්වයංක්‍රීය මනු කියවීම, ස්වයංක්‍රීය ස්විච හා ස්මාර්ට් ජාලක මෙහෙයුම් ආශ්‍රිත වෙනත් ක්ෂේත්‍ර බොහෝමයක නියමු ව්‍යාපෘති සාර්ථක වී ඇත.

වර්ෂයේ ආයතනික සමාජ වගකීම් (CSR) සඳහා සමාගම රු.මිලියන 10.5 ක් වැය කර ඇත.

එච්.එන්.ගුණසේකර
සාමාන්‍යාධිකාරී

# ඩිජිටල්කරණයට පරිවර්තනය වීම



අපගේ සමාගම ආරම්භයේ සිටම සංසිද්ධිමය සේවාවක් සැපයීම සඳහා සමාගමක් ලෙස සැමවිටම ඉදිරියට වර්ධනය වෙමින් පවතින අතර ගෝලීයකරණය හා එහි ප්‍රවණතාවලට අනුගත වෙමින් කටයුතු කරනු ලබයි. අතීතයට සාපේක්ෂව තාක්ෂණය දිනෙන් දින වේගයෙන් වර්ධනය වේ. ජනයාගේ දිනපතා කාර්යයන් සඳහා ස්මාර්ට් දුරකථන අත්‍යවශ්‍ය ජීවන මෙවලමක් බවට පත්වෙමින් පවතී. අපගේ ව්‍යාපාරය මෙම ප්‍රවණතා ප්‍රග්‍රහණය කිරීම නොව අනාගත වර්ධනය සිතන සමාගමක් ලෙස එය අප ව්‍යාපාරයට අනුගත කර ගැනීම කේන්ද්‍ර කර ගනිමින් පහත වැටීම වෙනුවට මෙම තරඟකාරී ව්‍යාපාර ලෝකය ශක්තියෙන් වර්ධනය කර ගැනීමට අපට හැකි වේ.

පාරිභෝගික හැසිරීම ප්‍රකාරව මෑත කාලයේදී ඇති වූ වෙනස්වීම් හා ප්‍රවණතා පිළිබඳ අප හොඳින් හඳුනා ගෙන ඇත. ශ්‍රී ලංකාවේ මෙන්ම විශාල වශයෙන් ලෝකයේ පසුගිය වසර කිහිපය තුළ සමාජ මාධ්‍ය යොදා ගැනීම පිළිබඳ ප්‍රබෝධමත් ඉහළ යාමක් දක්නට ලැබේ. මාර්ගගත ක්‍රම හරහා මාර්ගගත සාප්පු සවාරි හා බිල් ගෙවීම් සිදු කිරීම සඳහා ජනයා පෙර කාලයට වඩා පුරුදු වෙමින් සිටී.

ජනතාව විශේෂයෙන් කරුණ පරම්පරාව සාමාන්‍යයෙන් ඕනෑම දිනයක කාල වේලාවෙන් වැඩි ප්‍රතිශතයක් අන්තර් ජාලය පරිහරණය කිරීමේ යෙදේ. සෑම දිනකම පාහේ නව ජංගම යෙදුම් හඳුන්වා දෙන අතර ඒවා බාගත කිරීම සඳහා සහ ජනයාගේ ජීවන කාර්යයන් සරල කර ගැනිම සඳහා ඒවා යොදා ගැනීමට ජනතාවට අවකාශ ලැබී ඇත. බැරපත්/ හරපත් යොදාගැනීම සඳහා ජනතාව දිරිමත් කිරීමට පෙර වසර කිහිපයට වඩා බොහෝ විට මුදල් නොමැති ගනුදෙනු අවස්ථා සඳහා ආරක්ෂක යටිතල පහසුකම් බැංකු විසින්  හඳුන්වා දී ඇත. එබැවින් උපයෝගීතා සමාගමක් ලෙස අප සඳහා මෙම ප්‍රවණතා නිර්මාණය කිරීමේ අභියෝගය හා අවස්ථා අප අවබෝධ කරගෙන ඇත.  අපගේ සමාගමේ අනාගතය සඳහා අපගේ උපාය මාර්ගික සැලසුම් සංවර්ධනය කිරීමේදී මෙම සමාජ ආර්ථික වෙනස්කම් සැලකිල්ලට ගැනීම අපට නොවැළැක්විය හැක.

ඩිජිටල්කරණය විධිමත්ව ක්‍රියාත්මක කිරීම මඟින් ප්‍රතිලාභ රාශියක් අපගේ සමාගමට අත් කර ගැනීමට හැකි වේ යැයි අප විශ්වාස කරන හෙයින් ඩිජිටල්කරණය අප අවධානය යොමු කරන වර්තමාන කේන්ද්‍රස්ථානයකි. ඒ සඳහා උපරිම ඵලදායීතා ප්‍රමාණය නිෂ්පාදනය කිරීමේ අරමුණින් ඩිජිටල්කරණය අපගේ ව්‍යාපාරයේ කුමන අංශයක් සඳහා අඩංගු විය යුතුද යන්න ප්‍රවේශම්ව අප විසින් විශ්ලේෂණය කර යුතුව ඇත. නව තාක්ෂණය සමඟ නිවැරදි කළ යුතු ව්‍යාපාර අංශයන් හෝ නිවැරදි කළ යුතු විශේෂිත ගැටලු හඳුනාගත් පසු ඒවා සඳහා ඩිජිටල්කරණ උපාය මාර්ග ඇතුළු කිරීම මඟින් අපගේ සැලසුම් සංවර්ධනය කරගනු ලැබේ.

සමාගමක ඩිජිටල්කරණය සඳහා පරිවර්තනය වීම හා එහි සාර්ථකත්වය සඳහා ඩිජිටල්කරණ උපාය මාර්ග ප්‍රවේශම්ව සැලසුම් කිරීම හා ක්‍රියාත්මක කිරීම ප්‍රධාන විසඳුම් බව අප අවබෝධ කරගෙන ඇත.

අපගේ ව්‍යාපාර ඉලක්කයන් සමඟ අනුකූල වන බවට අප විශ්වාස කරන ප්‍රධාන ඩිජිටල්කරණ සංකල්ප 3 ක් සඳහා මේ අවස්ථාවේදී අප ප්‍රමුඛත්වය ලබා දෙනු ලැබේ. එම සංකල්ප "පෙරසැරි ඩිජිටල්කරණය", "ජාල ඩිජිටල්කරණය" සහ පාරිභෝගික සම්බන්ධතා ඩිජිටල්කරණය (CRD) ලෙස සම්පිණ්ඩනය කළ හැක. අප සිතන ආකාරයට ප්‍රතිඵල සාර්ථකව ඉටු කරගැනීම තෙක් අපගේ සියලු පරිශ්‍රමයක් ඉදිරියට ගෙන යාමට උපරිම ආකාරයෙන් කටයුතු කරන අතර අපගේ ඩිජිටල්කරණ සැලසුම් ඉටුකරගැනීම පිළිබඳ කටයුතු අඛණ්ඩව සිදු කරනු ලැබේ.

ඩිජිටල්කරණ උපාය මාර්ග පසු පරිච්ඡේදයන්හි විස්තරාත්මක සාකච්ඡා කර ඇත.



**කඩදාසි නොමැති කාර්යාලය - Paperless office**
**භෞතික නියෝජනය අඩු - Less physical presence**
**ඩිජිටල් සුරක්ෂිතභාවය සහිත - Digital security**

# ඩිජිටල්කරණය ක්‍රියාවලිය

වර්තමාන කාලයේ ව්‍යාපාරවල අනාගතය ඩිජිටල් තාක්ෂණය පදනම් කරගත් පරිසරයක් කරා යොමුවන බව අපි තේරුම් ගනිමු. එම ප්‍රවණතාවය පුරෝකථනය කර ඉක්මනින් ප්‍රාග්ධනිත කර ගැනීම අපගේ සියලු පාර්ශවකරුවන්ට ප්‍රතිලාභී විය හැකි තරඟකාරී මායිමක් ලබා දිය හැක. මෙම පරිවර්තනය වීම යථාර්තයක් බවට පත් කිරීම සඳහා උපයෝගීතා සමාගමක් ලෙස අපට ලබා ගත හැකි ප්‍රායෝගික පියවරයන් කිහිපයක් තිබේ. ඒවා කුමක්ද යන්න දැනගැනීම ඉතා වැදගත් වන අතර ඒවා අපගේ ව්‍යාපාරය සඳහා සිදු කිරීමට හැකි කුමන ආකාරයේ බලපෑමක් ද යන්න බැලීමට හැකි වනු ඇත.

අප දැනට ව්‍යවසාය සම්පත් සැලසුම් කිරීම (ERP) පද්ධතිය මානව සම්පත් තොරතුරු පද්ධතිය (HIRS), පොදු ලෙජරය, බලශක්ති කළමනාකරණ පද්ධතිය (EMS) සංවර්ධිත බෙදාහැරීම් කළමනාකරණ පද්ධතිය (ADMS) වාහන කළමනාකරණ පද්ධතිය, කළමනාකරණ තොරතුරු පද්ධතිය (MIS) ආදී වෙනම ක්‍රියාත්මක කරන එක් එක් කුටි ලෙස යොදාගනු ලැබේ. පද්ධතීන් අන්තර්ජාල ගත කිරීම (Internet of Things - IoT) වැනි අනාගතයට ඔබින සංවර්ධනයන් උපයෝජනය කරමින් මධ්‍යගත දත්ත පදනමක් මගින් මෙම සියලු පද්ධති සමමුහුර්තකරණය කිරීමෙන් ඒකාබද්ධ කිරීම සඳහා ක්‍රියාවලි ඩිජිටල්කරණය මගින් අප අදහස් කරනු ලැබේ. කාර්යක්‍ෂම ආකාරයෙන් එකිනෙක සමග ඒකාබද්ධ වූ දැවැන්ත තොරතුරු ප්‍රධාන කළමනාකරණය කිරීම සඳහා මෙය අපට ඉඩ ලබා දෙයි.

කඩදාසි රහිත වැඩ සංස්කෘතියක් නිර්මාණය කිරීම ආරම්භ කිරීම, කඩදාසි ද්‍රව්‍ය පිරිවැය අවම කිරීමට පමණක් නොව කාර්යාලයේ කඩදාසි ඉවත් කිරීම හෝ විශාල වශයෙන් අඩු කිරීම සහ කඩදාසි පදනම් කරගත් තොරතුරු ඩිජිටල් යෙදුම් සහ උපාංග බවට පරිවර්තනය කිරීම මඟින් එදිනෙදා ක්‍රියාවලීන්හි කාර්යක්ෂමතාව ඉහළ නැංවීමටද අපි සැලසුම් කරමු.

කඩදාසි රහිත කාර්යාලයක් බවට පරිවර්තනය කිරීමේදී අප දකින විශාලතම ධනාත්මක කරුණුවලින් එකක් වන්නේ යෙදුම් කාලය අඩු කිරීමයි.  තත්පර කිහිපයකින් නිවැරදි තොරතුරු සොයා ගැනීමට සහ ප්‍රවේශ වීමට එය ජනයාට ඉඩ දෙයි. එය ජනයා තුළද වැඩ ආශ්‍රිත ආතති මට්ටම අඩු කිරීමට හේතු වේ. ඊට අමතරව, කඩදාසි රහිත වැඩ සංස්කෘතියක් වැඩ අවකාශයේ භෞතික කැළඹීම් අවම කරයි. එහි ප්‍රතිඵලයක් වශයෙන් සෑම දෙනාටම දෘශ්‍ය හා මානසිකව ආකර්ශනීය සේවා පරිසරයක් ඇති වන අතර එය අවසානයේ වඩා හොඳ ඵලදායීතාවයකට මඟ පාදයි.

අභ්‍යන්තර ඩිජිටල්කරණය යටතේ අප සලකා බැලිය යුතු තවත් වැදගත් පියවරක් වන්නේ අපගේ සමාගම තුළ විශිෂ්ට මානව සම්පත් තොරතුරු පද්ධතියක් (HRIS) පිහිටුවීමයි. සාම්ප්‍රදායික මානව සම්පත් තොරතුරු ආශ්‍රිත භාවිතයන් අකාර්යක්ෂම වන ක්ෂේත්‍ර කෙරෙහි මානව සම්පත් තොරතුරු පද්ධති (HRIS) විශාල හා ධනාත්මක බලපෑමක් ඇති කරන බව අපි හඳුනා ගනිමු. සැකසුම් කාලය අවම කිරීම මෙන්ම ස්වයංක්‍රීයකරණය සහ තොරතුරු ඒකාබද්ධ කිරීම තුළින් නිරවද්‍යතාවය වැඩි කිරීම මඟින් අපගේ ආයතනවල කාලය මෙන්ම මුදල් ද ඉතිරි කර ගත හැකිය.

අභ්‍යන්තර ඩිජිටල්කරණයේ සහාය ඇතිව අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් සම්බන්ධයෙන් අපගේ සමාගමට ලේඛන මුද්‍රණය හා සංස්කරණ ක්‍රියාවලියෙහි දියුණුවක් ලබාගත හැක. රැස්වීමක් පවත්වන සෑම අවස්ථාවකම රැස්වීම් වාර්තාවල භෞතික පිටපත් මුද්‍රණය කරනවා වෙනුවට ඩිජිටල් උපාංග මත රැස්වීම් වාර්තා සැපයීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය සඳහා විශේෂයෙන් නිර්මාණය කර ඇති නව යෙදුමක් (app) අපට හඳුන්වා දිය හැක. මෙය අපගේ සමාගමේ ලේඛන නිෂ්පාදනය හා සංස්කරණ ක්‍රියාවලියට සම්බන්ධ අනවශ්‍ය වියදම් සහ කාල පරිභෝජනය සඳහා විසඳුමක් බවට පත්විය හැක. එමඟින් අපගේ අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයන්ට ඕනෑම වේලාවක අදාළ තොරතුරු වෙත ඉක්මන් ප්‍රවේශයක් ලබාදෙන අතර අපගේ සමාගම සඳහා අප උත්සාහ කරන කඩදාසි රහිත කාර්යාල සංස්කෘතියට අනුපූරක වන ලේඛන නැවත නැවත මුද්‍රණය කිරීමේ පිරිවැය ඉවත් කෙරේ.

# සමාගමේ කටයුතු පිළිබඳ අධ්‍යක්ෂ මණ්ඩලයේ වාර්ෂික වාර්තාව

ලංකා විදුලි (පෞද්ගලික) සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සමාගමේ හා එහි පරිපාලිතයන්හි විගණිත මූල්‍ය ප්‍රකාශන සමඟ වාර්ෂික වාර්තාව ඉදිරිපත් කරනු ලැබේ.

මෙහි දක්වා ඇති තොරතුරු මඟින් 2007 අංක 07 දරන සමාගම් පනතට අනුකූලව අවශ්‍ය වැදගත් තොරතුරු සපයන අතර නිර්දේශිත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවල මඟ පෙන්වීම් වලටද අනුකූල වේ.

**සමාගම පිළිබඳව**

**සමාගම හා පරිපාලිතයන්හි මූලික කර්තව්‍යයන්**

පාරිභෝගිකයන් සඳහා අවශ්‍ය විදුලි බලය සැපයීම නොවෙනස්ව අඛණ්ඩව සිදු කිරීම මෙම වර්ෂය තුළද අපගේ මූලික ව්‍යාපාරික කාර්යය විය. ලංකා විදුලි බල මණ්ඩලයට අයත් හා එමඟින් කළමනාකරණය කරන ජාතික පද්ධතියෙන් විදුලිබලය තොග වශයෙන් සමාගම විසින් මිලදී ගනු ලබන අතර සමාගම විසින් පවත්වාගෙන යනු ලබන නවීන බෙදාහැරීම් පද්ධතියක් මඟින් සමාගම විසින් පාරිභෝගිකයන්ට විදුලි බලය බෙදා හරිනු ලැබේ.

පරිපාලිත සමාගම් හා එහි ප්‍රධාන කාර්යයන් පහත පරිදි වේ.

**සීමාසහිත ලෙකෝ ප්‍රොජෙක්ට්ස් (පුද්ගලික) සමාගම**

රට තුළ විදුලි බලය බෙදාහැරීමට අවශ්‍ය යටිතල පහසුකම් සැපයීම සඳහා වන මෙම සමාගමේ මෙහෙයුම් දැනට අවම මට්ටමක පවතී.

**සීමාසහිත අන්ටෙ ලෙකෝ මීටරින් (පුද්ගලික) සමාගම**

ශ්‍රී ලංකාවේ සහ අපනයන වෙළඳපොලෙහි ඉලෙක්ට්‍රොනික මීටර් අවශ්‍යතාවයන් සඳහා බලශක්ති මීටර් නිෂ්පාදන පහසුකම පවත්වා ගෙන යනු ලැබේ.

**දැක්ම හා දිගුකාලීන ඉලක්ක**

සමූහයේ දැක්ම, මෙහෙවර හා වටිනාකම මෙම වාර්ෂික වාර්තාවේ පිටු අංක 02 හා 03 හි දක්වා ඇත.

**කොටස් හිමියන්ගේ තොරතුරු හා වැදගත් කොටස් අයිතිය**

2018 දෙසැම්බර් 31 දිනට සී/ස ලංකා විදුලි (පෞද්ගලික) සමාගමේ කොටස් හිමියන්ගේ තත්ත්වය පහත පරිදි වේ.

| කොටස් හිමියා | කොටස් හිමිකම % |
|---|---|
| ලංකා විදුලිබල මණ්ඩලය | 54.80% |
| මහා භාණ්ඩාගාරය | 43.60% |
| නාගරික සංවර්ධන අධිකාරිය | 0.80% |
| පළාත් පාලන ආයතන | 0.80% |

**කොටස් හිමියන් කෙරෙහි සාධාරණත්වය හා යුක්තිසහගත බව**

අධ්‍යක්ෂ මණ්ඩලය සියලු කොටස් හිමියන් කෙරෙහි සාධාරණත්වය හා යුක්තිසහගත බව තහවුරු කෙරේ.

**අධ්‍යක්ෂ මණ්ඩලයේ සංයුතිය**

අධ්‍යක්ෂ මණ්ඩලය හා කොටස් හිමිකම් වෙනස්වීම

2018 දෙසැම්බර් 31 දිනට සමාගමේ අධ්‍යක්ෂ ධූර දරන අධ්‍යක්ෂවරුන්ගේ නාම ලේඛනය පහත දැක්වේ.

| | |
|---|---|
| කේ.ආර්.එච්.එල්.ගුණසේකර මයා (සභාපති) | - 2018 දෙසැම්බර් 20 දින සිට බලපැවැත්වෙන පරිදි ඉවත් විය |
| ඩබ්ලිව්.බී.ගනේගල මයා | - 2019 ජනවාරි 01 දින සිට ඉවත්විය. |
| ඒ.කේ.සමරසිංහ මයා | - 2019 ජනවාරි 15 සිට විශ්‍රාම ගන්නා ලදී. |
| පී.අල්ගම මයා | |
| ජේ.වී.එම්.පී.ජයසූරිය මයා | - 2018 දෙසැම්බර් 29 සිට බලපැවැත්වෙන පරිදි ඉවත් විය. |
| ඩී.එස්.එම්.සිල්වා මයා | - 2019 ජනවාරි 16 සිට බලපැවැත්වෙන පරිදි ඉවත් විය. |

**වර්තමාන අධ්‍යක්ෂ මණ්ඩලය පහත සඳහන් අධ්‍යක්ෂවරුන්ගෙන් සමන්විත වේ.**

| | |
|---|---|
| එස්.ටී.නානායක්කාර මයා (සභාපති) | - 2019 ජනවාරි 30 දින සිට බලපැවැත්වෙන පරිදි පත්කරන ලදී. |
| රඛිත ජයවර්ධන මයා | - 2019 ජනවාරි 30 දින සිට බලපැවැත්වෙන පරිදි පත්කරන ලදී. |
| එස්.ඩී.ඩබ්ලිව්.ගුණවර්ධන මයා | - 2019 ජනවාරි 30 දින සිට බලපැවැත්වෙන පරිදි පත්කරන ලදී. |
| පී.අල්ගම මයා | |
| එම්.ජේ.විජේකෝන් මයා | - 2019 ජනවාරි 01 දින සිට බලපැවැත්වෙන පරිදි පත්කරන ලදී. |
| වී.එස්.දික්වැල්ල මයා | - 2019 පෙබරවාරි 21 දින සිට බලපැවැත්වෙන පරිදි පත්කරන ලදී. |

**2018 දෙසැම්බර් 31 දිනට පරිපාලිත සමාගම්වල අධ්‍යක්ෂවරුන්ගේ නාම ලේඛනය**

**සීමාසහිත අන්ටෙ ලෙකෝ මීටරින් (පුද්ගලික) සමාගම**

2018 දෙසැම්බර් 31 දිනට ධූරය දරන සමාගමේ අධ්‍යක්ෂවරුන්ගේ නාම ලේඛනය පහත දැක්වේ.

| | |
|---|---|
| කේ.ආර්.එච්.එල්.ගුණසේකර මයා (සභාපති) | - 2018 දෙසැම්බර් 20 සිට බලපැවැත්වෙන පරිදි ධූරයෙන් ඉවත් විය. |
| ලිව් ජිඅන්වූ මයා | |
| ශෙන් ඩින්ග්කින් මයා | |
| ඒ.කේ.සමරසිංහ මයා | - 2019 ජනවාරි 15 දින සිට බලපැවැත්වෙන පරිදි විශ්‍රාම ගන්නා ලදී. |
| එච්.එන්.ගුණසේකර මයා | - 2019 ඔක්තෝබර් 01 දින සිට බලපැවැත්වෙන පරිදි විශ්‍රාම ගන්නා ලදී. |

**වර්තමාන අධ්‍යක්ෂ මණ්ඩලය පහත සඳහන් අධ්‍යක්ෂවරුන්ගෙන් සමන්විත වේ.**

| | |
|---|---|
| එස්.ටී.නානායක්කාර මයා (සභාපති) | - 2019 මාර්තු 22 දින සිට බලපැවැත්වෙන පරිදි විශ්‍රාම ගන්නා ලදී. |
| ලිව් ජිඅන්වූ මයා | |
| ශෙන් ඩින්ග්කින් මයා | |
| බී.එස්.ජේ.පෙරේරා මයා | - 2019 මාර්තු 22 දින සිට බලපැවැත්වෙන පරිදි පත්කරන ලදී. |

ශෙන් ඩින්ග්කින් මයා ලියු ජිඅන්වූ මයා වෙනුවටද කටයුතු කරන ලදී.

**සීමාසහිත ලෙකෝ ප්‍රොජෙක්ට්ස් (පුද්ගලික) සමාගම**

2018 දෙසැම්බර් 31 දිනට ධූරය දරන සමාගමේ අධ්‍යක්ෂවරුන්ගේ නාම ලේඛනය පහත දැක්වේ.

| | |
|---|---|
| කේ.ආර්.එච්.එල්.ගුණසේකර මයා (සභාපති) | - 2018 දෙසැම්බර් 31 දින සිට බලපැවැත්වෙන පරිදි ධූරයෙන් ඉවත් විය. |
| ජේ.එම්.වී.පී.ජයසූරිය මයා | - 2018 දෙසැම්බර් 31 දින සිට බලපැවැත්වෙන පරිදි ධූරයෙන් ඉවත් විය. |
| එච්.එන්.ගුණසේකර මයා | - 2019 ඔක්තෝබර් 01 දින සිට බලපැවැත්වෙන පරිදි ධූරයෙන් ඉවත් විය. |
| එස්.එල්.ජයසේකර මයා | |

**වර්තමාන අධ්‍යක්ෂ මණ්ඩලය පහත සඳහන් අධ්‍යක්ෂවරුන්ගෙන් සමන්විත වේ.**

| | |
|---|---|
| එස්.ටී.නානායක්කාර මයා (සභාපති) | - 2019 මැයි 21 දින සිට බලපැවැත්වෙන පරිදි පත්කරන ලදී. |
| එස්.එල්.ජයසේකර මයා | |

**අධ්‍යක්ෂවරුන්ගේ පාරිශ්‍රමික**

අධ්‍යක්ෂවරුන්ගේ පාරිශ්‍රමික මූල්‍ය ප්‍රකාශනවල සටහන් 08 හි හෙළිදරව් කර ඇත.

**බැඳීම් ලේඛනය**

2007 අංක 07 දරන සමාගම් පනතෙහි දක්වා ඇති පරිදි සමාගම හා පරිපාලිතයන් බැඳීම් ලේඛන පවත්වා ගනු ලැබේ.

**අධ්‍යක්ෂවරුන්ගේ බැඳීම්**

සමාලෝචිත ගිණුම්කරණ කාලය පරිච්ඡේදය තුළදී සමාගම සමඟ කොන්ත්‍රාත්තුවක සෘජුව හෝ වක්‍රව බැඳී ඇති හෝ සමාගම සමඟ සම්බන්ධිත පාර්ශව ගනුදෙනුවක යෙදී ඇති අධ්‍යක්ෂවරුන් පිළිබඳව මූල්‍ය ප්‍රකාශනවල සටහන් 29.1 හි දක්වා ඇත.

**අධ්‍යක්ෂවරුන්ගේ රැස්වීම**

සමාලෝචිත වර්ෂය තුළ අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් 11 ක් පවත්වා ඇති අතර සමාගමේ අධ්‍යක්ස මණ්ඩලය විසින් එක් යෝජනාවක් පමණක් බෙදා හැරීම මගින් පිළිගන්නා ලදී.

**අධ්‍යක්ෂවරුන්ගේ කොටස් හිමිකම්**

කිසිඳු අධ්‍යක්ෂවරයෙකුට සමාගමේ/ හෝ සමූහයේ කොටස් හිමිකම් නොමැත.

**සම්බන්ධිත පාර්ශව ගනුදෙනු**

අධ්‍යක්ෂවරුන් විසින් සම්බන්ධිත පාර්ශව ගනුදෙනු හෙළිදරව් කර ඇති අතර එවැනි ගනුදෙනු මූල්‍ය ප්‍රකාශනවල සටහන් 29 හා දක්වා ඇත.

**මූල්‍ය සමාලෝචනය**

වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී අනුගමනය කරන වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති මූල්‍ය ප්‍රකාශනවල සටහන් 01 සිට සටහන් 04 දක්වා ඇත.

**මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් අධ්‍යක්ෂවරුන්ගේ වගකීම**

සමාගමේ ව්‍යාපාරය පිළිබඳ සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කිරීම සඳහා සමාගමේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඉදිරිපත් කිරීමට අධ්‍යක්ෂ මණ්ඩලය වගකිව යුතු වේ.

2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සමාගමේ මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට හා ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිතීන්ට අනුකූලව පිළියෙල කරන ලදී.

2018 දෙසැම්බර් 31 දිනට සමාගමේ හා සමූහයේ මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් මූල්‍ය වර්ෂයේ සමාගම හා සමූහය සඳහා ලාභ හෝ පාඩු සහ වෙනත් විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය මඟින් පිළිවෙලින් සමාගමේ හා සමූහයේ සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කරන බව අධ්‍යක්ෂ මණ්ඩලය විසින් තහවුරු කරයි.

**ආදායම**

සමූහයේ ආදායම රු.බිලියන 31.82 ක් විය. විවිධ පාරිභෝගික වර්ගයන්ගේ දායකත්වයෙන් හඳුනා සමූහයේ පිරිවැටුම පිළිබඳ විස්තරාත්මක විශ්ලේෂණයක් මූල්‍ය ප්‍රකාශනවල සටහන් 05 හි දක්වා ඇත. සමූහයේ සමාගම් අතර වෙළඳාම සාධාරණ වෙළඳපොල අගයට සිදුකරන ලදී.

**වියදම**

පෙර වර්ෂයට සාපේක්ෂව සමූහයේ මුළු මෙහෙයුම් හා පරිපාලන වියදම් 8% කින් එනම් රු.බිලියන 4.56 සිට රු.බිලියන 4.91 දක්වා වැඩි වී ඇත. ජාතික ඉතිරි කිරීමේ බැංකුවේ සූර්ය බල සංග්‍රාමය ණය යෝජනා ක්‍රමයේ රු.මිලියන 40.3 ණය යෝජනා ක්‍රමයේ පොලිය සඳහා උපචිත වෙන්කිරීමේ ප්‍රතිඵලයක් ලෙස පෙර වර්ෂයට සාපේක්ෂව 186% කින් මූල්‍ය පිරිවැය වැඩිවීමක් ඇත.

**ලාභය**

පෙර වර්ෂයේ සමූහයේ දළ ලාභ ආන්තිකය සියයට 15.8 ක් වූ අතර එය මෙම වර්ෂයේ සියයට 15.5 දක්වා අඩු වී ඇත.

එයට ප්‍රධාන හේතුව වී ඇත්තේ සී/ස අන්ටෙ ලෙකෝ මීටරින් (පුද්ගලික) සමාගම විසින් දරන ලද දළ පාඩුවයි. කෙසේ වුවත්, ශුද්ධ ලාභ ආන්තිකය සියයට 6 සිට සියයට 9 දක්වා වැඩි වී ඇත. එම වැඩි වීම කෙරෙහි ප්‍රධාන දායකත්වය වන්නේ සීමාසහිත වෙස්ට් කෝස්ට් පවර් (පුද්ගලික) සමාගමේ ආයෝජනවලින් ලද ලාභාංශ ආදායමයි.

**ආයතනික සමාජ වගකීම් ව්‍යාපෘති (CSR)**

සමාගම විසින් සමාලෝචිත වර්ෂය තුළදී ආයතනික සමාජ වගකීම් (CSR) ව්‍යාපෘති සඳහා පහත සඳහන් දායකයන් සිදු කරන ලදී.

| | | |
|---|---|---|
| i) පාසල් හා විශ්වවිද්‍යාල | = | 3,842,715 |
| ii) වෛද්‍ය අනුග්‍රහයක්තවයන් හා ප්‍රදර්ශන අනුග්‍රහකත්වයන | = | 904,963 |
| iii) වෙනත් විවිධ | = | 5,837,322 |
| එකතුව | = | 10,585,000 |

**බදු**

අදාළ දේශීය ආදායම් පනතේ විධිවිධාන වලට අනුකූලව බදු කාර්යය සඳහා ගලපන ලද පරිදි වර්ෂය සඳහා ගිණුම්කරණ ලාභය මත පදනම්ව බදු සඳහා ප්‍රතිපාදන සලසා ඇත. එම වෙන්කිරීම් ඇස්තමේන්තු කිරීමේදී 2018 මාර්තු 31 දක්වා 2006 අංක 10 දරන දේශීය ආදායම් පනත හා එයට අදාළ සංශෝධන සමූහය විසින් අදාළ කරගන්නා ලද අතර 2018 අප්‍රේල් 01 සහ එයට පසු කාලපරිච්ඡේදය සඳහා 2017 අංක 24 දරන දේශීය ආදායම් පනත හා එහි සංශෝධන අදාළ කරගෙන ඇත. මූල්‍ය වාර්තාකරණ කාර්යය සඳහා වාර්තාකරණ දිනයට වත්කම් හා වගකීම් පිළිබඳ බදු පදනම් හා ඒවායේ ධාරණ අගයන් අතර තාවකාලික වෙනස්කම් පිළිබඳව වගකීම් ක්‍රමය යොදා ගනිමින් විලම්භිත බදු සඳහා ප්‍රතිපාදනය කර ඇත.

**ලාභාංශ**

වර්ෂය තුළ මුළු ලාභාංශ ගෙවීම රු.මිලියන 700 කි.

**කොටසකට ඉපැයුම**

නිකුත් කළ සාමාන්‍ය කොටස් සංඛ්‍යාවේ බර තැබූ සාමාන්‍ය මඟින් සමාගමේ සාමාන්‍ය කොටස් හිමියන් සඳහා වර්ෂයට අදාළ ශුද්ධ ලාභය බෙදීම මඟින් කොටසකට මූලික ඉපැයුම ගණනය කරනු ලැබේ. මූල්‍ය ප්‍රකාශනවල සටහන් 10 ට යොමු වේ.

**ප්‍රකාශිත ප්‍රාග්ධනය**

මූල්‍ය ප්‍රකාශනවල සටහන් 21 ට යොමු වේ.

**සංචිත**

සංචිත හා මුළු හිමිකම් පිළිබඳ සාරාංශය පහත පරිදි වේ.

| රු.000 | ප්‍රකාශිත ප්‍රාග්ධනය | ආදායම් සංචිත | ප්‍රත්‍යාගණන අතිරික්තය | සාධාරණ අගය සංචිත | රඳවාගත් ඉපැයුම් | සුළු කොටස් හිමියන්ගේ අයිතීන් | මුළු හිමිකම් |
|---|---|---|---|---|---|---|---|
| සමූහය | 1,145,067 | 340,642 | 1,854,817 | 8,487,351 | 20,176,529 | 136,097 | 32,140,503 |
| සමාගම | 1,145,067 | 340,642 | 1,784,965 | 8,487,351 | 19,998,103 | - | 31,756,127 |

**ණය**

සමාගම හෝ සමූහයට අදාළව දිගුකාලීන ණය නොමැත.

**දේපල, පිරියත හා උපකරණ**

සමූහයේ පෙර වර්ෂයේ රු.බිලියන 12.391 වූ දේපල, පිරියත හා උපකරණ එකතුව 2018 දෙසැම්බර් 31 දිනට රු.බිලියන 13.168 ක් විය. සමාගමේ පසුගිය වර්ෂයේ රු.බිලියන 12.143 ක දේපල, පිරියත හා උපකරණ වල වටිනාකම මෙම වර්ෂයේදී රු.බිලියන 12.875 කි.

**ජංගම වත්කම්**

පෙර වර්ෂයේ රු.බිලියන 16.404 ක් වූ සමූහයේ මුළු ජංගම වත්කම් 2018 වර්ෂය අවසානයට රු.බිලියන 20.825 ක් විය. පෙර මූල්‍ය වර්ෂයේ රු.බිලියන 16.006 වූ සමාගමේ මුළු ජංගම වත්කම්වලට සාපේක්ෂව මෙම වර්ෂයේ මුළු ජංගම වත්කම් වල වටිනාකම රු.බිලියන 20.394 ක් විය. ජංගම වත්කම්වල වැඩිවීම කෙරෙහි හේතු වූයේ කෙටි කාලීන තැන්පතුවල ආයෝජන කිරීමයි.

**ව්‍යාවස්ථාපිත ගෙවීම්**

අධ්‍යක්ෂ මණ්ඩලයේ දැනීමට අනුව රජය හා සේවක මණ්ඩලය වෙනුවෙන් කරන සියලු ව්‍යවස්ථාපිත ගෙවීම් නිසි පරිදි සිදු කර ඇති බව හා ඒ වෙනුවෙන් අදාළ වෙන්කිරීම් නිසි පරිදි සිදු කර ඇති බවට සෑහීමකට පත් වී ඇත.

**ශේෂපත්‍ර දිනට පසු සිදුවීම**

වාර්තා කරන දිනයට ගැලපීම් සඳහා අවශ්‍ය වන හෝ මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කළ යුතු වන සැලකිය යුතු අසම්භාව්‍ය බැරකම් නොමැත.

**වෙනත් නීති හා රෙගුලාසි වලට අනුකූල වීම**

ශ්‍රී ලංකාවේ අදාළ වන නීති හා රෙගුලාසිවලට පටහැනි වන කිසිඳු කාර්යයක් සඳහා සමූහය යෙදී නොමැති බවට අධ්‍යක්ෂ මණ්ඩලය ඔවුන්ගේ උපරිම දැනීමේ හා විශ්වාසය පරිදි තහවුරු කරයි.

**තීරණය සඳහා ඇති නෛතික කරුණු**

අධ්‍යක්ෂ මණ්ඩලයේ දැනීම අනුව සමාගමට එරෙහිව තීරණය සඳහා පවතින අධ්‍යක්ෂවරුන්ගේ නීතිමය කරුණුවලින් මූල්‍ය ප්‍රකාශනවලට බලපෑමක් නොවේ. අසම්භාව්‍ය බැරකම් හා ප්‍රාග්ධන බැඳීම් සම්බන්ධයෙන් වූ බැඳීම් මූල්‍ය ප්‍රකාශනවල සටහන් 27 හා 28 හි හෙළිදරව් කර ඇත.

**අඛණ්ඩ පැවැත්ම**

මූල්‍ය ප්‍රකාශන අඛණ්ඩ පැවැත්මතා පදනම මත පිළියෙල කරන ලදී.

**අවදානම් කළමනාකරණය**

අධ්‍යක්ෂවරුන් ඔවුන්ගේ ආයතනික අරමුණු ඉටුකර ගැනීම තහවුරු කරගැනීම සඳහා සමාගමේ හා සමූහයේ අවදානම් කළමනාකරණය අඛණ්ඩව සමාලෝචනය කෙරේ. මූල්‍ය ප්‍රකාශනවල සටහන් අංක 31 මඟින් මෙම කරුණු තවදුරටත් දක්වා ඇත.

**විගණකවරු**

සමාගමේ මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය ලාභ හෝ පාඩු ප්‍රකාශනය සහ අනෙකුත් විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවල සාරාංශයන් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සටහන්වලින් සමන්විත 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන, 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර විගණකාධිපතිවරයාගේ විධානය යටතේ විගණනය කරන ලදී.

මෙම විගණනය කරගෙන යාමේදී වරලත් ගණකාධිකාරී ආයතනයක් වන කේපීඑම්ජී ආයතනය විසින් විගණකාධිපතිවරයාට සහාය වන ලදී.

**සීමාසහිත අන්ටෙ ලෙකෝ මීටරින් (පුද්ගලික) සමාගම**

සීමාසහිත අන්ටෙ ලෙකෝ මීටරින් (පුද්ගලික) සමාගමේ විගණනය විගණකාධිපතිවරයා විසින් සිදුකරන ලද අතර වරලත් ගණකාධිකාරී ආයතනයක් වන අමරසේකර සහ සමාගම ඒ සඳහා සහාය වන ලදි. සමාලෝචිත වර්ෂය තුළ සමාගමේ හා සමූහයේ බදු අනුකූලතා සේවා අමරසේකර සහ සමාගම විසින් සපයන ලදී.

**සීමාසහිත ලෙකෝ ප්‍රොජෙක්ට්ස් (පුද්ගලික) සමාගම**

කේපීඑම්ජී වරලත් ගණකාධිකාරී සමාගම, සීමාසහිත ලෙකෝ ප්‍රොජෙක්ට්ස් (පුද්ගලික) සමාගමේ විගණක ලෙස ක්‍රියා කරයි.

විගණකවරුන් ලෙස සටයුතු කිරීම හා ඉහත සඳහන් බදු අනුකූලතා පිළිබඳ උපදේශකවරුන් ලෙස කටයුතු කිරීම හැර සමාගමේ හෝ එහි සමූහ සමාගම්වල කිසිදු සම්බන්ධතාවයක් විගණකවරුන්ට නොමැත.

| සමාගමේ නම | විගණකගේ/ බදු උපදේශකගේ නම | ගෙවීම් වර්ගය | මුදල (රු) |
|---|---|---|---|
| සීමාසහිත ලංකා විදුලි (පෞද්ගලික) සමාගම | විගණකාධිපති | විගණන ගාස්තු | රු. 405,000/- (NBT හා VAT බදු හැර) |
| | කේ.පී.එම්.ජී.වරලත් ගණකාධිකාරීවරු සහාය වන ලදී. | | රු. 2,700,000/- (NBT හා VAT බදු හැර) |
| සීමාසහිත අන්ටෙ ලෙකෝ මීටරින් (පුද්ගලික) සමාගම | විගණකාධිපති | විගණන ගාස්තු | රු. 47,250/- (NBT හා VAT බදු හැර) |
| | එම්.එන්.අමරසේකර සහ සමාගම වරලත් ගණකාධිකාරීවරු සහාය වන ලදී. | | රු. 315,000/- (NBT හා VAT බදු හැර) |
| සීමාසහිත ලෙකෝ ප්‍රොජෙක්ට්ස් (පුද්ගලික) සමාගම | කේ.පී.එම්.ජී.වරලත් ගණකාධිකාරීවරු | විගණන ගාස්තු | රු. 120,000/- (NBT හා VAT බදු හැර) |

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 19 වන සංශෝධනයේ 154 ව්‍යවස්ථාවට අනුකූලව එළඹෙන මූල්‍ය වර්ෂය සඳහා විගණක වශයෙන් විගණකාධිපතිවරයා පත්කරනු ලැබේ.

**පාරිසරික ආරක්ෂාව**

පරිසරයට හානි වන කිසිඳු කටයුත්තක සමාගම නිරත වනු නොලැබේ.

**වෘත්තීය ප්‍රතිපත්ති**

සමූහයේ වෘත්තීය ප්‍රතිපත්ති පුළුල් දැනුමක් ඇති පුද්ගලයින් බඳවා ගැනීම් මත පදනම් වන අතර ඔවුන්ගේ කුසලතා හැකියාවන් වැඩි දියුණු කරගැනීම සඳහා අවස්ථාවන් සලසා දෙනු ලැබේ. තවද ස්ත්‍රී පුරුෂ බව, ජාතිය හෝ ආගම නොසලකා සැමවිටම සමාන වෘත්තීය අවස්ථාවන් සමූහය විසින් ලබා දෙයි. එසේම සේවකයන්ගේ සෞඛ්‍යය හා ආරක්ෂාවට සැමවිටම ප්‍රමුඛත්වය ලබා දෙනු ලැබේ. වර්ෂය අවසානයට සමාගම හා එහි පරිපාලිතයන් විසින් සේවයේ යොදවන ලද පුද්ගලයින් සංඛ්‍යාව 1572 ක් විය.

**වාර්ෂික මහා සභා රැස්වීම**

චර්යාගත කර්තව්‍ය සිදු කිරීමේ අරමුණ සඳහා 35 වන වාර්ෂික මහ සභා රැස්වීම සමාගමේ ලියාපදිංචි කාර්යාලය වන කොළඹ 03, ගාලු පාර, තෙවන මහල ටී.එච්.කුරේ ගොඩනැගිල්ල නො.411 හිදී 2019 නොවැම්බර් 8 සිකුරාදා දින පස්වරු 3.30 ට පවත්වනු ලැබේ.

අධ්‍යක්ෂ මණ්ඩලය වෙනුවෙන් වාර්ෂික වාර්තාව සභාපති හා අධ්‍යක්ෂවරයකු විසින් අත්සන් තබනු ලැබේ.

**සභාපති**

**අධ්‍යක්ෂ**

**සීමාසහිත පී.ඩබ්ලිව්.කෝපරේට් සෙක්‍රටේරියල් (පුද්ගලික) සමාගම**
ලේකම්වරු
2019 ඔක්තෝබර් 31
කොළඹ

# ඉංජිනේරු අංශය

ලංකා විදුලි (පෞද්ගලික) සමාගමේ ඉංජිනේරු අංශය තවත් එක් සාර්ථක වර්ෂයක් 2018 වර්ෂයේදී සනිටුහන් කරයි. සමාගමේ ජාලය හා පද්ධති නවීකරණය සිදුකරන්නේ සමාගමේ ඉංජිනේරු අංශය විසිනි. විශ්වාසිදායී හා ශක්තිමත් ජාලයන් තුළින් පාරිභෝගිකයන්ට උසස් වටිනාකම් සහිත සේවාවන් සැපයීම අපගේ මෙහෙවරයි. ඉංජිනේරු අංශය මෙම ඉලක්කය සපුරාලීමට අක්ෂයන් තුනක් යටතේ එහි කාර්යයන් ක්‍රියාත්මක කරයි. මෙම සංවර්ධනය පිළිබඳ එම අක්ෂයන් තුන වන්නේ ජාලය සැලසුම් කිරීම හා සංවර්ධනය, සමාගමේ තොරතුරු තාක්ෂණ පද්ධති සංවර්ධනය හා කාර්ය මණ්ඩලයේ තාක්ෂණික හැකියාවන් සංවර්ධනයයි. මෙම මෙහෙවරට අනුකූලව පද්ධති සැලසුම් හා සංවර්ධනය, තොරතුරු තාක්ෂණ (IT) ව්‍යාපෘති පරීක්ෂණ දෙපාර්තමේන්තුව හා තාක්ෂණික පුහුණු දෙපාර්තමේන්තු ඉංජිනේරු අංශය යටතේ මෙහෙයවනු ලැබේ.

ලංවිස හී ජාල සැපයුම හා සංවර්ධන අක්ෂයෙහි හැරවුම් ලක්ෂයන් 2018 වර්ෂයේදී අපට දක්නට ලැබුණි. ඉංජිනේරු අංශය විසින් කැළණිය, කෝට්ටේ, නුගේගොඩ, මොරටුව හා කලුතර ප්‍රදේශයන්හි භූගත කේබල් කිරීම හා ස්විච් ස්වයංක්‍රීයකරණය කටයුතු සිදු වූ නමුත් ලංකා විදුලි සමාගමේ ජාලය නවීකරණය කිරීමේ කටයුතු පසුගිය වර්ෂ 30 තුළදී ආයෝජන හිඟකම නිසා නිසි පරිදි සිදු නොවීය. ධාරිතා වර්ධනය හා විශ්වාසදායී බව වැඩි සඳහා 1996 න් පසුව මෙය විශාල ආයෝජනයක් වනු ඇත. ඉහත සඳහන් ප්‍රදේශවල ධාරිතා ඉක්ම වූ තත්ත්වයක් හා බොහෝ කල් ගත වූ ලංවිස ජාලයක් පවතී. මෙම ප්‍රධාන ධාරිතා හා විශ්වාසදායීතාව වැඩි කිරීමේ සැලැස්ම ආසියානු සංවර්ධන බැංකුවේ ව්‍යාපෘති සැකසීම හා තාක්ෂණික සහාය උපදේශකවරු සමග පද්ධති සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් සංවර්ධනය කිරීමට කටයුතු කරන ලදී. පෑලියගොඩ 90 MVA ග්‍රිඩ් උපපොළ, පෑලියගොඩ, කැළණිය, කිරිබත්ගොඩ, වත්තල, කෝට්ටේ, නාවල, නුගේගොඩ, මහරගම හා බොරලැස්ගමුව ප්‍රදේශවල භූගත ජාලයට පරිවර්තනය කිරීම සහ කොටිකාවත්ත, කොලොන්නාව, නුගේගොඩ, මොරටුව සහ කලුතර ප්‍රදේශවල උඩුරැහැන් ජාලය ස්වයංක්‍රීයකරණය මගින් විශාල ධාරිතා නික්ෂේපණයක් මෙම ව්‍යාපෘතියෙන් අපේක්ෂා කරයි. මෙම ව්‍යාපෘතිය 2020 වර්ෂයේ දෙවන කාර්තුවේදී ක්‍රියාත්මක කිරීම සඳහා සැලසුම් කර ඇති අතර 2025 වර්ෂයේ නිම කිරීමට නියමිතය.

ජාල ස්වයංක්‍රීයකරණය හා තොරතුරු තාක්ෂණ පද්ධති සංවර්ධනය සම්බන්ධිත වන දෙවන සංවර්ධන අක්ෂයේදී එක්සත් රාජධානියේ GSM සංගමයේ ආධාර අරමුදල් යටතේ ඩයලොග් ඇක්සියාටා පීඑල්සී සහ මොරටුව විශ්ව විද්‍යාලයේ ඉලෙක්ට්‍රොනික් හා විදුලි සංදේශ දෙපාර්තමේන්තුව සමග සහයෝගීත්වයෙන් කෝට්ටේ ප්‍රදේශයේ ස්මාර්ට් මීටර් නියමු ව්‍යාපෘතිය මෙහෙයවීම පද්ධති සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් සම්පාදනය කර ඇත. මෙම ව්‍යාපෘතියේදී ස්මාර්ට් මීටර් සඳහා උසස් GPRS මොඩමයක් (Modem) හා ස්මාර්ට් මීටර් සඳහා IOT පදනම් සේවා (Server) විසඳුමක් නිර්මාණය කිරීමට අපට හැකි විය. මෙය ලංවිස සේවා සමූහයේ (Server farm) වත්මන් ප්‍රගතියක් අත්කර දෙන (State of art) සහ IOT වේදිකාවේ ක්‍රියාත්මක කරන ලදී. කෝට්ටේ ප්‍රදේශයේ 3200 ක බලශක්ති මීටර් සංවර්ධනය කරන ලද මෝඩමය සමග ස්මාර්ට් මීටර් සඳහා පරිවර්තනය කර අඛණ්ඩ සන්නිවේදනය සමග සේවාවට සම්බන්ධ කරන ලදී. මීටර් 800 ක් සමග ඒකාකාරී සන්නිවේදනයක් ස්ථාපිත කරමින් වර්ෂය අවසාන වන විට ව්‍යාපෘතිය මෙහෙය වීම සාර්ථක වෙමින් පවතී. මීට අමතරව, 2020 වර්ෂයේ ක්‍රියාත්මක කිරීමට සැලසුම් කරන ලද බෙදාහැරීම් සේවා රෙගුලාසි සඳහා නියම කර ඇති බෙදාහැරීම් වොල්ටියතා නියාමන අවශ්‍යතා සඳහා නිර්මාණය කරන ලද පෝෂක හා වෝල්ටියතා අධීක්ෂණ උපකරණ (Feeder and voltage monitoring Device) හි සංවර්ධනයද මෙම ව්‍යාපෘතියෙන් දැක්වුනි.

අපගේ තොරතුරු තාක්ෂණ සංවර්ධන කණ්ඩායමේ හැකියාවන් යටතේ බෙදාහැරීම් පාලන මධ්‍යස්ථානයේ ක්‍රියාත්මක කළ යුතු සංවර්ධිත බෙදා හැරීම් කළමනාකරණ පද්ධතියේ සංවර්ධන කාර්යයන් 2017 වර්ෂයේදී ආරම්භ කර එහි පළමු පරිවර්තනය 2018 වර්ෂයේදී නිම කර ඇත. දත්ත අත්කර ගැනීම හා සංක්‍රමණ කාර්යයන් 2019 වර්ෂයේ ක්‍රියාත්මක කිරීම අපේක්ෂා කරමින් 2018 වර්ෂයේදී ආරම්භ කර ඇත.

ඉහත සංවර්ධිත බෙදාහැරීම් කළමනාකරන පද්ධතියට එකතු කිරීමක් ලෙස ලංකා විදුලි සමාගමේ ඉංජිනේරුවන් විසින් ස්විච් පාලනය ස්ථාපිත කිරීම හා ක්ෂේත්‍රයේ යෙදුම් (Devices) පාලනය කිරීම සඳහා මෘදුකාංගයක් සංවර්ධනය කරන ලදී. එබැවින් බෙදා හැරීම් පාලන මධ්‍යස්ථානයට දුරස්ථ පාලකය මගින් ඉතා වැදගත් ස්විචයන් මෙහෙයුම (Mission critical switches) ක්‍රියාකරවීමට හැකි වන අතර බෙදාහැරීම් පාලන මධ්‍යස්ථානයේ ජාල පරමිතීන් නියාමනය කිරීමටද හැකි වේ.

ලේසර් පරාසය (Laser Ranging) සහ දෘශ්‍ය ප්‍රවාහ ස්ථායීකරණය (Optical flow stabilisarion) සමග සම්පාදනය කරන ලද ස්වයංක්‍රීය ගුවන් වේදිකාව (Automonous aerial platform) හි සංවර්ධනය සම්පූර්ණ කර ඇති අතර ක්‍රියාත්මක කිරීම සඳහා සූදානම්ව ඇත. මෙම සංවර්ධනය සම්ප්‍රේෂණය හා බෙදා හැරීම් රැහැන් පරීක්ෂා කිරීම සඳහා ආසියානු සංවර්ධන බැංකුවේ ප්‍රධාන ව්‍යාපෘතියක් ලෙස ලංකා විදුලි බල මණ්ඩලය හා ලංකා විදුලි සමාගම ඒකාබද්ධව යෝජනා කරන ලද ඩ්‍රෝන කළමනාකරණ ඒකකයට සම්බන්ධ වේ.

මෙම නවීන සංවර්ධනයන්ට අමතරව, පද්ධති සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් වර්ෂය ආරම්භයේදී, එහි සාමාන්‍ය සැලසුම් කාර්යයන්, ප්‍රසම්පාදනයන් හා පද්ධති සංවර්ධන කාර්යයන්, පිරිවැය අත්පොත හා වෙනත් සැලසුම් ලියකියවිලි නිකුත් කිරීම සිදු කරන ලද අතර, ප්‍රසම්පාදනයන් 234ක් විශාල ටෙන්ඩර් 34ක් හා එකතුව රු. බිලියන 1.77ක් පිරිවැය වූ ඉතිරි කුඩා ප්‍රසම්පාදනයන් ක්‍රියාත්මක කිරීම මගින් පද්ධති සංවර්ධන දෙපාර්තමේන්තුව එහි සැලසුම් ක්‍රියාවලියේ විශාල සංවර්ධනයන් පෙන්නුම් කරන ලද අතර විශ්වාසය පදනම් කරගත් සැලසුම් කිරීම ආරම්භ කරන ලදී. 2019 වර්ෂයේ නිකුත් කිරීමට නියමිත ඊළඟ ජාල සැලැස්ම මෙයින් අපේක්ෂා කෙරේ. "ArcGiS" පද්ධතිය ප්‍රසම්පාදනය කර ක්‍රියාත්මක කිරීම සමග AutoCADLISP මත ක්‍රියාත්මක වන අපගේ යල්වීනු පදනම සඳහා ලංකා විදුලි සමාගමේ සැලසුම් දෙපාර්තමේන්තුව විසින් පරිවර්තනය කරන ලදී. මේ සමග අපගේ වත්කම් මෙන්ම අපගේ සියලු පාරිභෝගිකයන් ඇතුළත් ලංකා විදුලි සමාගමේ GIS දත්ත පදනම අනුරූපණය කර ඇති අතර එය ජාතික වැදගත්කමක් ඇති දත්ත පදනමක් බවට පත්වී ඇත.

ලංකා විදුලි සමාගමේ තොරතුරු තාක්ෂණ දෙපාර්තමේන්තුව විසින් තොරතුරු තාක්ෂණ ආරක්ෂණ විගණනය සහ නව මුරපද පාලන පටිපාටියක් නිකුත් කිරීම, නවීන සේවා දායක කාමරයන් ක්‍රියාත්මක කිරීම හා වගවීම වැඩි දියුණු කිරීම සඳහා තොරතුරු තාක්ෂණ කාර්යය මණ්ඩලයේ සවිස්තරාත්මක ක්‍රියාකාරී වෙන්කිරීම ඇතුළත් ලංකා විදුලි සමාගමේ තොරතුරු තාක්ෂණ පද්ධතිය සම්බන්ධිත ශක්තිමත් කිරීම ක්‍රියාත්මක කිරීම මගින් විශාල සංවර්ධණයක් සිදු කිරීම දක්නට ලැබුනි.

පද්ධති සංවර්ධන දෙපාර්තමේන්තුව යටතේ ක්‍රියාත්මක වන සමාග මේ තාක්ෂණික පුහුණු කිරීම් මධ්‍යස්ථානය විසින් පුහුණු වැඩ සටහන් 94ක් පවත්වා තිබෙන අතර මුළු කාර්යය මණ්ඩලයෙන් 85%ක් වන පුද්ගලයින් 1307ක් අවම වශයෙන් මධ්‍යස්ථානයේ එක් වරක් වත් පුහුණුවක් ලබා ඇත.

2018 වර්ෂයේ අභ්‍යන්තර පුහුණු සැලැස්මේ 100%ක කාර්ය සාධනයක් ඔවුන් විසින් අත්කර ගෙන ඇත.

මහජන උපයෝගිතා කොමිෂන් සභාවට අවශ්‍ය සියලු දත්ත නියාමන දෙපාර්තමේන්තුව විසින් නියමිත වේලාවට ඉදිරිපත් කර ඇති අතර නියාමන තොරතුරු පද්ධතිය (RIS) ප්‍රසිද්ධ කිරීම අඛණ්ඩව සිදු කර ඇත. මෙම දෙපාර්තමේන්තුව විසින් විස්තරාත්මක පාරිභෝගික සමීක්ෂණයක් 2019 වර්ෂයේ සිදු කිරීමට නියමිතය.

ව්‍යාපෘති දෙපාර්තමේන්තුව විසින් බෙදාහැරීම් ජාල ප්‍රතිසංස්කරණයේදී ඉහත ඔවුන්ගේ සැලසුම් ක්‍රියාත්මක කර රු. මිලියන 508 කට වැඩි ව්‍යාපෘති ආරම්භ කර ඇත. එසේම ලංකා විදුලි සමාගමේ සියලු ශාඛා 7 සඳහා රු. බිලියන 274 කට වැඩි සංවර්ධන ව්‍යාපෘති බෙදා හරින ලදී.



ජාලය ස්වයංක්‍රීයකරණය (Network Automation)
ස්මාර්ට් මීටර් ක්‍රමය (Smart Metering System)
භූගෝලීය තොරතුරු පද්ධති වේදිකාව (GIS Platform)

# ජාල ඩිජිටල්කරණය

අපගේ සමාගම තුළ ජාල ඩිජිටල්කරණය භාවිතා කිරීමේ අපගේ අරමුණ වන්නේ අපගේ ව්‍යාපාර ක්‍රියාවලීන් ක්‍රියාත්මක කිරීමේදී කාර්යක්ෂමතාවය, නිරවද්‍යතාවය හා පැහැදිලි බව වර්ධනය කිරීමයි. ජාල ඩිජිටල්කරණය උපරිම ප්‍රතිලාභ ලබා ගැනීම සඳහා අපට ගත හැකි ප්‍රවේශයන් කිහිපයක් ඇති අතර අප විශ්වාස කරන එක් ක්‍රමයක් වන්නේ "ජාලය ස්වයංක්‍රීයකරණය" කිරීමයි.

අප ජාල ස්වයංක්‍රීයකරණය සංස්ථාගත කිරීමෙන් අප සපුරා ගැනීමට උත්සාහ කරන්නේ අපගේ සියලු පද්ධති අතර සම්බන්ධීකරණය ඇති කිරීම වන අතර එවිට අපගේ පාරිභෝගිකයන්ට උපයෝගීතා සමාගමක් ලෙස අපගෙන් අඛණ්ඩව ඉහළ අගයක් සහිත සේවාවක් ලබාගත හැකිය. අපගේ වෙබ් අඩවිය මඟින් එම පොරොන්දුව ලබාදිය හැකි අතර එහිදී 24/7 ප්‍රවේශයක් අපගේ පාරිභෝගිකයන්ට ඒ සඳහා ඇති වන අතරම ඔවුන්ගේ ඉල්ලීම්, විමසීම් හා පැමිණිලි පහසුවෙන් ඉදිරිපත් කළ හැකිය. එවිට එම දත්ත අපගේ සමාගමේ එයට සහාය දැක්විය යුතු නම්කරනලද කණ්ඩායමකට මාරු කිරීමට කටයුතු කරන අතර එමඟින් හැකි තරම් ඉක්මණින් එම ගැටලු පාරිභෝගිකයන් වෙනුවෙන් නිරාකරණය කරනු ලැබේ.

සෑම නිවසකම සාම්ප්‍රදායික මීටර් කියවීමේ ක්‍රමය වෙනස් කළ යුතු බව අපි දනිමු. එහි අවාසි කිහිපයක් ඇති බැවින් නව තාක්ෂණය ඇතුළත් කළ හොත් එය නිවැරදි කළ හැකිය. සුපුරුදු ක්‍රමය නම් අපගේ සේවා සපයන්නන් විසින් එක් නිවසක සිට තවත් නිවසකට ගොස් විදුලි මීටරය කියවීමෙන් පසුව පාරිභෝගිකයා විසින් පරිභෝජනය කරන ලද ඒකක ගණනය කිරීම මත පදනම්ව මාසික විදුලි බිල්පත අතින් භාරදීම වන අතර එය කාලය ගත වන කාර්යයකි. ඉන්පසු වෙනත් අවස්ථාවක ගොස් විදුලි බිල්පත ගෙවීමට පාරිභෝගිකයාට සිදු වේ. මෙම සියලු ගැටලුවලට ප්‍රධානතම විසඳුම වන්නේ ස්මාර්ට් මීටරින් ක්‍රමය බව අපි විශ්වාස කරමු. ස්මාර්ට් මීටරින් ක්‍රමයෙන්, කොතරම් ප්‍රමාණයක් විදුලිබලය භාවිතා කරන්නේද සහ එය කෙතරම් පිරිවැයක් දරන්නේද යනාදී තොරතුරුවලට ප්‍රවේශ වීම සඳහා අපගේ පාරිභෝගිකයන්ට ඉඩ සැලසේ. එබැවින් ඒ පිළිබඳ සොයා බැලීමට මාසය අවසන් වන තුරු සිටිය යුතු නොවේ.

අපගේ පාරිභෝගිකයන් සඳහා සංවර්ධනය කිරීමට ජංගම යෙදවුමක් (app) සහිත ස්මාර්ට් මීටරින් ක්‍රමය ඇති කිරීමට අපි සැලසුම් කරන්නෙමු. ඕනෑම පාරිභෝගිකයෙකුට ස්මාර්ට් මීටරය සරලව කියවිය හැකි අතර ප්‍රමාදයකින් තොරව යෙදවුම මඟින් බිල ගෙවීම සිදු කළ හැකිය. මීට ඉහතදී නොවූ පරිදි මෙම පහසු හා නිරවද්‍ය ක්‍රමය මඟින් නියාමනය හා පාරිභෝගික බිල් කිරීම් ක්‍රම මෙන්ම පාරිභෝගිකයාට ඔවුන්ගේ පරිභෝජනය පිළිබඳ නිරවුල්ව සන්නිවේදනය කිරීම, අපගේ පාරිභෝගිකයන්ගේ පළපුරුද්ද වැඩිදියුණු කිරීම ඇති කරයි. තවද, මෙම ස්මාර්ට් මීටර සහ ජංගම යෙදුම් අපගේ සමාගම සඳහා සහාය වේ. එනම් අයහපත් කාලගුණ තත්ත්වයක් තුළදී හෝ රට තුළ හදිසි තත්ත්වයක් පවතින විටදී එක් එක් ගෘහස්ත ඒකක වලට ගොස් කාර්යයන් සිදු කිරීම දුෂ්කර වන අවස්ථාවකදී හදිසි තත්ත්වයකදී ලංවිස සේවකයන් මඟින් මීටර් කියවීම නැවැත්වීමේ අවශ්‍යතාවයන් එහිදී ඉවත් කෙරේ.

පුළුල් පරාසයක ප්‍රවේශයක් පිළිබඳ තොරතුරු ලබාගැනීම වැදගත් බව අපට පෙනී යයි. එය ඉටු කරගැනීමට භූගෝලීය තොරතුරු පද්ධති (GIS) අපට ඉඩ සලසයි. එය දෘඩාංග මෙන්ම මෘදුකාංගද ඒකාබද්ධ කරන අතර දත්ත පරිගණකගත කිරීමට, කළමනාකරණය කිරීම හා විශ්ලේෂණය කිරීම මඟින් විවිධ වර්ගයේ භූගෝලීය ආශ්‍රිත තොරතුරු නිරූපනය කරයි. බොහෝ ප්‍රයෝජනවත් ආකාරවලින් දත්ත බැලීමට, විමසීමට හා තේරුම් ගැනීමට අවස්ථාවන් නිර්මාණය කිරීමට එය උපකාරී වේ.

විදුලිය බිඳ වැටීම සම්බන්ධයෙන් අපට පාරිභෝගික පැමිණිල්ලක් ලැබුණු විට නිශ්චිත ස්ථානයට වේගයෙන් ළඟා වී කාර්යක්ෂම සේවාවක් සැපයීම වැදගත් වේ. එහෙත් පාරිභෝගිකයාගේ නිශ්චිත ස්ථානය සොයාගැනීම සඳහා නිරන්තරයෙන් සම්බන්ධ වීමට වඩා තත්පර කිහිපයකින් සේවය අවශ්‍ය ස්ථානයට අපගේ තාක්ෂණික කාර්ය මණ්ඩල සාමාජිකයන්ට භූගෝලීය තොරතුරු පද්ධතිය (GIS) හරහා තොරතුරු හා මෙහෙයවීම් දැනගත හැකිය. අපගේ සමාගමේ යොදා ගන්නා ජාල ඩිජිටල්කරණ ක්‍රම කාර්යක්ෂමතාවය වැඩිදියුණු කිරීම සඳහා ඉලක්ක කරන අතර දිනය අවසානයේ අපට දිය හැකි වඩාත් තෘප්තිමත් සේවය ලබා දෙයි. එසේම, මෙම ජාල ඩිජිටල්කරණ සැලසුම් සඳහා හා ඒවා ක්‍රියාත්මක කිරීම කෙරෙහි අපගේ හැකියාව පිළිබඳව විශාල විශ්වාසයක් අප තුළ ඇත.

# මෙහෙයුම් අංශය

මෙහෙයුම් අංශය සඳහා 2018 වර්ෂය තවත් එක් සාර්ථක වර්ෂයක් වූ අතර එහි 559778 ක් වූ පාරිභෝගික පදනම සඳහා ගිවොපැ 1572 ක සේවා සපයන ලදී. ගාල්ල, කළුතර, මොරටුව, කැළණිය, කෝට්ටේ, නුගේගොඩ හා මීගමුව යන ප්‍රධාන නගරවල පුළුල්ව විහිදුණු පාරිභෝගිකයන් සඳහා ගුණාත්මක සැපයුමක් සහිත සේවාවක් සලසන අතරම ශ්‍රී ලංකා මහජන උපයෝගීතා කොමිෂන් සභාව විසින් ක්‍රියාත්මක කරන ලද විදුලිබල රෙගුලාසි පිළිබඳ ප්‍රමිතීන් පවත්වාගෙන යනු ලැබේ. 2017 වර්ෂයට සාපේක්ෂව 2018 වර්ෂයේදී ලංකා විදුලි (පෞද්ගලික) සමාගමේ පාරිභෝගික සංඛ්‍යාව 11588 ක වැඩිවීමක් විය.

ලංකා විදුලි (පෞද්ගලික) සමාගමේ පාරිභෝගික පදනම් ගාස්තු වර්ගය අනුව පහත දක්වා ඇත.

| ගාස්තු වර්ගය | පාරිභෝගික සංඛ්‍යාව | වාර්ෂික පරිභෝජන (කිවොපැ) |
|---|---|---|
| ගෘහස්ත | 466068 | 631,586,701 |
| පොදු කටයුතු හා රජය | 84912 | 554,534,071 |
| කර්මාන්ත හා හෝටල් | 3119 | 352,822,584 |
| ආගමික හා පුණ්‍යස්ථාන | 2584 | 10,927,632 |
| වීථි ආලෝකකරණය | 3095 | 22,438,418 |
| එකතුව | 559778 | 1,572,309,406 |



ගෘහස්ත
පොදු කටයුතු හා රජය
ආගමික හා පුණ්‍යස්ථාන
ආගමික හා පුණ්‍යස්ථාන
වීථි ආලෝකකරණය

2018 වර්ෂය අවසන් වන විට ලංවිස විසින් එහි රු. 550,000 කට අධික පාරිභෝගිකයින්ට සේවා සැපයීම සඳහා, 998 km දිගැති ඉහළ වෝල්ටීයතාවයෙන් යුතු සහ 4363 km දිගැති පහළ වෝල්ටීයතාවයෙන් යුතු සම්ප්‍රේෂණ රැහැන් සමඟ 2427 ක් වූ උපපොළවල් සහ 1862 ක්වූ ස්විච්ච මධ්‍යස්ථාන නඩත්තු කරනු ලැබේ.

***බෙදා හැරීම් හානි අවම කිරීම***

මෙහෙයුම් කාර්ය මණ්ඩලය විසින් වත්කම් නඩත්තු කිරීමේදී මෙම බෙදා හැරීමේ හානි පාඩු මට්ටම 3.64% ක ප්‍රතිශතයක පවත්වා ගැනීමට හැකි වී ඇත. මේ අතර 2017 වර්ෂයේ ගාල්ල ශාඛාවේ වාර්තා කරන ලද අසාමාන්‍ය බෙදා හැරීම් හානි වටිනාකම් සොයා ගැනීමට හා නිවැරදි කිරීමට හැකි විය. කැළණිය ශාඛාවේ අඩු හානි විශ්ලේෂණය පිළිබඳ කාර්යයන් කෙරෙමින් පවතී. අසාමාන්‍ය පාඩු බෙදා හැරීම් හානි පාරිභෝගික සේවා මධ්‍යස්ථාන (CSC) හඳුනාගැනීම සඳහා එම මධ්‍යස්ථානවල පාඩු ගණන් බැලීමට ක්‍රියාමාර්ග ගෙන ඇත.

මෙම වසරේ ශාඛාවල කාර්යසාධන ඇගයීම මඟින් හා සෑම මසකම වැඩි කාර්යසාධනයක් ඇති ශාඛාව තෝරා ගැනීම මඟින් එක් එක් ශාඛාවේ හැකියාවන් දිරිගන්වන ලදී. අනවසර සම්බන්ධතා අයකිරීම මඟින් විමර්ශන ඒකකය විසින් 2018 වර්ෂයේදී අයකිරීමේ ලෙස රු.මිලියන 6.2 ක මුදලක් අයකර ගන්නා ලදී. ශාඛා විසින් පනවන ලද උපදෙස් ලේඛනයක් මඟින් මෙම අල්ලා ගැනීම් සිදු කරන ලදී. ලංවිස පද්ධති වත්කම් සඳහා තුන්වන පාර්ශවයක් විසින් කරන ලද හානි සඳහා අයකිරීම් වෙනුවෙන් රු.මිලියන 13.1 ක මුදලක් අයකර ගැනීමට මෙහෙයුම් කාර්යය මණ්ඩලය අති විශාල පරිශ්‍රමයක් දරන ලදී.

***සේවා වැඩිදියුණු කිරීම්***

ශ්‍රී ලංකා ටෙලිකොම් "AVAYA" නව ඇමතුම් මධ්‍යස්ථාන "1910" සමඟ ලංවිස විසින් ඍජු දුරකථන මාර්ග සේවාවක් ක්‍රියාත්මක කිරීම ආරම්භ කරන ලදී. තවදුරටත් ඍජු දුරකථන මධ්‍යස්ථානය ක්‍රියාත්මක කිරීමට පියවර ගෙන ඇති අතර 2019 වර්ෂයේදී සම්පූර්ණ කිරීමට සැලසුම් කර ඇත.

පානදුර පාරිභෝගික සේවා මධ්‍යස්ථාන (CSC) ගොඩනැගිල්ල ලෙස ලංවිස පාරිභෝගිකයන් සඳහා සේවා වැඩි දියුණු කිරීමට 2018 ඔක්තෝබර් මාසයේදී පානදුර, තල්පුරුව, ගාලු පාර අංක 731/1 දරන ස්ථානයේ නව දෙමහල් ගොඩනැගිල්ලක් මොරටුව ශාඛාව විසින් විවෘත කරන ලදී. පාරිභෝගිකයන් සඳහා උසස් සේවාවක් ලබාදීමට නව CSC පරිශ්‍රය නව පහසුකම් හා උපකරණ වලින් පහසුකම් සලසා ඇත.

***පද්ධති විශ්වාසදායීත්වය***

වැඩිදියුණු කරන ලද පද්ධති විශ්වාසදායීත්වය පවත්වා ගැනීමේ ඉලක්කය සහිතව බෙදාහැරීම් පාලන මධ්‍යස්ථානය මඟින් බෙදාහැරීම් ජාල මෙහෙයුම් පාලනය කර නියාමනය කරනු ලැබේ. සියලු පාරිභෝගික සේවා මධ්‍යස්ථාන පාලක මධ්‍යස්ථානය සමඟ සම්බන්ධීකරණය කෙරෙන අතර පාරිභෝගිකයන් සඳහා අඛණ්ඩ සේවාවක් තහවුරු කරගැනීම සඳහා අදාළ බලධාරීන් විසින් කටයුතු කෙරේ. අඛණ්ඩ සැපයුමක් සැපයීම සඳහා පරිශ්‍රමයන් ගෙන ඇති අතර ජාල මෙහෙයුම් හා නඩත්තු වැඩ සඳහා වැදගත් වන කාර්ය මණ්ඩල දේපල හා මහජනතාවගේ ආරක්ෂාව තහවුරු කරගැනීම සඳහා ඉහළ ප්‍රමුඛත්වයන් ලබා දී ඇත. මධ්‍යගත ක්‍රියාමාර්ගය මඟින් සාර්ථකත්වය තහවුරු කරමින් මෙහෙයුම් අංශයට කටයුතු කළ හැකි වී ඇති අතර වර්ෂය පුරා මෙහෙයුම්වලින් අවාසනාවන්ත අනතුරු කිසිවක් වාර්තා වී නැත.

2018 වර්ෂය සඳහා විශ්වාසදායකත්වය පිළිබඳ දර්ශක පෙර වර්ෂයේ වාර්තා සමඟ සසඳා පහත දැක්වේ.

| වර්ගය - සාමාන්‍ය ක්‍රියාවිරහිත වීම් දර්ශකය (SAIDI) පැය/ එක් පාරිභෝගිකයෙකුට | 2014 | 2015 | 2016 | 2017 | 2018 |
|---|---|---|---|---|---|
| LV ඇණ හිටීම් | 0.28 | 0.31 | 0.47 | 0.5 | 0.38 |
| 11kV ලංවිස සැලසුම්කරණ ලද | 15.86 | 13.34 | 18.56 | 21.14 | 17.5 |
| 11kV ලංවිස ඇණ හිටීම් | 5.96 | 6.98 | 15.18 | 20.15 | 21.13 |
| 11kV ලංවිම සැලසුම්කරණ ලද | 7.07 | 6.81 | 5.12 | 5.85 | 6.97 |
| 11kV ලංවිම ඇණ හිටීම් | 1.75 | 1.67 | 2.26 | 1.35 | 1.69 |
| 33kV සැලසුම්කරණ ලද | 12.33 | 8.57 | 11.2 | 10.43 | 12.52 |
| 33kV ඇණ හිටීම් | 16.14 | 12.71 | 14.37 | 10.44 | 10.19 |




### පාරිභෝගික සේවාව

පාරිභෝගික ඉල්ලීම් මත දින දහයක් ඇතුළත නව සේවා ඇස්තුමේන්තු නිකුත් කිරීම පිළිබඳ ශ්‍රී ලංකා පාරිභෝගික කොමිෂන් සභාවේ සම්මතයන් පවත්වා ගනිමින් 2018 වර්ෂය සාර්ථක වර්ෂයක් වූ අතර සපුරා ගැනීම 89% ක් විය. ගෙවීම් කිරීමෙන් පසු දින 10 ක් ඇතුළත නව සේවා සම්බන්ධතා ලබාදීම 91% ක් විය. බිල් කිරීම් දෝෂ 0.078% සමඟ 98% ක සමස්ත ප්‍රතිශතයකට දින 30+3 බිල් කාර්යක්ෂමව පවත්වාගෙන ඇත. දින 20ක් ඇතුළත ඇස්තුමේන්තු නිකුත් කිරීම පිළිබඳ ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාවේ සම්මතයන්ට අනුකූලව තොග සැපයුම් සම්බන්ධතා නායාමනය කිරීම හා ගෙවීම් කිරීමෙන් පසු දින 40ක් ඇතුළත සේවා සම්බන්ධතා ලබාදීම මෙම වර්ෂය හඳුන්වා දුන් අතර ප්‍රමාදයක් සඳහා හේතු සොයා ගැනීමට හැකි විය.

### පාරිභෝගික උපදේශන රැස්වීම්

ලංවිස මෙහෙයුම් කාර්යයන්, පරිපාටි හා රෙගුලාසි පිළිබඳ උපදේශක රැස්වීමක් කෝට්ටේ ප්‍රදේශයේ පාරිභෝගිකයන් සඳහා දෙවන වරටත් පවත්වන ලදී. රැස්වීම සඳහා සහභාගී වූ පාරිභෝගිකයන්ට විදුලිබලය බෙදාහැරීම් පද්ධතිය පිළිබඳ ඔවුන්ගේ ගැටලු හා පැමිණිලි ඉදිරිපත් කිරීමට අවස්ථාවක් ලබාදෙන ලදී. කෝට්ටේ සෝලිස් හෝටලයේ මෙම සාර්ථක රැස්වීම පවත්වන ලද අතර ලංවිස කළමනාකරණය මුණගැසීම සඳහා පාරිභෝගිකයන්ට අවස්ථාන ලබාදෙන ලදී. සමාජ දැනුවත් වීම හා මහජන සෞඛ්‍යය පිළිබඳව ප්‍රධාන කථිකයන් දෙදෙනෙකු විසින් කථනයක් කරන ලදී. සහභාගීවූවන් අතර ලොතරැයි දිනුම් ඇදීමක් සිදුකර තෝරා ගත් අය සඳහා වටිනා ත්‍යාගයක් පිරිනැමීමෙන් පසු රැස්වීම පවත්වන ලදී.





# මානව සම්පත් හා පරිපාලනය

ප්‍රධාන අරමුණ වන්නේ අපගේ සේවකයන් පිළිබඳ සැලකීමේදී සමාගමේ මානව ප්‍රාග්ධන සංවර්ධන උපාය මාර්ග එක් එක් සේවක අවශ්‍යතා හා සමාගමේ ඉලක්ක අතර අන්‍යෝන්‍ය ප්‍රතිලාභී සම්බන්ධතාවයක් ඇති කිරීමයි. එබැවින්, අදාළ පළපුරුද්ද හා ආකල්පය සහිත සුදුසු පුද්ගලයන් ආකර්ශනය කිරීම හා සුදුසු ස්ථානයේ රඳවා ගැනීම සඳහා අප ඉලක්ක කෙරේ. අපගේ සේවකයන් සඳහා වෘත්තීය උසස් වීම් හා රැකියා වර්ධනය සඳහා නිසි වටිනාකමක් හා අවස්ථාවන් ලැබෙන බවට සමාගම තහවුරු කරයි. ජනයා හා සමාගම අතර දිනන තරඟයක් ලංවිස නිර්මාණය කිරීමේ ආකාරය මෙයයි. මෙම ඉලක්කය ඉටුකර ගැනීමේදී යහපත් මානව සම්පත් පරිචයන් අනුගමනය කිරීම සඳහා සමාගම බැඳීසිටී.

නීතිගරුක හා ස්වාධීන සේවක සංගම් අයිතීන් අප විසින් හඳුනාගෙන ඇති අතර සියලු අදාළ ශ්‍රමික නීතිවලට අනුකූල වීම සඳහා සේවක සංවිධාන විසින් වැටුප් හා වරප්‍රසාද ගැන සාකච්ඡා කිරීමට බැඳී සිටී. ආයතනයේ කර්මාන්ත කම්කරු සබඳතා පවත්වා ගැනීම සඳහා සමාග මේ වෘත්තීය සංගම් සමඟ සාමූහික ගිවිසුමක් අත්සන් කිරීමට අපට හැකි විය. තවද, ආරක්ෂා සහිත හා සෞඛ්‍ය සම්පන්න වැඩ පරිසරයක් සැපයීමට අප බැඳී සිටී.

**සේවක සංයුතිය පිළිබඳ සමස්ත විග්‍රහය**

2018 දෙසැම්බර් 31 දිනට ලංකා විදුලි සමාගමේ සේවක සංඛ්‍යාව 1519 කින් සමන්විත විය. සමාලෝචිත වර්ෂයේදී 18 දෙනෙකු බඳවා ගන්නා ලදී.

නව තාක්ෂණය යටතේ විවිධාංගීකරණය වූ සමාගමක් වන මෙහි බහුතර සේවක පිරිසක් තාක්ෂණික තනතුරු වල නිරත වී සිටියි. ඉහළ සේවක රඳවා ගැනීමේ අනුපාතයක් සහ ඉතා පහළ මට්ටමේ සේවක පිරිවැටුම් (සේවයෙන් ඉවත්ව යාමේ) අනුපාතයක් එනම් 0.8%ක ප්‍රතිශතයක් 2018 වසරේ පවත්වාගෙන ඇත.

අප විශ්වාස කරන පරිදි විවිධ වයස් කාණ්ඩයන්හි පුද්ගලයන් සමාගමට සහයෝගයක් වේ. නව උපාධිධාරීන් ඔවුන්ගේ නවතම දැනුම හා ශිල්පීය ක්‍රම ලබා දෙන අතර අපගේ බෙදාහැරීම් පද්ධතියේ තිරසාරත්වය තහවුරු කිරීමට අත්‍යවශ්‍ය වන අත්දැකීම් අපගේ පරිණත කාර්ය බලකා සාමාජිකයන් විසින් ලබා දෙනු ලැබේ.




සේවකයන් ස්ත්‍රී පුරුෂ භාවය අනුව
12%
88%
ස්ත්‍රී
පුරුෂ


සේවකයන් - වයස් විශ්ලේෂණය
5%
24%
33%
38%
55 හා ඊට වැඩි
40  54 අතර
30  39 අතර
30 ට අඩු

### පුහුණු හා සංවර්ධනය

2018 වර්ෂයේදී අමෙරිකා එක්සත් ජනපදය, ඉන්දියාව හා වෙනත් රටවල් කිහිපයක් විසින් පවත්වන ලද විදේශ පුහුණු, සම්මේලන හා සම්මන්ත්‍රණ සඳහා විධායක කාර්ය මණ්ඩලයේ 29 දෙනෙකු ලංවිස විසින් නම් කරන ලදී. මීට අමතරව, දේශීය වශයෙන් සරල කුසලතා හා තවදුරටත් තාක්ෂණ පුහුණු කාර්යයන් සඳහා සේවකයන් 98 දෙනෙකු සහභාගී වී ඇත. එසේම, අපගේ පුහුණු පාසල විසින් ඔවුන්ගේ පරිශ්‍රවලම පුහුණුවන්නන්ගේ රැකියා මට්ටමට අවශ්‍ය හැකියාවන් සම්පූර්ණ කරගැනීම සඳහා හා අනාගත විභව්‍ය කාර්යභාරය සඳහා ඔවුන් සංවර්ධනය කිරීමට බොහෝ අභ්‍යන්තරික පුහුණු සැලසුම් සිදු කරන ලදී. පවත්වන ලද සමහර වැඩසටහන් පහත පරිදි වේ.

| පුහුණු වැඩසටහන | සහභාගී වූ සංඛ්‍යාව |
|---|---|
| මිචිගන් ස්ටේට් විශ්වවිද්‍යාලයේ මහජන උපයෝගීතා නියාමන පර්යේෂණ හා අධ්‍යාපන ආයතනය විසින් පවත්වන ලද IPU ග්‍රිඩ් පාසලේ පුහුණුව | 2 |
| උපයෝගීතා රෙගුලාසි හා උපායමාර්ග පිළිබඳ මහජන උපයෝගීතා පර්යේෂණ මධ්‍යස්ථානය (PURC)/ ලෝක බැංකුවේ 44 වන අන්තර්ජාතික පුහුණු වැඩසටහන | 2 |
| හාවඩ් විශ්වවිද්‍යාලයේ කලා හා විද්‍යා පීඨය විසින් පවත්වන ලද "උපාය මාර්ගික නායකත්වය" පිළිබඳ පුහුණු වැඩසටහන | 1 |
| ජාත්‍යන්තර S dn Bhd බිලේස් ඇවනියු විසින් පවත්වන ලද විදුලිබල පද්ධතියේ ස්වාධීනත්වය හා පාලනය පිළිබඳ පුහුණු වැඩසටහන | 4 |
| ඇකඩමි ඔෆ් ඇඩ්වෙන්චර් විසින් පවත්වන ලද දින 3 හා රාත්‍රි 2 ක සංවර්ධන හා නායකත්වය පුහුණු වැඩසටහන | 35 |
| සීමාසහිත දුරස්ථ ඉගෙනුම් මධ්‍යස්ථානය විසින් පවත්වන ලද කාර්යමණ්ඩල විනය කාර්ය පරිපාටිය පිළිබඳ පුහුණු වැඩසටහන | 15 |

### සේවක දිරිගැන්වීම්, පිළිගැනීම් හා සුභසාධන කටයුතු

සමාගමේ මානව සම්පත් රාමුව තුළ දිරිගැන්වීමේ ත්‍යාග සහ පිළිගැනීම් අත්‍යවශ්‍ය සංරචකයකි. එය සේවකයන් පෙළඹවීම සඳහා හේතුවන නිසාත්, උසස් ප්‍රමිතීන්ට කටයුතු සිදු කිරීමට දැඩි විශ්වාසයක් ඔවුන්ට ලබාදෙන නිසාත් වන අතර සේවක කාර්යයන් සදහා හා ඔවුන්ගේ ඉටුකර ගැනීම් සඳහා දායකත්වයට නිසි හඳුනාගැනීමක් ලබාදෙන නිසාත්ය.

### ශ්‍රමභිමානී - දිගු සේවා කාලය සඳහා ත්‍යාග

මෙය සමාගම විසින් සංවිධානය කරන ලද ප්‍රධාන මානව සම්පත් අංගයක් වන අතර දිගුකාලීන සේවා සපයන සේවකයන් සඳහා සෑම වර්ෂයකම ත්‍යාග පිරිනමයි. මෙම අංගය 2018 දෙසැම්බර් මාසයේදී සමාගමේ ජ්‍යෙෂ්ඨ කළමනාකරුවන්ගේ සහභාගීත්වයෙන් කොළඹ වෝටර්ස් ඒජ් හි පැවැත්වුණි. සමාගමේ සේවා කාලය වසර 25 ක් සම්පූර්ණ කරන ලද සේවකයන් 73 දෙනෙකු සඳහා සමාගම විසින් ත්‍යාග පිරිනමන ලදී. ඊට අමතරව, 5 වසර ශිෂ්‍යත්වය, අ.පො.ස.සා/පෙළ හා අ.පො.ස.උ/පෙළ උසස් ප්‍රතිඵල දක්වන ලද, සේවකයන්ගේ ළමයින් උදෙසාද ත්‍යාග පිරිනමන ලද අතර එම අවස්ථාවේදී මුල්‍ය ත්‍යාගයන්ද පිරිනමන ලදී.

### වාර්ෂික ක්‍රීඩා උත්සවය

සමාගමේ මානව සම්පත් දින දර්ශනය අනුව, ලංවිස සේවකයන් අතර කණ්ඩායම් හැඟීම් හා අන්‍යෝන්‍ය සම්බන්ධය සහ ඵලදායීත්වය වැඩි කිරීමට 2018 නොවැම්බර් 17 දින හික්කඩුව ශ්‍රී සුමංගල පාසල් ක්‍රීඩා පිට්ටනියේ වාර්ෂික ක්‍රීඩා උත්සවය පැවැත්වුණි. මෙම අංගය සේවකයන්ගේ පවුල්වල සාමාජිකයන් ඇතුළත්ව 3000 ක සහභාගීත්වය සහිතව සිදු කරන ලදී.

# මූල්‍ය සමාලෝචනය

**ආදායම**

වර්ෂය තුළ සමාගමේ වාර්තාගත ආදායම රු.බිලියන 30.94 ක් වූ අතර එය 2017 වර්ෂයේ රු.බිලියන 29.93 ක ආදායමට සාපේක්ෂව 3.4% ක වැඩිවීමකි. සමූහයේ මුළු ආදායම රු.බිලියන 31.827 ක් දක්වා වැඩි වී ඇති අතර එය 4% ක වැඩිවීමකි. ප්‍රධාන ආදායම ජනනය වන්නේ විදුලි බලය විකිණීමෙනි. වර්ෂය තුළදී ගිවොපැ 1,569.93 ක් විකුණන ලදී. විදුලි බලය සඳහා ඉල්ලුම වැඩිවීම හා විදුලි බලය බෙදා හැරීම් පාඩු අවම කිරීමට හැකිවීම ආදායමේ එම වැඩිවීමට හේතුවිය. ආදායම වර්ධනය සඳහා අපගේ පාර්පාලිතය වන සීමාසහිත අන්ටෙ ලෙකෝ මීටරින් (පුද්ගලික) සමාගමේ මීටර් විකුණුම් වර්ධනය වීමද හේතු විය.

**බදු පසු ලාභය**

ඉකුත් වර්ෂයේ රු.බිලියන 1.83 ක් වූ ශුද්ධ ලාභයට සාපේක්ෂව 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සමූහය රු.බිලියන 2.94 ක ශුද්ධ ලාභයක් වාර්තා කර ඇති අතර එය 61% ක වැඩිවීමක් විය. ශුද්ධ ලාභය වැඩිවීම සඳහා සීමාසහිත වෙස්ට් කෝස්ට් පවර් (පුද්ගලික) සමාගමෙන් ලැබුණු රු.මිලියන 1.165 ලාභාංශ ආදායම හේතු විය.

**කොටසකට ඉපැයුම්**

සමාලෝචිත වර්ෂයේ සමූහයේ කොටසකට ඉපැයුම රු.25.73 ක් වූ අතර එය පෙර වර්ෂයේ රු.15.94 කි. සමාගමේ කොටසකට ඉපැයුම සමාලෝචිත වර්ෂයේ රු.25.94 ක් වූ අතර එය 2017 වර්ෂයේ රු.15.45 කි.

**ලාභාංශ**

2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් මුදල් වර්ෂය සඳහා සමාගම විසින් එක් කොටසකට රු.6.11 බැගින් රු.මිලියන 700 ක ලාභාංශ ගෙවන ලදී.

**හිමිකම් මත ප්‍රතිලාභ**

සමූහයේ හිමිකම් මත ප්‍රතිලාභ සමාලෝචිත වර්ෂය සඳහා 9.5 කි. සමාගමේ හිමිකම් මත ප්‍රතිලාභ 2017 වර්ෂයේ 6.6% ට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ 9.8 ක් විය. හිමිකම් මත ප්‍රතිලාභය ගණනය කරනු ලබන්නේ කාලපරිච්ඡේදය සඳහා ලාභය, වර්ෂය ආරම්භයේ හා වර්ෂය අවසානයේ මුළු හිමිකම්වල සාමාන්‍යයෙන් බෙදීම මඟිනි.

**මුළු වත්කම්**

මුළු වත්කම් වර්ධනය සඳහා ප්‍රධාන වශයෙන් හේතු වන්නේ දේපල, පිරියත හා උපකරණ අත්කර ගැනීම හා කාලීන තැන්පතු වැඩිවීම හා තොග වැඩිවීමයි. සමූහයේ මුළු වත්කම් 2017 දෙසැම්බර් 31 දිනට සාපේක්ෂව සමූහයේ මුළු වත්කම් 8.6% කින් රු.බිලියන 44.6 දක්වා වැඩි විය.

**මුළු වගකීම්**

සමූහයේ මුළු වගකීම් වලින් 49% ක් දිගුකාලීන බැරකම්වලින් (2017 - 52%) හා 51% ක් ජංගම වගකීම්වලින් (2017 - 48%) නියෝජනය වේ. සමූහයේ දිගුකාලීන වගකීම්, විලම්භිත බදු බැරකම්, විලම්භිත බදු ආදායම හා විශ්‍රාම ප්‍රතිලාභ බැඳීම් සඳහා ප්‍රතිපාදන වලින් සමන්විත වේ. ශේෂ පත්‍ර දිනයට කිසිඳු දිගුකාලීන ණය ගැනීම් නොමැත

**මුළු හිමිකම්**

සමූහයේ හිමිකම් මුළු වත්කම්වලින් 72% ක් වන අතර 2018 දෙසැම්බර් 31 දිනට එය සුළු කොටස් හිමියන්ගේ හිමිකම් වන රු.බිලියන 0.136 ක් ඇතුළත්ව රු.බිලියන 32.14 ක් විය.

**මුදල් ප්‍රවාහය**

ඉකුත් වර්ෂයේ රු.මිලියන 1,947 ක් වූ සමූහයේ මෙහෙයුම් වලින් ගලා ආ ශුද්ධ මුදල් ප්‍රවාහය සමාලෝචිත වර්ෂයේ රු.මිලියන 684 ක් විය. පෙර වර්ෂයට සාපේක්ෂව මෙයට හේතු වූයේ ඉහළ කාරක ප්‍රාග්ධනය අවශ්‍යතාවයයි. සමූහයේ ආයෝජන ක්‍රියාකාරකම් වලින් පිටතට ගලා ගිය රු.මිලියන 2,267 ක ශුද්ධ මුදල් ප්‍රවාහයට හේතු වූයේ කාලීන තැන්පතුවල කරන ලද අතිරේක කෙටි කාලීන ආයෝජනයන්ය. මූල්‍ය ක්‍රියාකාරකම්වලින් පිටතට ගලා ගිය රු.මිලියන 701 ක ශුද්ධ මුදල් ප්‍රවාහයට හේතු වූයේ රු.මිලියන 700 ක ලාභාංශ ගෙවීමයි.

**ආයතනික පාලනය**

ආයතනික පාලනයේ ස්ථාපිත යහපත් පරිචයන් සමඟ අනුකූල වීම සමූහය/ සමාගම තහවුරු කරන අතර එහි ව්‍යාපාරය පවත්වා ගැනීමේදී උසස්ම සදාචාරමය ප්‍රමිතීන් තහවුරු කරයි. මණ්ඩලය විසින් කොටස්කරුවන්, සැපයුම්කරුවන් හා අනෙකුත් පාර්ශවකරුවන් සමඟ ගනුදෙනු කිරීමේදී කාර්ය මණ්ඩලයේ හැසිරීම නියම කරන ලද රජය විසින් නිකුත් කරන ලද චක්‍රලේඛයන්ට අනුකූල වන රීති හා රෙගුලාසි අනුගමනය කරයි.

# අභ්‍යන්තර විගණන අංශය

**කළමනාකරණයේ සමාලෝචනය**

සමාගමට වෙනම අභ්‍යන්තර විගණන අංශයක් ඇති අතර වාර්තාකරණය එහි සභාපතිට වේ. අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයන් හා අමාත්‍යාංශ නිරීක්ෂකයෙකුගෙන් සමන්විත සමාගමේ විගණන හා කළමනාකරණ කමිටුව අභ්‍යන්තර විගණන අංශයට සමගාමීව කටයුතු කරයි. නව නීති යටතේ පුළුල් පරාසයක සහභාගීවන්නන් සඳහා විනිවිදභාවය සහ යහපාලනය පවත්වා ගැනීම සඳහා නිසි වෘත්තීය රැකවරණය, පැහැදිලිව සහ උසස් ගුණාත්මක කාර්යයන් සිදු කිරීම සහිතව වෘත්තීය සුදුසුකම් ලත් කාර්ය මණ්ඩලයක් විසින් සමාලෝචිත වර්ෂය තුළ සියලු විගණන කාර්යයන් සිදු කරන ලදී.

කාර්යයන් ආරම්භ කිරීමට පෙර වර්ෂය ආරම්භයේදී විගණන හා කළමනාකරණ කමිටුව විසින් සියලුම ප්‍රධාන ක්‍රියාත්මක ක්ෂේත්‍ර ආවරණය වන පරිදි මූලික වැඩ සැලැස්ම අනුමත කරන ලදී.

විගණන අංශය ප්‍රධාන කාර්යාලයේ ස්ථානගතව ඇති අතර, සියලු ශාඛාවන්ට, පාරිභෝගික සේවා මධ්‍යස්ථාන හා එසේම මීටර් පරීක්ෂා කරන විද්‍යාගාර, පුහුණු මධ්‍යස්ථාන හා ගබඩාවන් (තොග) ආදිය පරීක්ෂා කරනු ලැබේ. එසේම ප්‍රධාන කාර්යාලයේ ශාඛා/ අංශ වලද විගණන කාර්යයන් සිදු කරනු ලබන අතර ප්‍රධාන කාර්යාලයේ ශාඛා/ අංශවල කාර්යයන් වටමාරු පදනමකින් සිදු කරනු ලැබේ.

සමාලෝචිත වර්ෂය තුළ විගණන අංශය විසින් විගණන හා කළමනාකරණ කමිටුව විසින් අනුමත කරන ලද මූලික සැලැස්ම ප්‍රකාරව කළමනාකරණය විසින් නිර්මාණය කරන ලද සියලු ක්‍රියාත්මක ක්ෂේත්‍ර හා පොකුරු ආවරණය වන පරිදි විගණනයන් සිදු කර ඇත. ශාඛා විගණන වාර්තා පිළිබඳව සභාපති විසින් අදාළ කාර්ය මණ්ඩලය සමඟ විස්තරාත්මකව සාකච්ඡා කරන ලද අතර, විගණන හා කළමනාකරණ කමිටුවට ඔවුන්ගේ පරීක්ෂා කිරීම සඳහා ඉදිරිපත් කිරීමට පෙර මෙහෙයුම්/ වාර්තා කිරීමේ ක්‍රියාවලීන් විධිමත් කිරීමේ අරමුණින් උපදෙස් දෙන ලදී.

**යහපාලනය**

**විගණන හා කළමනාකරණ කමිටුව**

මහා භාණ්ඩාගාර නියෝජිතයා විසින් සභාපතිත්වය දරන ලංකා විදුලි සමාගමේ විගණන හා කළමනාකරණ කමිටුව අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයන් තිදෙනෙකුගෙන් සමන්විත වේ. එහි මෙහෙයුම්වල ගුණාත්මක ප්‍රමිතීන් වැඩිදියුණු කිරීමේ අරමුණ සහිතව හා එසේම අදාළ පනත් හා රෙගුලාසිවල නව සංශෝධන යටතේ වැඩි බරක් හා අවධානයක් සමඟ පැහැදිලිකම, විනිවිදභාවය හා යහපාලනය ප්‍රවර්ධනය කරමින් රැස්වීම් පවත්වන ලදී.

සමාලෝචිත කාල පරිච්ඡේදය තුළ එලදායී රැස්වීම් 4 ක් පවත්වන ලදී.


CRD

# පාරිභෝගික සම්බන්ධතාවය ඩිජිටල්කරණය (CRD)

අපගේ ගනුදෙනුකරුවන් සමඟ යහපත් හා ඵලදායී අන්තර් ක්‍රියාකාරීත්වයක් කළමනාකරණය කිරීම සහ අපගේ පාරිභෝගික සම්බන්ධතාවය සැම විටම කලහැකි හොඳම සේවාව ලබාදීම සඳහා අපගේ උපරිම උත්සාහයන් දරන්නේ, අපගේ පාරිභෝගික සම්බන්ධතා ඩිජිටල්කරණය (CRD) මෙවලම් මඟින් අනාගතයේදී තිරසාර වන පාරිභෝගික සම්බන්ධතා වැඩි දියුණු කිරීම සඳහා අපගේ සමාගම ගොඩනඟා අවශ්‍ය කාර්යයන් ඉටුකිරීමට අපට ඉඩ ලබා දේ.

අපගේ අවසාන ඉලක්කය වන්නේ අපගේ පාරිභෝගිකයන්ට අදාළ වන වේගතවත් විශ්වාසදායක සහ පහසු පද්ධති නිර්මාණය කිරීමයි. එවිට ඔවුන්ට සාමාන්‍ය යෙන් ආයෝජන කිරීමට ඇති කාලය සහ උත්සාහය ඉතිරි කරගත හැකිය. අපේ සමාගමේ දෘෂ්ටි කෝණයෙන් බලන කළ, වඩා හොඳ පාරිභෝගික සම්බන්ධතා පද්ධති අපගේ කාර්ය මණ්ඩල සාමාජිකයන්ට දෛනික ව්‍යාපාරය හැසිරවීමට ඇති පීඩාව හා ව්‍යාකූලතාවය ලිහිල් කරයි. වඩා හොඳ පාරිභෝගික පහසුවක් ගොඩනැගීම සඳහා "විකුණුම් බල ස්වයංක්‍රීයකරණය" ශක්‍ය විසඳුමක් ලෙස අපි සැබවින්ම සලකන්නෙමු. තම නිවසේ හෝ කලාපයේ ගැටලුවක් හෝ විදුලි බිඳ වැටීමක් වාර්තා කිරීමට පාරිභෝගිකයෙකු අපේ පාරිභෝගික සේවාව සම්බන්ධ කරගැනීමට අදහස් කරන්නේ නම් පාරිභෝගික සේවා කාර්ය මණ්ඩල සාමාජිකයකු සමඟ සම්බන්ධ වීමට බලා සිටිනවාට වඩා ස්වයංක්‍රීය පද්ධතිය හරහා පාරිභෝගිකයාට ඔවුන්ගේ ගැටලුව වාර්තා කිරීමට ඉඩ ලබා දෙන්නෙමු. එම පද්ධතිය මඟින් පාරිභෝගිකයන්ගේ කාලය ඉතිරි කර ගත හැකි වන අතර අපගේ තාක්ෂණික කාර්ය මණ්ඩලයට ගැටලුව නියමිත වේලාවට නිරාකරණය කරගැනීමට අවශ්‍ය වන නිරවද්‍ය තොරතුරු ලබා දිය හැක.

අපගේ පාරිභෝගිකයන්ගේ අත්දැකීම් තවදුරටත් වැඩිදියුණු කිරීමේ අරමුණින් අපගේ පාරිභෝගිකයන්ට බිල් ගෙවීම් ලියාපදිංචි කිරීම් හෝ වෙනත් විදුලි පරිභෝජන විමසීම් හා තොරතුරු ඔවුන්ගේ නිවාසවල සිටම සුවපහසුව ලබාදීමට ඉඩ සලසන පූර්ණ ක්‍රියාකාරී වෙබ් පහසුකම ලබාගත හැකිය. අපගේ පාරිභෝගිකයන්ට අපගේ වෙබ් අඩවියේ ඇති ඔවුන්ගේම ගිණුම්වලට පිවිසිය හැකි බවත් ඔවුන්ගේ විදුලි පරිභෝජනය සහ ගාස්තු පිළිබඳව දැනගැනීමට අවශ්‍ය සියලු විස්තර දැකගත හැකි බවත් අපි තහවුරු කරමු. කුමන හෝ කාරණයකට පාරිභෝගිකයන්ට තම නිවෙස්වලින් බැහැර යාමට නොහැකි වූ අවස්ථාවක මෙම ආකාරයේ පහසුකම් අතිශයින් ප්‍රයෝජනවත් විය හැකිය.

සෑම කෙනෙකුම කාර්යබහුල ජීවිතයක් ගත කරන බව අපි තේරුම් ගනිමු. අපගේ පාරිභෝගිකයන්ට ලංවිස පරිපූර්ණ ජංගම යෙදුමක් සමඟ සම්බන්ධ වීමට අවස්ථාව ලබා දීමෙන් ඔවුන්ගේ ජීවිත පහසු කර ගැනීමට අපි උත්සාහ කරමු. එය ඔවුන්ගේ විදුලි පරිභෝජනය පිළිබඳ තොරතුරු ඉක්මන් ප්‍රවේශයක් ලබා දෙන අංගයන්ගෙන් සමන්විත වන අතර ඔවුන්ගේ විදුලි ගෙවීම් ක්ෂණිකව සැකසීමේ අවස්ථාවද ඇත.

අපි සෑම විටම උත්සාහ කරන්නේ පාරිභෝගිකයන් වෙත ළඟා වීමට සහ ඔවුන්ගේ ජීවිතවලට වටිනාකමක් එකතු කිරීම සඳහා නව තාක්ෂණයෙන් සහ ප්‍රවණතා වලින් වාසියක් ලබා ගැනීමටයි. වර්තමානයේ සමාජ මාධ්‍ය භාවිතා කරන ජනගහනයේ ප්‍රමාණය දිනෙන් දින වේගයෙන් වර්ධනය වේ. මෑත අතීතයේදී සමාජ මාධ්‍ය අලෙවිකරණය ඉහළ යන අලෙවිකරණ මෙවලමක් වී ඇති හෙයින් අපගේ ඉලක්කය වන්නේ අපගේ පාරිභෝගිකයන් සමඟ සන්නිවේදනය කිරීම හා දැනුවත් වීම වන අතර සමාජ මාධ්‍ය දැන්වීම් හරහා අපගේ නවතම උත්සාහයන් සහ යාවත්කාලීන කිරීම් පිළිබඳව ඔවුන්ව දැනුවත් කිරීමයි.

සමාජ මාධ්‍ය අලෙවිකරණය විසින් වෙළඳ දැන්වීම් හා සන්නිවේදනයේ විභවය විවෘත කර එය නව මට්ටමකට ගෙන එනු ලැබීය. වෙනත් ඕනෑම මාධ්‍ය වේදිකාවක් හා සසඳන විට නිශ්චිත ඉලක්කගත ප්‍රේක්ෂකයින් වෙත ළඟා වීමට එය විශිෂ්ට මෙවලමක් බවට පත්ව ඇත. එබැවින්, සමාජ මාධ්‍ය භාවිතා කිරීමෙන් අප උපයෝගීතා සමාගමක් ලෙස අපගේ පාරිභෝගික තෘප්තිය ඉහළ නැංවිය හැකිය. එය අපගේ පාරිභෝගිකයන්ට විශාල වටිනාකමක් එක් කළ හැකි බැවින් එය ඔවුන් සමඟ නිරන්තරයෙන් සම්බන්ධතා පවත්වාගෙන යාමට සහ ඊළඟ පරම්පරාවේ පරිශීලක අත්දැකීමක් ලබා දීමට ඉඩ සලසයි.

# ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

| | | | | | |
|---|---|---|---|---|---|
| මගේ අංකය / எனது இல. / My No. | පීඕපී/ඊ/එල්ඊසීඕ/එෆ්එස්/2018/05 | ඔබේ අංකය / உமது இல. / Your No. | | දිනය / திகதி / Date | 2019 ජූලි 03 දින |

සභාපති
සීමාසහිත ලංකා විදුලි (පෞද්ගලික) සමාගම

**සීමාසහිත ලංකා විදුලි (පෞද්ගලික) සමාගමේ සහ එහි පරිපාලිතයන්හි 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතාවයන් පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 මතය

2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ලාභ හෝ පාඩු සහ වෙනත් විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ සීමාසහිත ලංකා විදුලි (පෞද්ගලික) සමාගමේ (සමාගම) මූල්‍ය ප්‍රකාශන එහි සමාගම හා එහි පරිපාලිතයන්හි (සමූහය) ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ. මෙම විගණනය කර ගෙන යාමේදී ප්‍රසිද්ධ වෘත්තියෙහි නියැලි වරලත් ගණකාධිකාරී සමාගමක් මට සහාය වන ලදී.

2018 දෙසැම්බර් 31 දිනට සමාගමේ හා සමූහයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා සමාගමේ හා සමූහයේ මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී ලං වි ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE
NAOSL

**1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාර්ශවයන්ගේ වගකීම**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී සමාගම අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර කළමනාකාරීත්වය සමාගම ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් පැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා සමාගමේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

සමාගමේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව සමූහයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යාම අවශ්‍ය කෙරේ.

**1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම**

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතික වීම උසස් මට්ටමේ සහතික වීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කරගන්නා බවට තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බවට අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනා ගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නා වූ අවදානම් මඟහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබාගැනීම මාගේ මතයට පදනම් වේ. වරදක් නිසා සිදුවන බලපෑමට වඩා වංචාවක් හේතුවෙන් සිදුකරන ලද ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයක් හඳුනා නොගැනීම මඟින් සිදු වන්නා වූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස සමූහයේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබාගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය සහ යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල හා සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල සාධාරණත්වය ඇගයීම.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් සමූහයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව් කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතු වේ. මාගේ නිගමනයන් විගණකගේ වාර්තාවේ දිනය දක්වා ලබාගන්නා ලද විගණන සාක්ෂි මත පදනම් වේ. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් විය හැකිය.

- හෙළිදරව් කිරීම් ඇතුළත් ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කිරීම, ව්‍යුහය සහ අන්තර්ගතය ඇගයීමට ලක්කළ අතර ඒ සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයා ගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා සහ අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරන ලදී.

**2. වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතාවයන් පිළිබඳ වාර්තාව**

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 2007 අංක 7 දරන සමාගම් පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ විධිවිධාන ඇතුළත් වේ.

- විගණනය සඳහා අවශ්‍ය සියලු තොරතුරු හා පැහැදිලි කිරීම් මා විසින් ලබාගන්නා ලද අතර මාගේ පරීක්ෂණයෙන් පෙනී යන ආකාරයට 2007 අංක 7 දරන සමාගම් පනතේ 163(1)(ඇ) වගන්තියේ හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12(අ) වගන්තියේ අවශ්‍යතාවයන් ප්‍රකාරව සමාගම විසින් නිසි ගිණුම් වාර්තා පවත්වා ගෙන ගොස් තිබුණි.

- සමාගමේ හා සමූහයේ මූල්‍ය ප්‍රකාශන 2007 අංක 07 දරන සමාගම් පනතේ 151 හා 153 වගන්තිවල අවශ්‍යතාවයන්වලට අනුකූල වේ.

- 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ)(iii) වගන්තියේ අවශ්‍යතාවයන් ප්‍රකාරව ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

- 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1) ඈ (iv) වගන්තියේ අවශ්‍යතාවය ප්‍රකාරව ඉකුත් වර්ෂයේදී මා විසින් කරන ලද සියලු නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

අනුගමනය කරන ලද ක්‍රියාමාර්ග හා ලබාගන්නා ලද සාක්ෂි මත හා ප්‍රමාණාත්මක කරුණුවලට සීමා කිරීම පහත සඳහන් ප්‍රකාශ කිරීමට තරම් කිසිවක් මාගේ අවධානයට ලක් නොවීය.

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

- 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12(ඈ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව සමාගමේ පාලක මණ්ඩලයේ යම් සාමාජිකයෙකුට සමාගම සම්බන්ධ වී ඇති යම් ගිවිසුමක් සම්බන්ධයෙන් සෘජුව හෝ අන්‍යාකාරයකින් සාමාන්‍ය ව්‍යාපාරික තත්ත්වයෙන් බැහැරව සම්බන්ධයක් ඇති බවට,

- 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12(ඊ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව යම් අදාළ ලිඛිත නීතියකට හෝ සමාගමේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානවලට අනුකූල නොවන ලෙස සමාගම ක්‍රියාකර ඇති බව,

- 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12(උ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව සමාගමේ බලතල, කර්තව්‍ය හා කාර්යයන්වලට අනුකූල නොවන ලෙස කටයුතු කර ඇති බව.

- 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12(ඌ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව සමාගම සම්පත් සකසුරුවම් ලෙස කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාල සීමාවන් තුළ අදාළ නීති රීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර නොමැති බව.

අත්සන් කළේ,
ඩබ්ලිව්.පී.සී.වික්‍රමරත්න
විගණකාධිපති

**ලාභ හෝ පාඩු සහ වෙනත් විස්තීරණ ආදායම් ප්‍රකාශනය**

| | | සමූහය | | සමාගම | |
|---|---|---|---|---|---|
| දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා | සටහන් | 2018 රු. 000 | 2017 රු. 000 | 2018 රු. 000 | 2017 රු. 000 |
| ආදායම | 5 | **31,827,090** | 30,573,686 | **30,943,889** | 29,930,225 |
| විකුණුම් පිරිවැය | | **(26,897,850)** | (25,754,568) | **(26,007,451)** | (25,182,114) |
| **දළ ලාභය** | | **4 ,929,240** | 4 ,819,117 | **4,936,438** | 4,748,111 |
| වෙනත් මෙහෙයුම් ආදායම | 6 | **1,882,505** | 737,148 | **1,885,356** | 740,714 |
| මෙහෙයුම් වියදම් | | **(2,546,817)** | (2,096,142) | **(2,546,105)** | (2,093,725) |
| පරිපාලන වියදම් | | **(2,363,027)** | (2,466,306) | **(2,327,604)** | (2,443,823) |
| **මෙහෙයුම්වලින් ලාභය** | | **1,901,901** | 993,817 | **1,948,085** | 951,277 |
| මූල්‍ය ආදායම | 7 | **1,332,554** | 1 ,309,082 | **1,325,962** | 1,287,817 |
| මූල්‍ය පිරිවැය | 7 | **(60,624)** | (21,209) | **(56,744)** | (21,209) |
| ශුද්ධ මූල්‍ය පිරිවැය | | **1 ,271,930** | 1 ,287,873 | **1,269,218** | 1,266,608 |
| **බදුවලට පෙර ලාභය** | 8 | **3 ,173,831** | 2 ,281,690 | **3,217,304** | 2,217,885 |
| ආදායම් බදු වියදම | 9 | **(236,129)** | (446,311) | **(247,423)** | (425,898) |
| **වර්ෂය සඳහා ලාභය** | | **2 ,937,702** | 1 ,835,379 | **2,969,881** | 1,791,987 |
| | | | | | |
| **වෙනත් විස්තීරණ ආදායම** | | | | | |
| **ලාභ හෝ පාඩු සඳහා ප්‍රතිවර්ගීකරණය කරන හෝ කළ හැකි විෂයයන්** | | | | | |
| මූල්‍ය වත්කම් සාධාරණ අගයේ ශුද්ධ වෙනස්කම් වෙනත් විස්තීරණ ආදායම් මත | 15 | **316,187** | 2 ,097,060 | **316,187** | 2,097,060 |
| විලම්බිත බදු - මූල්‍ය වත්කම්වල සාධාරණ අගයේ ශුද්ධ වෙනස්වීම මත | 9.2 | **(31,619)** | (66,494) | **(31,619)** | (66,494) |
| **ලාභ හෝ පාඩු සඳහා ප්‍රතිවර්ගීකරණය කළ නොහැකි විෂයයන්** | | | | | |
| නිශ්චිත ප්‍රතිලාභ වගකීම් සඳහා ආයු ගණක ලාභ (පාඩු) | 25 | **(15,544)** | (82,549) | **(15,544)** | (82,508) |
| ආයු ගණක පාඩු සඳහා විලම්භිත බදු ප්‍රතිවර්තනය | 9.2 | **4,352** | 23,114 | **4,352** | 23,102 |
| දේපල, පිරියත හා උපකරණ ප්‍රත්‍යාගණනය | | **245,853** | 947,001 | **245,853** | 877,150 |
| ප්‍රත්‍යාගණන අතිරික්තය මත විලම්භිත බදු අයකිරීම | 9.2 | **(148,240)** | (597,146) | **(148,240)** | (597,146) |
| **වෙනත් විස්තීරණ ආදායම, ශුද්ධ අගය** | | **3 70,990** | 2,320,986 | **370,990** | 2,251,165 |
| **වර්ෂය සඳහා මුළු විස්තීරණ ආදායම** | | **3,308,692** | 4 ,156,365 | **3,340,871** | 4,043,152 |
| | | | | | |
| **ලාභය ආරෝපණය කළ යුතු** | | | | | |
| සමාගමේ හිමිකරුවන්ට | | **2 ,946,320** | 1,820,981 | **2,969,881** | 1,791,987 |
| සුළු කොටස් හිමියන්ට | | **(8,618)** | 14,398 | **-** | - |
| **වර්ෂය සඳහා ලාභය** | | **2,937,702** | 1,835,379 | **2,969,881** | 1,791,987 |
| | | | | | |
| **මුළු විස්තීරණ ආදායම ආරෝපණය කළ යුතු** | | | | | |
| සමාගමේ හිමිකරුවන්ට | | **3 ,317,310** | 4 ,141,975 | **3,340,871** | 4,043,152 |
| සුළු කොටස් හිමියන්ට | | **(8,618)** | 14,389 | **-** | - |
| **වර්ෂය සඳහා මුළු විස්තීර්ණ ආදායම** | | **3,308,692** | 4,156,365 | **3,340,871** | 4,043,152 |
| | | | | | |
| කොටසකට මූලික ඉපැයුම (රු.) | 10 | **25.73** | 15.90 | **25.94** | 15.65 |

සටහන් මෙම මූල්‍ය ප්‍රකාශනවලට පූර්ණ කොටසක් වශයෙන් දැක්වේ.

වරහන් තුළ සංඛ්‍යාවලින් අඩු කිරීම් දැක්වේ.

## මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය

| දෙසැම්බර් 31 දිනට | සටහන් | සමූහය 2018 රු. 000 | සමූහය 2017 රු. 000 | සමාගම 2018 රු. 000 | සමාගම 2017 රු. 000 |
|---|---|---|---|---|---|
| **වත්කම්** | | | | | |
| **ජංගම නොවන වත්කම්** | | | | | |
| දේපල, පිරියත හා උපකරණ | 11 | **13,168,188** | 12,391,543 | **12,875,196** | 12,143,183 |
| ආයෝජන දේපල | 12 | **-** | - | **127,847** | 60,721 |
| අස්පෘශ්‍ය වත්කම් | 13 | **52,038** | 43,941 | **42,872** | 32,941 |
| පරිපාලිතයන්හි ආයෝජන | 14 | **-** | - | **31,320** | 31,320 |
| වෙනත් විස්තීරණ ආදායමෙහි මූල්‍ය වත්කම් | 15 | **10,585,463** | 10,269,276 | **10,585,463** | 10,269,276 |
| කොටස් සඳහා අත්තිකාරම් | 16 | **-** | - | **47,085** | 47,085 |
| වෙනත් ජංගම නොවන මූල්‍ය වත්කම් | 17 | **-** | 2,000,000 | **-** | 2,000,000 |
| **මුළු ජංගම නොවන වත්කම්** | | **23,805,689** | 24,704,760 | **23,709,783** | 24,584,528 |
| **ජංගම වත්කම්** | | | | | |
| වෙළඳ තොගය | 18 | **2,001,129** | 1,535,063 | **1,800,123** | 1,334,772 |
| වෙළඳ හා වෙනත් ලැබිය යුතු | 19 | **3,671,098** | 2,978,719 | **3,494,197** | 2,953,724 |
| පූර්ව ගෙවීම් හා අත්තිකාරම් | | **430,170** | 182,522 | **425,956** | 182,522 |
| වෙනත් මූල්‍ය වත්කම් | 17 | **14,306,698** | 9,008,186 | **14,265,068** | 8,912,342 |
| මුදල් හා බැංකු ශේෂ | 20 | **416,210** | 2, 699,848 | **408,975** | 2,623,471 |
| **මුළු ජංගම වත්කම්** | | **20,825,305** | 16,404,338 | **20,394,320** | 16,006,831 |
| **මුළු වත්කම්** | | **44,630,994** | 41,109,098 | **44,104,102** | 40,591,359 |
| **හිමිකම් හා වගකීම්** | | | | | |
| **හිමිකම්** | | | | | |
| ප්‍රකාශිත ප්‍රාග්ධනය | 21 | **1,145,067** | 1,145,067 | **1,145,067** | 1,145,067 |
| හිමිකම්වල වෙනත් සංරචක | 22 | **10,682,809** | 10,300,627 | **10,612,958** | 10,230,777 |
| රඳවාගත් ඉපැයුම් | | **20,176,529** | 17,941,409 | **19,998,103** | 17,739,414 |
| **සමාගමේ මුළු හිමිකම් දරන්නන් සඳහා ආරෝපණය කළ හැකි මුළු හිමිකම්** | | **32,004,405** | 29,387,103 | **31,756,127** | 29,115,257 |
| **සුළු කොටස් හිමියන්ගේ අයිතිය** | | **136,097** | 146,184 | - | - |
| **මුළු හිමිකම්** | | **32,140,503** | 29,533,287 | **31,756,127** | 29,115,257 |
| **ජංගම නොවන වගකීම්** | | | | | |
| විලම්භිත බදු වගකීම් | 23 | **573,810** | 806,359 | **583,733** | 805,005 |
| විලම්භිත ආදායම | 24 | **4,564,978** | 4,305,654 | **4,564,978** | 4,305,654 |
| විශ්‍රාම ප්‍රතිලාභ වගකීම් | 25 | **1,012,484** | 891,247 | **1,010,771** | 889,799 |
| | | **6,151,272** | 6,003,261 | **6,159,481** | 6,000,459 |
| **ජංගම වගකීම්** | | | | | |
| වෙළඳ හා වෙනත් ගෙවිය යුතු | 26 | **6,035,620** | 5,116,078 | **5,888,994** | 5,070,637 |
| ගෙවිය යුතු ආදායම් බදු | | **278,471** | 432,490 | **278,471** | 381,022 |
| බැංකු අයිරාව | 20 | **25,128** | 23,982 | **21,029** | 23,982 |
| **මුළු ජංගම වගකීම්** | | **6,339,219** | 5,572,550 | **6,188,494** | 5,475,642 |
| **මුළු වගකීම්** | | **12,490,491** | 11,575,811 | **12,347,975** | 11,476,102 |
| **මුළු හිමිකම් සහ වගකීම්** | | **44,630,994** | 41,109,098 | **44,104,102** | 40,591,359 |

වරහන් තුළ සංඛ්‍යාවලින් අඩු කිරීම් දැක්වේ.

මෙම මූල්‍ය ප්‍රකාශනවල පූර්ණ කොටසක් වශයෙන් ගිණුම්කරණ ප්‍රතිපත්ති හා සටහන් අමුණා ඇත.

මෙම මූල්‍ය ප්‍රකාශන 2007 අංක 07 දරන සමාගම් පනතේ අවශ්‍යතාවයන්ට අනුකූලව පිළියෙල කර ඇති බවට සහතික කරමි.

**ප්‍රධාන මූල්‍ය නිලධාරී**

මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඉදිරිපත් කිරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය වගකීම දරයි.

අධ්‍යක්ෂ මණ්ඩලය වෙනුවෙන් අනුමත කර තහතික කරමි.

සභාපති/ අධ්‍යක්ෂ

අධ්‍යක්ෂ

2019 මැයි 31, කොළඹ.

## හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය

**සමූහය**

| | සමාගමේ හිමිකරුවන්ට ආරෝපණය කළ යුතු | | | | | | සුළු කොටස් හිමියන් | මුළු හිමිකම් |
|---|---|---|---|---|---|---|---|---|
| | ප්‍රකාශිත ප්‍රාග්ධනය | ආදායම් සංචිත | ප්‍රත්‍යාගණන අතිරික්තය | සාධාරණ අගය සංචිත | රඳවාගත් ඉපැයුම් | මුළු | | |
| | රු. 000 | රු. 000 | රු. 000 | රු. 000 | රු. 000 | රු. 000 | රු. 000 | රු. 000 |
| 2016 දෙසැම්බර් 31 දිනට ශේෂය | 1,145,067 | 340,642 | 1,407,348 | 6,172,216 | 16,679,855 | 25,745,128 | 133,875 | 25,879,003 |
| වර්ෂය සඳහා ලාභය | - | - | - | - | 1,820,981 | 1,820,981 | 14,398 | 1,835,379 |
| වෙනත් විස්තීරණ ආදායම | - | - | 349,855 | 2,030,566 | (9,426) | 2,320,995 | (9) | 2,320,986 |
| **වර්ෂය සඳහා මුළු විස්තීරණ ආදායම** | - | - | 349,855 | 2,030,566 | 1,761,554 | 4,141,975 | 14,389 | 4,156,365 |
| **හිමිකම්වල සෘජුව වාර්තා කරන ලද හිමිකරුවන් සමඟ ගනුදෙනු** | | | | | | | | |
| මව් සමාගම විසින් ලාභාංශ | - | - | - | - | ( 500,000) | ( 500,000) | - | ( 500,000) |
| පරිපාලිතයන් විසින් සුළු කොටස් හිමියන්ට ලාභාංශ | - | - | - | - | - | - | (2,081) | (2,081) |
| **2017 දෙසැම්බර් 31 දිනට ශේෂය** | 1,145,067 | 340,642 | 1,757,203 | 8,202,782 | 17,941,409 | 29,387,103 | 146,184 | 29,533,287 |
| වර්ෂය සඳහා ලාභය | - | - | - | - | 2,946,320 | 2,946,320 | (8,618) | 2,937,702 |
| වෙනත් විස්තීරණ ආදායම | - | - | 97,613 | 284,569 | (11,200) | 370,982 | 8 | 370,990 |
| **වර්ෂය සඳහා මුළු විස්තීරණ ආදායම** | - | - | 97,613 | 284,569 | 2,935,120 | 3,317,302 | (8,610) | 3,308,692 |
| **හිමිකම්වල සෘජුව වාර්තා කරන ලද හිමිකරුවන් සමඟ ගනුදෙනු** | | | | | | | | |
| මව් සමාගම විසින් ලාභාංශ | - | - | - | - | (700,000) | (700,000) | - | (700,000) |
| පරිපාලිතයන් විසින් සුළු කොටස් හිමියන්ට ලාභාංශ | - | - | - | - | - | - | (1,476) | (1,476) |
| **2018 දෙසැම්බර් 31 දිනට ශේෂය** | 1,145,067 | 340,642 | 1,854,817 | 8,487,351 | 20,176,529 | 32,004,405 | 136,097 | 32,140,503 |

**හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය**

| | ප්‍රකාශිත ප්‍රාග්ධනය රු. 000 | ආදායම් සංචිත රු. 000 | ප්‍රත්‍යාගණන අතිරික්තය රු. 000 | සාධාරණ අගය සංචිත රු. 000 | රඳවාගත් ඉපැයුම් රු. 000 | මුළු හිමිකම් රු. 000 |
|---|---|---|---|---|---|---|
| 2016 දෙසැම්බර් 31 දිනට ශේෂය | 1,145,067 | 340,642 | 1,407,348 | 6,172,216 | 16,506,833 | 25,572,106 |
| වර්ෂය සඳහා ලාභය | - | - | - | - | 1,791,987 | 1,791,987 |
| වෙනත් විස්තීරණ ආදායම (බදු ශුද්ධ) | - | - | 280,004 | 2,030,566 | (59,406) | 2,251,165 |
| **වර්ෂය සඳහා මුළු විස්තීරණ ආදායම** | - | - | 280,004 | 2,030, 566 | 1,732,581 | 4,043,152 |
| **හිමිකම්වල සෘජුව වාර්තා කරන ලද හිමිකරුවන් සමඟ ගනුදෙනු** | | | | | | |
| ලාභාංශ | - | - | - | - | (500,000) | (500,000) |
| **2017 දෙසැම්බර් 31 දිනට ශේෂය** | 1,145,067 | 340,642 | 1,687,352 | 8,202,782 | 17,739,414 | 29,115,257 |
| වර්ෂය සඳහා ලාභය | - | - | - | - | 2 ,969,881 | 2,969,881 |
| වෙනත් විස්තීරණ ආදායම, බදු ශුද්ධ | - | - | 97,613 | 284,569 | (11,192) | 370,990 |
| **වර්ෂය සඳහා මුළු විස්තීරණ ආදායම** | - | - | 97,613 | 284,569 | 2 ,958,689 | 3,340,871 |
| හිමිකම්වල සෘජුව වාර්තා කරන ලද හිමිකරුවන් සමඟ ගනුදෙනු | | | | | | |
| ලාභාංශ | | - | - | - | (700,000) | ( 700,000) |
| **2018 දෙසැම්බර් 31 දිනට ශේෂය** | 1,145,067 | 340,642 | 1,784,965 | 8,487,351 | 19,998,103 | 31,756,127 |

වරහන් තුළ ඇති සංඛ්‍යාවලින් අඩුකිරීම් දැක්වේ.
සටහන් මෙම මූල්‍ය ප්‍රකාශනවලට පූර්ණ කොටසක් වශයෙන් දැක්වේ.

## මුදල් ප්‍රවාහ ප්‍රකාශනය

| | | සමූහය | | සමාගම | |
|---|---|---|---|---|---|
| දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා | සටහන් | 2018<br>රු. 000 | 2017<br>රු. 000 | 2018<br>රු. 000 | 2017<br>රු. 000 |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් මුදල් ප්‍රවාහය** | | | | | |
| බදුවලට පෙර ලාභය | | **3,173,831** | 2,281,690 | **3,217,304** | 2,217,885 |
| ගැලපීම් | | | | | |
| දේපල, පිරියත හා උපකරණ ක්ෂය | | **896,603** | 946,082 | **872,398** | 940,149 |
| විලම්භිත ආදායම ක්‍රමක්ෂය | | **(368,069)** | (365,300) | **(368,069)** | (365,300) |
| දේපල, පිරියත හා උපකරණ මත ප්‍රත්‍යාගණන වාසිය | | **-** | (5,036) | **-** | (5,036) |
| අස්පෘශ්‍ය වත්කම් ක්‍රමක්ෂය | | **16,756** | 13,385 | **14,923** | 11,552 |
| ආයෝජන දේපල ක්ෂය | | **-** | - | **1,817** | 1,025 |
| විශ්‍රාම පාරිතෝෂික සඳහා ප්‍රතිපාදන | | **142,901** | 125,552 | **142,517** | 125,257 |
| ලැබිය යුතු වෙළඳ ශේෂ හානිකරණ | | **(2,026)** | 13,205 | **3,710** | 11,798 |
| සෙමින් චලනය වන තොග සඳහා ප්‍රතිපාදන | | **49,898** | (3,260) | **49,898** | (3,260) |
| දේපල, පිරියත හා උපකරණ ඉවත් කිරීමෙන් ලාභ/ පාඩු | | **14,655** | (54,533) | **14,655** | (54,533) |
| පොලී ආදායම | | **(1,332,554)** | (1,309,082) | **(1,325,962)** | (1,287,817) |
| පොලී වියදම | | **20,307** | 21,209 | **16,426** | 21,209 |
| ලාභාංශ ආදායම | | **(1,165,881)** | - | **(1,169,326)** | (4,806) |
| කාරක ප්‍රාග්ධනය වෙනස්වීම් වලට පෙර මෙහෙයුම් ලාභය | | **1,446,420** | 1,663,912 | **1,470,290** | 1,608,125 |
| තොග (වැඩිවීම)/ අඩුවීම | | **(515,964)** | (367,232) | **(515,249)** | (349,850) |
| අත්තිකාරම් හා පූර්ව ගෙවීම් වැඩිවීම/ (අඩුවීම) | | **(247,648)** | 79,729 | **(243,434)** | 56,991 |
| වෙළඳ හා වෙනත් ලැබිය යුතු ශේෂ වැඩිවීම/ (අඩුවීම) | | **(690,352)** | 408,237 | **(544,183)** | 327,359 |
| වෙළඳාම හා වෙනත් ගෙවිය යුතු ශේෂ වැඩිවීම/ (අඩුවීම) | | **919,542** | 122,016 | **818,357** | 183,191 |
| විලම්බිත ආදායම වැඩි කිරීම/ (අඩුවීම) | | **627,393** | 593,364 | **627,393** | 593,364 |
| මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ජනනය වූ ශුද්ධ මුදල් | | **1,539,390** | 2,500,026 | **1,613,174** | 2,419,179 |
| ගෙවූ ආදායම් බදු | | **(798,203)** | (507,285) | **(746,753)** | (477,512) |
| ගෙවූ පොලී වියදම | | **(20,307)** | (19,235) | **(16,426)** | (19,235) |
| ගෙවූ විශ්‍රාම පාරිතෝෂික | | **(37,179)** | (25,766) | **(37,089)** | (25,766) |
| මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ජනනය වූ ශුද්ධ මුදල් | | **683,701** | 1,947,740 | **812,906** | 1,896,667 |
| **ආයෝජන ක්‍රියාකාරකම්වලින් මුදල් ප්‍රවාහය** | | | | | |
| වෙනත් මූල්‍ය වත්කම්වල ශුද්ධ ආයෝජන | | **(3,298,512)** | (1,805,179) | **(3,352,726)** | (1,762,031) |
| දේපල, පිරියත හා උපකරණ ශුද්ධ අත්කර ගැනීම | | **(1,466,931)** | (1,210,414) | **(1,398,067)** | (1,172,620) |
| ආයෝජන දේපල අත්කර ගැනීම | | **-** | - | **(68,943)** | - |
| ලැබූ පොලී ආදායම | | **1,332,554** | 1,309,082 | **1,325,962** | 1,287,817 |
| ලැබූ ලාභාංශ ආදායම | | **1,165,881** | - | **1,169,326** | 4,806 |
| ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනනය වූ/ යෙදූ වූ ශුද්ධ මුදල් | | **(2,267,007)** | (1,706,511) | **(2,324,448)** | (1,642,028) |
| **මූල්‍ය ක්‍රියාකාරකම්වලින් මුදල් ප්‍රවාහය** | | | | | |
| මව් සමාගමේ හිමිකරුවන් සඳහා ලාභාංශ ගෙවීම | | **(700,000)** | (500,000) | **(700,000)** | (500,000) |
| සුළු කොටස් හිමියන් සඳහා ලාභාංශ ගෙවීම | | **(1,476)** | (2,081) | **-** | - |
| මූල්‍ය ක්‍රියාකාරකම්වල යෙදූ වූ ශුද්ධ මුදල් | | **(701,476)** | (502,081) | **(700,000)** | (500,000) |
| මුදල් හා මුදල් සමාන ශේෂවල ශුද්ධ වැඩිවීම/ (අඩුවීම) | | **(2,284,782)** | (260,851) | **(2,211,542)** | (245,361) |
| වර්ෂය ආරම්භයේ මුදල් හා මුදල් සමාන ශේෂය | | **2,675,865** | 2,936,716 | **2,599,488** | 2,844,849 |
| වර්ෂය අවසානයේ මුදල් හා මුදල් සමාන ශේෂය | 20 | **391,082** | 2,675,865 | **387,947** | 2,599,488 |
| **මුදල් හා මුදල් සමාන ශේෂය පිළිබඳ විශ්ලේෂණය** | | | | | |
| අතැති මුදල් හා බැංකුවේ මුදල් | | **416,210** | 465,825 | **408,975** | 389,471 |
| මුදල් සමාන ශේෂය | | **-** | 2,234,023 | **-** | 2,234,000 |
| බැංකු අයිරාව | | **(25,128)** | (23,982) | **(21,029)** | (23,982) |
| | 20 | **391,082** | 2,675,865 | **387,947** | 2,599,488 |

## 1 වාර්තාකරණ ආයතනය

### 1.1 සංස්ථාපනය හා නෛතික ස්වරූපය

සී/ස ලංකා විදුලි (පෞද්ගලික) සමාගම යනු ශ්‍රී ලංකාවේ සංස්ථාගත ස්ථාපනය කරන ලද සීමිත වගකීම් සමාගමකි. එහි ලියාපදිංචි කාර්යාලය කොළඹ 03 ගාලු පාරේ ඊ එච් කුරේ ගොඩනැගිල්ලේ 411 යන ස්ථානයේ පිහිටා ඇත.

### 1.2 ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන

2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සමාගමේ ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන, සී/ස ලංකා විදුලි පෞද්ගලික සමාගමේ (''සමාගම'') සහ සමූහයට (''සමූහය'') ඒකාබද්ධ කරන ලද එහි පරිපාලිතයන්ගේ ගිණුම්වලින් සමන්විත වේ.

### 1.3 ප්‍රධාන ක්‍රියාකාරකම් හා මෙහෙයුම් ස්වභාවය

වර්ෂය තුළ සමාගමේ ප්‍රධාන කාර්යයන් වූයේ ලංකා විදුලි බල මණ්ඩලයෙන් විදුලි බලය මිලදී ගෙන, ගාල්ල, කළුතර, මොරටුව, කැළණිය, නුගේගොඩ, කෝට්ටේ හා මීගමුව පිහිටා ඇති සමාගමේ ශාඛා මඟින් ගෘහාශ්‍රිත හා කර්මාන්ත ගනුදෙනුකරුවන්ට විදුලි බලය සිල්ලරට සැපයීමයි.

සමාගමේ පරිපාලිතයන් හා ප්‍රධාන කාර්යයන් පහත පරිදි වේ.

| සමාගම | කාර්යය |
|---|---|
| සීමාසහිත ලෙකෝ ප්‍රොජෙක්ට්ස් (පුද්ගලික) සමාගම | රට තුළ විදුලි බලය බෙදා හැරීම සඳහා යටිතල පහසුකම් සැපයීම. |
| සීමාසහිත අන්ටෙ ලෙකෝ මීටරින් (පුද්ගලික) සමාගම | ශ්‍රී ලංකාවේ හා අපනයන වෙළඳපොළ සඳහා ඉලෙක්ට්‍රොනික මීටර අවශ්‍යතාවය සපුරාලීම සඳහා බල ශක්ති මීටර නිෂ්පාදන පහසුකම සැපයීම. |

### 1.4 මව් ව්‍යාපාරය හා පරම මව් ව්‍යාපාරය

1969 අංක 17 දරන ලංකා විදුලි බල මණ්ඩල පනත යටතේ ශ්‍රී ලංකාවේ සංස්ථාපනය කරන ලද ලංකා විදුලි බල මණ්ඩලය සමාගමේ මව් ව්‍යාපාරය වේ.

### 1.5 අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මූල්‍ය ප්‍රකාශන අනුමත කිරීම

2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සමූහයේ හා සමාගමේ මූල්‍ය ප්‍රකාශන නිකුත් කිරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2019 ජුනි 4 දින අනුමැතිය දෙන ලදි.

## 2. පිළියෙල කිරීමේ පදනම

### 2.1 අනුකූලතා ප්‍රකාශනය

මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය, ලාභ හෝ පාඩු හා වෙනත් විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය හිමිකම්, වෙනස්වීමේ ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට සටහන් වලින් සමන්විත සමූහයේ ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන හා සමාගමේ වෙනම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය විසින් දක්වා ඇති ශ්‍රී ලංකා ගිණුම්කරන ප්‍රමිති (ශ්‍රීලංමුවාප්‍ර හා ශ්‍රීලංගිප්‍ර) වලට අනුකූලව 2007 අංක 7 දරන සමාගම් පනතේ අවශ්‍යතාවයන්ට අනුකූලව පිළියෙල කර ඉදිරිපත් කර ඇත.

**2.2 මූල්‍ය ප්‍රකාශන සඳහා වගකීම**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති වලට සහ 2007 අංක 07 දරන සමාගම් පනතේ විධිවිධානයන්ට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම අධ්‍යක්ෂ මණ්ඩලයේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිපත් කිරීමට අදාළ වන අභ්‍යන්තර පාලනයන් සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම හා පවත්වා ගෙන යාමත් යෝග්‍ය ගිණුම්කරණ ප්‍රතිපත්ති තෝරා ගැනීම සහ යොදා ගැනීමත් අවස්ථාවෝචිතව සාධාරණ ලෙස ගිණුම්කරණ ඇස්තමේන්තු සකස් කිරීමත් මෙම වගකීමට ඇතුළත් වේ.

**2.3 මිනුම්කරණ පදනම**

සමූහයේ හා සමාගමේ මූල්‍ය ප්‍රකාශන මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ පහත සඳහන් වැදගත් අයිතමයන් සඳහා හැර, ඓතිහාසික පිරිවැය පදනම මත පිළියෙල කරන ලදි.

- මූල්‍ය වත්කම් සාධාරණ වටිනාකම මත පදනම්ව වෙනත් විස්තීරණ ආදායම් යටතේ ගිණුම් ගත වේ.
- ඉඩම් හා ගොඩනැගිලි අත්කර ගන්නා අවස්ථාවේදී පිරිවැයට මිනුම්කරණය කරන අතර, පසුව ප්‍රත්‍යාගණිත දිනයට තිබෙන සාධාරණ අගයට ප්‍රත්‍යාගණිත මුදලට මිනුම්කරණය කෙරේ.
- නිශ්චිත ප්‍රතිලාභ බැඳීම් සඳහා වගකීම් නිශ්චිත ප්‍රතිලාභ බැඳීම්වල වර්තමාන අගයට ගලපා ගනු ලැබේ.

**2.4 ක්‍රියාකාරිත්ව හා ඉදිරිපත් කිරීමේ ව්‍යවහාර මුදල**

මූලික ආර්ථික පරිසරයේ ව්‍යවහාර මුදල් වන ශ්‍රී ලංකා රුපියල් වලින් සමූහයේ හා සමාගමේ මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කර ඇති අතර ලංකා විදුලි (පෞද්ගලික) සමාගම ඉදිරිපත් කරන මූල්‍ය තොරතුරු වෙනත් ආකාරයෙන් දක්වා තිබීම හැර ශ්‍රී ලංකා රුපියල් වලින් ආසන්න දහසට දක්වා ඇත. සමාලෝචිත වර්ෂය තුළ සමූහයේ ඉදිරිපත් කිරීම් වල හා ක්‍රියාකාරිත්ව ව්‍යවහාර මුදල් වල වෙනස්වීම් කිසිවක් නොමැත.

**2.5 ප්‍රමාණාත්මක බව හා සමූහනය**

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට (ශ්‍රීලංගිප්‍ර1) අනුකූලවීම සමූහය - (මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම) සමාන විෂයන්ගේ එක් එක් ද්‍රව්‍යාත්මක පන්තිය මූල්‍ය ප්‍රකාශනවල වෙනම දක්වා ඇත. අසමාන ස්වභාවයේ විෂයයන් හෝ කාර්යයන්ද ඒවායේ ප්‍රමාණාත්මක බව මත වෙනම දක්වා ඇත.

මූල්‍ය වත්කම් හා මූල්‍ය වගකීම් එකිනෙකට හිලව් වන අතර හඳුනාගන්නා ලද ප්‍රමාණය හිලව් කිරීම සඳහා නෛතික බලයක අයිතියක් තිබේ නම් හා ශුද්ධ පදනම මත නිරවුල් කිරීමට අදහසක් හෝ සමානව වත්කම් උපලබ්ධිවීම සහ වගකීම් නිරවුල් කිරීමට අදහසක් තිබේ නම් පමණක් ශුද්ධ මුදල මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ වාර්තා කර ඇත. ගිණුම්කරණ ප්‍රමිතියක අවශ්‍යතාවයක් හෝ අවසරයක් නොවේ නම් ආදායම හා වියදම හිලව් නොකෙරේ.

**2.6 සංසන්දනාත්මක තොරතුරු**

ප්‍රවර්ථන වර්ෂයේ ඉදිරිපත් කිරීම තහවුරු කිරීම සඳහා පෙර කාල පරිච්ඡේදයේ සංඛ්‍යා සහ සටහන් යළි සකස් කර නැවත වර්ගීකරණය කර ඇත.

ගිණුම්කරණ ප්‍රතිපත්ති සමාගම විසින් සංගත භාවයෙන් යොදා ගෙන ඇති අතර ගිණුම්කරණ ප්‍රතිපත්ති වල විශේෂයෙන් හඳුනාගත් ප්‍රතිපත්ති හැර පෙර වර්ෂයේ යොදා ගත් ප්‍රතිපත්ති වලටද අනුරූප වේ.

**2.7 වැදගත් ගිණුම්කරණ විනිශ්චයන් ඇස්තමේන්තු හා උපකල්පනයන්**

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති වලට අනුකූලව සමූහයේ හා සමාගමේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සඳහා ගිණුම්කරණ ප්‍රතිපත්ති යොදා ගැනීමේදී බලපාන විනිශ්චයන්, ඇස්තමේන්තු හා උපකල්පයන් හා වත්කම්, වගකීම් ආදායම් හා වියදම් වල වාර්තා කරන ලද ප්‍රමාණයන් කළමනාකරණයට යොදා ගැනීමේදී බලපාන විනිශ්චයන්, ඇස්තමේන්තු හා උපකල්පයන් කිරීම කළමනාකාරීත්වය විසින් සිදු කළ යුතු වේ.

කෙසේ වුවද මෙම උපකල්පන හා ඇස්තමේන්තු පිළිබඳ අවිනිශ්චිත භාව අනාගත කාල පරිච්ඡේදයන් තුලදී බලපාන වත්කමේ හෝ වගකීමේ ධාරන අගය ප්‍රමාණාත්මක ගැලපීමක් අවශ්‍ය වන ප්‍රතිඵලයක් ලැබීමට ඉවහල් වේ.

ඇස්තමේන්තු හා දක්වන ලද උපකල්පනයන් යාවත්කාලීනව පදනමක් මත සමාලෝචනය කෙරේ. ඇස්තමේන්තු සංශෝධනය කරන ලද කාල පරිච්ඡේදය හා කිසියම් අනාගත කාල පරිච්ඡේදයක් බලපායි නම් ගිණුම්කරණ ඇස්තමේන්තු සංශෝධන වලදී හඳුනා ගනු ලැබේ.

සමූහයේ හා සමාගමේ මූල්‍ය ප්‍රකාශනවල හඳුනාගත් ප්‍රමාණයක් මත වඩා වැදගත් බලපෑම් ඇති ගිණුම්කරණ ප්‍රතිපත්ති යොදාගැනීමේදී ඇස්තමේන්තු අවිනිශ්චිතතාවන් හා බැරෑරුම් විනිශ්චයන් පිළිබඳ වඩා වැදගත් ක්ෂේත්‍ර පහත දැක්වේ.

### 2.7.1 අඛණ්ඩව පැවැත්ම

අඛණ්ඩ පැවැත්මකින් ව්‍යාපාරය පවත්වා ගැනීමට සමූහයට ඇති හැකියාව පිළිබඳව තක්සේරුවක් අධ්‍යක්ෂවරුන් විසින් සිදුකර ඇති අතර දීර්ඝ අනාගත කාලය සඳහා ව්‍යාපාරය පවත්වා ගැනීමට එය සතුව සම්පත් ඇති බවට සෑහීමකට පත්ව ඇත. තවද අඛණ්ඩ පැවැත්මකින් තබා ගැනීමට සමූහයේ හැකියාව පිළිබඳව සැලකිය යුතු සැකයක් ඇති කරවන කිසිඳු ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයන් ඇති බවට අධ්‍යක්ෂ මණ්ඩලය දැනුවත්ව නොමැති අතර සමූහය ඈවර කිරීමට හෝ මෙහෙයුම් නවතාලීමට අදහස් නොකෙරේ. එබැවින් මූල්‍ය ප්‍රකාශන අඛණ්ඩ පැවැත්මතා පදනම මත ඉදිරියටත් සකස් කරනු ලැබේ.

### 2.7.2 ලැබිය යුතු වෙළඳ ශේෂ සඳහා හානිකරණ ප්‍රතිපදානය

ගිනුම්කරණ ප්‍රතිපත්ති 3.11.1.3 බලන්න.

### 2.7.3 වෙනත් විස්තීරණ ආදායම මගින් මූල්‍ය වත්කම් සාධාරණ අගයට හානිකරණය කිරීම (විකිණීමට තිබෙන ආයෝජන 2018 ජනවාරි 01 දිනට පෙර)

හානිකරණය කරන ලද වාස්තිමිත සාක්ෂියක් තිබේදැයි තීරණය කිරීම සඳහා සමූහය හා සමාගම විසින් ඔවුන්ගේ මිල ප්‍රකාශිත නොවන ස්කන්ධ ආයෝජන එක් එක් වාර්තාකරණ දිනයට විකිණීමට ඇති ආයේජන ලෙස වර්ගීකරණය කරනු ලැබේ. ආයෝජනයේ මූලික හඳුනාගැනීමෙන් පසු එකක් හෝ සිද්ධි ගණනාවක් සිදුවීමේ ප්‍රතිඵලයක් ලෙස වාස්තමික සාක්ෂියක් තිබේ නම් ආයෝජනය හානි කෙරේ.

### 2.7.4 වෙනත් විස්තීරණ ආදායම මගින් සාධාරණ අගයට මූල්‍ය වත්කම් වල සාධාරණ අගය (විකිණීමට තිබෙන ආයෝජන 2018 ජනවාරි 01 දිනට පෙර)

කිසිදු වෙළඳපොල මිලක් නිරීක්ෂණය නොවනු මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ වෙනත් විස්තීර්ණ ආදායම මගින් සාධාරණ අගයට මූල්‍ය වත්කම් ලෙස වර්ගීකරණයට කරන ලද මූල්‍ය වත්කම්වල සාධාරණ අගය කිරීමේ ශිල්පීය ක්‍රම යොදා ගනිමින් තීරණය කරයි. වෙනත් විස්තීරණ ආදායම මගින් සාධාරණ අගයට මූල්‍ය වත්කම් තක්සේරු කිරීම තවදුරටත් විස්තරාත්මකව මූල්‍ය ප්‍රකාශනවල සටහන් 32හි විස්තර කර ඇත.

මිනුම්කරණයන් කිරීමේදී යොදාගන්නා යෙදවුම්වල වැදගත් බව නිරූපණය කරන සාධාරණ අගයේ අනුපිළිවෙල භාවිතා කරමින් සමූහය විසින් සාධාරණ අගය ගණනය කරනු ලැබේ. සාධාරණ අගයේ අනුපිළිවෙල මූල්‍ය ප්‍රකාශනවල සටහන 32හි දක්වා ඇත.

### 2.7.5 නිශ්චිත ප්‍රතිලාභ සැලසුම්

නිශ්චිත ප්‍රතිලාභ සැලසුම්වල පිරිවැය හා ඒවායේ බැඳීම පිළිබඳ වර්තමාන වටිනාකම ආයුගණක තක්සේරු කිරීම් භාවිතා කරමින් තීරණය කෙරේ. ආයු ගණක තක්සේරු සඳහා වට්ටම් අනුපාත, ඉදිරි වැටුප් වැඩිවීම හා මරණ අනුගතය පිළිබඳ උපකල්පනයක් අවශ්‍ය වේ. මෙම සැලසුම් වල දිගුකාලීන ස්වභාවය හේතුවෙන් එවැනි ඇස්තමේන්තු සැලකිය යුතු අවිනිශ්චිතතාවයට යටත් වේ. සියලු උපකල්පනයන් එක් එක් වාර්තාකරණ දිනයට සමාලෝචනය කෙරේ.

අදාළ වට්ටම් අනුගතය තීරණය කිරීමේදී, නිශ්චිත ප්‍රතිලාභ බැඳීම් පිළිබඳ අපේක්ෂිත කාලය අදාල වන ශ්‍රී ලංකා රජයේ කල් පිරෙන බැඳුම්කරවල පොලී අනුගතය කෙරෙහි කළමනාකාරණය විසින් සැලකිලිමත් වේ. මරණ අනුපාතය පොදුවේ ලබා ගත හැකි මරණ අනුපාත වගු මත පදනම් වේ. ඉදිරි වැටුප් වැඩිවීම් සමාගමේ අනාගත අපේක්ෂිත වැටුප් වැඩිවීම් අනුපාතය මත පදනම් වේ.

### 2.7.6 දේපල, පිරියත හා උපකරණවල සාධාරණ අගය

සමාගමේ හා සමූහයේ ඉඩම් හා ගොඩනැගිලි සාධාරණ අගයට නිරූපනය වේ. ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති ශ්‍රීලංමුවාප්‍ර 13 (සාධාරණ අගය ගණනය කිරීම) ප්‍රකාරව ඉඩම් හා ගොඩනැගිලිවල සාධාරණ අගය තීරණය කිරීම සඳහා ස්වාධීන තක්සේරු ප්‍රවීණයන් සමූහය විසින් යොදවා ගනු ලැබේ.

### 2.7.7 දේපල පිරියත, හා උපකරණවල ප්‍රයෝජනවත් ජීව කාලය

සමූහය හා සමාගම විසින් දේපල, පිරියත හා උපකරණවල ශේෂ අගය, ප්‍රයෝජනවත් ජීව කාලය හා ක්ෂය කිරීමේ ක්‍රම එක් එක් වාර්තාකරණ දිනයට සමාලෝචනය කෙරේ. මෙම වටිනාකම්, අනුපාත හා ක්‍රම ඇස්තමේන්තු කිරීමේදී කළමනාකාරිත්වයේ විනිශ්චයට ලක්වන අතර එබැවින් ඒවා අවිනිශ්චිතතාවයට යටත් වේ.

### 2.7.8 බැඳීම් හා අසම්භාව්‍යයන්

හඳුනාගත් සියලු වගකීම් පිළිබඳ ප්‍රමාණය තීරණය කිරීමේදී ප්‍රත්‍යක්ෂ සියලු අවදානම් සැලකිල්ලට ගනී.

අසම්භාව්‍ය වගකීම් යනු ආර්ථික ප්‍රතිලාභය මාරු කළ නොහැකි හෝ විශ්වාසදායීව ගණනය කළ නොහැකි ඉදිරි අවිනිශ්චිත සිදුවීම් හෝ වර්තමාන බැඳීම් මඟින් පමණක් ඒවායේ පැවැත්ම තහවුරු කෙරෙන විය හැකි බැඳීම් වේ. අසම්භාව්‍ය වගකීම් මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ හඳුනා නොගන්නා නමුත් ඒවා දුරස්ථ නොවේ නම් හෙළිදරව් කරනු ලැබේ.

## 3 වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති පිළිබඳ සාරාංශය

සමූහය හා සමාගම විසින් මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී යොදා ගන්නා ලද ගිණුම්කරණ ප්‍රතිපත්ති පහත දක්වා ඇත. මෙම මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කරන සියලුම කාල පරිච්ඡේදයන් සඳහා පහත දක්වා ඇති ගිණුම්කරණ ප්‍රතිපත්ති එසේ නොවන බව දක්වා නොමැත්තේ නම් හැර සංගත භාවයෙන් යොදා ගෙන ඇත.

### 3.1 ඒකාබද්ධ කිරීමේ පදනම

2018 දෙසැම්බර් 31 දිනට සමූහයේ හා එහි පරිපාලිතයන්ගේ මූල්‍ය ප්‍රකාශනවලින් ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන සමන්විත වේ.

සමූහය විවෘතවීමේදී පාලනය ඉටුකර ගැනීම හෙවත් ආයෝජන සමඟ එහි සහභාගිත්වයෙන් විචල්‍ය ලාභය සඳහා හැකියාව ඇත. විශේෂයෙන් පහත කරුණු සමූහයට තිබෙන විටෙක පමණක් ආයෝජන පාලනය කරයි.

- ආයෝජක කෙරෙහි බලය (එනම් ආයෝජකගේ අදාල කාර්යයන් මෙහෙයවීම සඳහා ප්‍රවර්තන හැකියාව ලබාදෙන පවත්නා හිමිකම්)
- ආයෝජක සමඟ එහි සහභාගිත්වය සඳහා විචල්‍ය ලාභ වලට පාත්‍රවීම සඳහා විවෘතවීම හෝ හිමිකම්
- එහි ලාභවලට බලපෑම සඳහා ආයෝජක කෙරෙහි ශක්තිය සඳහා හැකියාව

සාමාන්‍යයෙන් පාලනයේදී වැඩිදෙනෙකුගේ ඡන්දයදීමේ හිමිකම් පූර්ව නිගමනයක් වේ. මෙම පූර්ව නිගමනයට සහාය සඳහා ඡන්දයදීමක් හා ආයෝජකගේ සමාන හිමිකම් වැඩි ප්‍රමාණයක් සමූහයට නොවන විට සමූහය එහි ශක්තිය ආයෝජක කෙරෙහි තිබේද යන්න තක්සේරු කිරීමේදී සමූහය සියලු අදාළ කරුණු හා සැලකිල්ලට ගත යුතු කරුණු සලකා බලනු ලැබේ.

- ආයෝජකගේ වෙනත් ඡන්ද හිමිකරුවන් සමඟ ගිවිසුම්ගත වැඩ පිළිවෙල
- වෙනත් ගිවිසුම්ගත වැඩ පිළිවෙලකින් පැන නගින හිමිකම්
- සමූහයේ ඡන්දය දීමේ හිමිකම් හා විභව්‍ය ඡන්දය දීමේ හිමිකම්

සමූහය එහි පාලනය තිබේද නැද්ද යන්න යළි තක්සේරු කරන අතර අදාළ කරුණු සැලකිල්ලට ගත යුතු කරුණු වලින් දැක්වෙන්නේ පාලන මූලිකාංග තුනෙන් එකක් හෝ වැඩි ගණනක් සඳහා වෙනස්වීම් තිබෙන බවයි. පරිපාලිතය කෙරෙහි සමූහයේ පාලනය ලබාගන්නා විට පරිපාලිතයන් ඒකාබද්ධ කිරීම ආරම්භ කරන අතර පරිපාලිතය කෙරෙහි සමූහයේ පාලනය නැතිවන විට එය අවසන් වේ. පරිපාලිතයක වර්ෂය තුළ අත්කර ගත් හෝ අපහරණය කළ වත්කම්, බැරකම් ආදායම් සහ වියදම් සමූහය පාලනය ලබාගන්නා දින සිට ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් කරන අතර එය පරිපාලිතය පිළිබඳ සමූහයේ පාලනය අවසන් වන දිනය දක්වා වේ. ලාභය හෝ පාඩුව සහ වෙනත් විස්තීර්ණ ආදායමේ (OCI) එක් එක් සංරචක සමූහයේ මව් සමාගමේ සම කොටස් හිමිකරුවන් සහ සුළු කොටස් හිමිකරුවන් සඳහා ආයෝජනය කෙරේ. එහිදී සුළු කොටස් හිමිකරුවන්ගේ ඌනතා ශේෂයක් තිබුණද එසේ සිදුකෙරේ. පරිපාලිතයන්ගේ ගිණුම්කරණ ප්‍රතිපත්ති සමූහයේ ගිණුම්කරණ ප්‍රතිපත්ති වලට අනුකූලවීම සඳහා අවශ්‍ය විටෙක පරිපාලිතයන්ගේ මූල්‍ය ප්‍රකාශනවල ගැලපීම් සිදුකෙරේ.

ඒකාබද්ධ කිරීමේදී සාමාජිකයන් හා සමූහය අතර ගනුදෙනුවලට අදාළව සියලු අන්තර් සමූහ වත්කම් හා බැරකම් ස්කන්ධය ආදායම, වියදම් සහ මුදල් ප්‍රවාහ සම්පූර්ණයෙන් ඉවත් කෙරේ. පාලනය අහිමිවීමත් නොමැතිව පරිපාලිත හිමිකම් අයිතියක වෙනස්වීමක් හිමිකම් ගනුදෙනුවක් ලෙස ගිණුම්ගත කෙරේ.

පරිපාලිතයක් පිළිබඳ පාලනය සමූහයට අහිමි වේ නම් එහිදී අදාළ වත්කම් (කීර්තිනාමය ඇතුළත්ව) සුළු කොටස් හිමිකරුවන්ගේ අයිතීන් සහ හිමිකම් සහ හිමිකම් පිළිබඳ වෙනත් සංරචක හඳුනා නොගන්නා අතර ලැබීමක් හෝ අලාභයක් යන ඕනෑම ප්‍රතිඵලයක් ලාභයෙහි හෝ පාඩුවෙහි හඳුනා ගනී. ඕනෑම රඳවාගත් ආයෝජනයක් සාධාරණ අගයට හඳුනා ගනී. ඒකාබද්ධ කිරීමේ කාර්යය සඳහා ඡන්දය දීමේ අයිතිය හා පරිපාලිත සමාගම් රඳවා ගැනීමේ පාලනය පිළිබඳ ප්‍රධානත්වය සීමාසහිත ලංකා විදුලි (පෞද්ගලික) සමාගම සතුවන බැවින් සීමාසහිත ඇන්ටෙ ලෙකෝ මීටරින් (පුද්ගලික) සමාගම හා සීමාසහිත ලෙකෝ ප්‍රොජෙක්ට්ස් (පුද්ගලික) සමාගම එහි පරිපාලිතයන් ලෙස සලකනු ලැබේ.

### 3.2 විදේශ මුදල් ගනුදෙනු සහ ශේෂයන්

ගනුදෙනු සිදුවන දිනයන්හි පවතින විනිමය අනුපාතිකයන් යොදා ගනිමින්, සියලු විදේශ මුදල් ගනුදෙනු ශ්‍රී ලංකා රුපියල් වලට එනම් ක්‍රියාත්මක මුදල් වලට පරිවර්තනය කරනු ලැබේ.

වාර්තා කරන දිනයට විදේශ මුදල් ලෙස පවතින මූල්‍ය වත්කම් හා බැරකම් එදිනට පවතින තත්කාලීන විදේශ විනිමය අනුපාතය යොදා ගනිමින් ශ්‍රී ලංකා රුපියල් වලට පරිවර්තනය කෙරෙන අතර වෙළඳ නොවන ක්‍රියාකාරකම් මත පැන නගින වෙනස්කම් සියල්ල ලාභ හෝ පාඩුවලට ගනු ලැබේ.

ඓතිහාසික පිරිවැය ප්‍රකාරව ගණනය කරන ලද විදේශ මුදල් ලෙස පවතින මූල්‍ය නොවන විෂයයන්, මූලික ගනුදෙනුව සිදුවන දිනයට පවතින විනිමය අනුපාත යොදා ගනිමින් පරිවර්තනය කෙරේ. සාධාරණ අගයට ගණනය කරන ලද විදේශ මුදල් වලින් පවතින මූල්‍ය නොවන විෂයයන් සාධාරණ අගය තීරණය කරන දිනට පවතින විනිමය අනුපාත යොදා ගනිමින් පරිවර්තනය කෙරේ.

මූල්‍ය විෂයයන් නිරවුල් කිරීම හෝ පරිවර්තනය කිරීම මත පැනනගින විදේශ විනිමය වෙනස්කම්, ආරම්භකව වාර්තා කළ අනුපාතවල වෙනස්කම් ලාභ හෝ පාඩුවල වාර්තා කෙරේ.

### 3.3 ආදායම හඳුනාගැනීම

සමූහය, මූලිකව ශ්‍රීලංමුවාප්‍ර 15 යොදා ගන්නා ලදී 2018 ජනවාරි 01 දින සිට 'පාරිභෝගිකයන් සමග කොන්ත්‍රාත්තුවලින් ආදායම'

**කාර්ය සාධන වගකීම් හා ආදායම් හඳුනාගැනීමේ ප්‍රතිපත්ති**

ශ්‍රීලංමුවාප්‍රා 15 මගින් ආදායම හඳුනාගැනීමේදී කවර ප්‍රමාණයකින් කවර අවස්ථාවකදීද යන්න වඩාත් විස්තරාත්මකව හා පැහැදිලි රාමුවකින් යුතුව දක්වා ඇත.

විදුලිබලය සැපයීමේ සහ විදුලිමීටර් විකිණීමේ ව්‍යාපාරයේ සමූහය යෙදී සිටී. භාණ්ඩ හෝ සේවා සඳහා හුවමාරුවක් වශයෙන් සමූහය හිමිකම් ලැබීමට අපේක්ෂා කරන සලකා බැලීම පිළිබිඹු කරන මුදලකම භාණ්ඩ හෝ සේවා පාලනය පාරිභෝගිකයා වෙත කළ විට පාරිභෝගිකයන් සමඟ ඇති ගිවිසුම් වලින් ලැබෙන අදායම හදුනා ගැනේ. සමූහය සාමාන්‍යයෙන් නිගමනය කර ඇත්තේ එහි ආදායම් සැලසුම් වල මූලධර්මය එය බවයි. පාරිභෝගිකයාට විදුලි බලය සපයන අවස්ථාවේදී විදුලි බලය සැපයීමෙන් ආදායම නියමිත වේලාවට හදුනා ගැනේ.

සාමාන්‍යයෙන් උපකරණ ලබා දීමේදී වත්කම් පාලනය පාරිබෝගිකයා වෙත මාරු කළ විට උපකරණ විකිණීමෙන් ආදායම නියමිත වේලාවට හඳුනා ගැනේ.

කාර්‍ය සාධන වගකීම් සහ කොන්ත්‍රාත්තුවේ වෙනත් පොරොන්දු තිබේද යන්න සමූහය සලකා බලා ගිවිසුම් මිලෙහි කොටසක් වෙන්කල යුතු වේ. (උදා: වගකීම් Warranties) උපකරණ විකිණීම සඳහා ගණුදෙනු මුදල තිරණය කිරීමේදී විචල්‍යය ප්‍රතිශ්ඨාව පිළිබඳ බලපෑම් සැලකිය යුතු මූල්‍ය සංරචක වල පැවැත්ම මුදල් ගෙවන ප්‍රතිශ්ඨාව සහ පාරිභෝගිකයාට ගෙවිය යුතු ප්‍රතිශ්ඨාව (තිබේ නම්) සමූහය සලකා බලයි.

- **විචල්‍ය ප්‍රතිශ්ඨාව**

කොන්ත්‍රාත්තුවක ප්‍රතිශ්ඨාවට විචල්‍ය මුදලක් ඇතුළත් වන්නේ නම්, භාණ්ඩ හා සේවා පාරිභෝගිකයා වෙත පැවරීම සඳහා හුවමාරුවක් වශයෙන් එය සලකා බැලිය යුතු ප්‍රමාණය සමූහය ඇස්තමේන්තු කරයි. කොන්ත්‍රාත්තු ආරම්භයේ විචල්‍ය ප්‍රතිශ්ඨාව ඇස්තමේන්තු කරන අතර, විචල්‍ය ප්‍රතිශ්ඨාව සමග සම්බන්ධිත අවිනිශ්චිතතාව පසුව විසඳන වවිට හඳුනා ගෙන ඇති සමුච්චිත ආදායම ප්‍රමාණයක් සැලකිය යුතු ආදායමක් ආපසු පැවරීමක් සිදු නොවීමට ඉඩ ඇති තෙක් සීමා කර ඇත.

- **වැදගත් මූල්‍ය සංචරකය**

සැලකිය යුතු මූල්‍යකරණ සංරචකයක් කොන්ත්‍රාත්තුව ආරම්භයේදී අපේක්ෂා කරන්නේ නම් එමගින් පොරොන්දු භාණ්ඩ හා සේවා පාරිභෝගිකයාට මාරු කිරීම හා එම භාණ්ඩ හා සේවා සඳහා වර්ෂයක් හෝ ඊට අඩු වන කාල පරිච්ඡේදයක් අතර අපේක්ෂිත ප්‍රතිශ්ඨා ප්‍රමාණය සමූහය විසින් ගලපනු නොලැබේ.

**ප්‍රතිපත්තිය 2018 ජනවාරි 01ට පෙර කාලපරිච්ඡේදයට අදාළව**

සමූහයට ආර්ථික ප්‍රතිලාභ ගලාඒමේ ප්‍රමාණය මත ආදායම හඳුනා ගැනෙන අතර, ගෙවීම සිදුකළ අවස්ථාව නොතකා ආදායම විශ්වාසනීයව හඳුනාගත හැක. ලැබී තිබෙන හෝ ලැබීමට නියමිත ශුද්ධ වෙළඳ වට්ටම් හා බදු රහිත වූ ප්‍රතිශ්ඨාවේ සාධාරණ අගයට ආදායම මැනීම සිදුකරනු ලැබේ.

ආදායම හඳුනාගැනීමට පෙර පහත දැක්වෙන විශේෂිත හඳුනාගැනීමේ උපමානයන් අනුගමනය කළ යුතුය.

**(අ) භාණ්ඩ විකිණීම**

භාණ්ඩවල අයිතියට අදාළ සැලකිය යුතු අවදානම හා ප්‍රතිලාභ සාමාන්‍යයෙන් භාණ්ඩ බෙදාහැරීම මත ගැනුම්කරු වෙත සම්ප්‍රේෂණය වූ පසු භාණ්ඩ විකිණීමෙන් ලැබෙන ආදායම හඳුනා ගනු ලැබේ.

**(ආ) සේවා සැපයීම**

සේවා සැපයීම හෝ සිදුකරන ලද ගිණුම්කරණ කාලපරිච්ජේද තුළදී සේවා සැපයීමෙන් ලබන ආදායම හඳුනා ගනු ලැබේ.

**(ඇ) පොලී ආදායම**

ක්‍රමක්ෂය පිරිවැයට ගණනය කර ඇති සියලූ මූල්‍ය උපකරණ හා විකිණීමට තබා ඇති ලෙස වර්ගීකරණය කර ඇති පොලී දරන මූල්‍ය වත්කම්, පොලී ආදායම හෝ වියදම සඵල පොලී අනුපාතය (EIR), යොදා ගනිමින් වාර්තා කරනු ලැබේ. සඵල පොලී අනුපාතය යනු මූල්‍ය උපකරණයක අපේක්ෂිත ආයු කාලය හෝ කෙටි කාල පරිච්ඡේදයක් මඟින් ඇස්තමේන්තුගත ඉදිරි මුදල් ගෙවීම් හෝ ලැබීම් සඳහා මූල්‍ය වත්කමක හෝ වගකීමක ශුද්ධ ධාරණ අගය සඳහා අදාළ පරිදි වට්ටම් කෙරෙන අනුපතයයි. මූල්‍ය ආදායමේ පොළී ආදායමට ඇතුලත් කර ඇත.

**(ඈ) ලාභාංශය**

ගෙවීම ලබාගැනීම සඳහා සමූහයට තිබෙන අයිතිය ස්ථාපිත වූ පසු ආදායම හඳුනා ගැනේ.

**(ඈ) වෙනත්**

වෙනත් ආදායම උපචිත පදනම මත හඳුනාගනු ලැබේ.

**3.4 බදු අයකිරීම්**

**3.4.1 ප්‍රවර්ථන බදු**

ප්‍රවර්ථන හා ඉකුත් කාල පරිච්ඡේද සඳහා ප්‍රවර්ථන ආදායම් බදු වත්කම් සහ වගකීම් දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්වරයාගෙන් අය කිරීමට හෝ ගෙවීමට අපේක්ෂිත මුදලට ගණනය කරනු ලැබේ. සමාගම ක්‍රියාත්මක වන හා බදු ආදායම උපදවන රටෙහි පනවා ඇති හෝ වාර්තාකරණ දිනයට නිත්‍ය ලෙස පනවනු ලබන වටිනාකම ගණනය කිරීම සඳහා බදු අනුපාත හා බදු නීති යොදාගනු ලැබේ.

බදු කාර්යය සඳහා ගලපන ලද පරිදි වර්ෂය සඳහා ගිනුම්කරණ ලාභය මත පදනම්ව බදු සඳහා වෙන්කිරීම් දේශීය ආදායම් පනතේ නියමයන්ට අනුකූලව ආගයණනය කරන ලදී. ඒ සඳහා සමූහය විසින් 2006 අංක 10 දරන දේශීය ආදායම් පනත සහ එහි සංශෝධිතයන් 2018 මාර්තු 31 දක්වාත් ඉන් අනතුරුව 2018 අප්‍රේල් 01 වන දිනට සිට 2017 අංක 24 දරන දේශීය ආදායම් පනතේ විධිවිධානයන් හා එහි සංශෝධනයන්ට අනුකූලව බදු ප්‍රතිපදානය කර ඇත.

**3.4.2 විලම්බිත බදු**

බැරකම් ක්‍රමය භාවිත කරමින් වාර්තාකරණ දිනයට වත්කම් හා වගකීම්වල බදු පදනම් අතර ඇතිවන සියලු තාවකාලික වෙනස්කම් සහ මූල්‍ය වාර්තාකරණ කාර්යයන් සඳහා එහි ධාරණ අගයන් සඳහා විලම්බිත ආදායම් බදු දක්වා ඇත.

**පහත සඳහන් කරුණු හැර සියලූ තාවකාලික බදු වෙනස්කම් සඳහා විලම්භිත ආදායම් බදු වගකීම් හඳුනාගනු ලැබේ.**

i) ව්‍යාපාර සම්බන්ධතාවයක් නොවන ගනුදෙනුවකදී වත්කමක හෝ වගකීමක මූලික හඳුනාගැනීමෙන් පැන නගින විලම්භිත ආදායම් බදු සහ ගනුදෙනුව සිදුවන අවස්ථාවේදී ගිණුම්කරණ ලාභයට හෝ බදු අය කළ හැකි ලාභයට හෝ පාඩුවට බලපෑමක් නොවන විට.

ii) පරිපාලිත, ආශ්‍රිත සමාගම්වල හා බද්ධ ව්‍යාපාරවල අයිතීන්වල ආයෝජන තුළින් ඇතිවන තාවකාලික වෙනස්කම් පිළිබඳව සලකා බැලීමේදී ප්‍රතිවර්තනය කළ නියම කිරීම් හැර අනෙකුත් තාවකාලික වෙනස්වීම් පාලනය කළ හැකි අතර අනාගතයේදී ප්‍රතිවර්තනය කළ නොහැක.

සියලු අඩුකළ හැකි තාවකාලික වෙනස්කම් භාවිතා නො කළ බදු බැර හා භාවිතා නො කළ බදු පාඩු සඳහා යම්තාක් දුරකට විලම්බිත ආදායම් බදු වත්කම් හඳුනා ගනී. අඩුකළ හැකි තාවකාලික වෙනස්කම් වලට එරෙහිව බදු අය කළ යුතු ලාභ තිබිය හැකි අතර ඉදිරියට ගෙන යන භාවිතා නො කළ බදු බැර හා භාවිතා නො කළ බදු පාඩු පහත කරුණු හැර තිබිය හැකිය.

i) ව්‍යාපාර සංයෝජනයක් නො වන සහ ගනුදෙනුව සිදුවන අවස්ථාවේදී ගිනුම්කරණ ලාභයට හෝ බදු අයකළ හැකි ලාභයට හෝ පාඩුවට බල නො පාන ගනුදෙනුවකදී වත්කමක හෝ වගකීමක ආරම්භක හඳුනා ගැනීමෙන් පැන නගින අඩු කළ හැකි තාවකාලික වෙනස්කමට අදාළ විලම්බිත ආදායම් බදු වත්කමක් ඇති විට,

ii) පරිපාලිත, ආශ්‍රිත සමාගම්වල ආයෝජන, බද්ධ ව්‍යාපාරවල පොලී, විලම්බිත බදු වත්කම් සම්බන්ධිත අඩු කළ හැකි තාවකාලික වෙනස්කම්වලට අදාළව අනාගතයේදී ප්‍රතිවර්තනය වන තාවකාලික වෙනස්කම් සහ උපයෝජනය කළ හැකි තාවකාලික වෙනස්කම් වලට එරෙහි බදු අය කළ හැකි ලාභ පමණක් යම්දුරකට හඳුනා ගැනේ.

විලම්බිත බදු වත්කම්වල ධාරණ අගයන් එක් එක් වාර්තාකරණ දිනයට සමාලෝචනය කරන විලම්භිත බදු සියල්ල හෝ ඉන් කොටසක් උපයෝගි කර ගැනීමට සෑහෙන තරම් බදු අයකරගත හැකි නොවන පමණට අඩු කරනු ලබයි.

එක් එක් වාර්තාකරණ දිනයට හඳුනා නොගත් විලම්බිත බදු වත්කම් යළි තක්සේරු කරන අතර අය කළ යුතු විලම්භිත බදු වත්කම් සඳහා ඉඩදෙන අනාගත බදු අයකළ හැකි ලාභ බවට යම්තාක් දුරකට හඳුනා ගැනේ.

විලම්බිත බදු වත්කම් හා වගකීම් මනිනු ලබන්නේ බදු වත්කම් උපලබ්ධි වන හෝ බදු බැරකම් නිරවුල් කරනු ලබන අවස්ථාවන්හීදි හෝ වාර්තා කරන දිනය ක්‍රියාත්මක වන හෝ පසුකාලීනව පනවනු ලබන බදු අනුපාතිකයන් (සහ බදු නීති) අනුව වේ.

වෙනත් විස්තීර්ණ ආදායමේ හෝ සෘජුවම ස්කන්ධයේ පාදක වූ සම්බන්ධිත ගනුදෙනුව සඳහා වූ විෂයන්ට අදාළව විලම්බිත බදු හඳුනා ගනී.

විලම්බිත බදු වත්කම් හා වගකීම් හිලව් කෙරෙනුයේ, විලම්බිත බදු වත්කම් විලම්බිත බදු වගකීම්වලට එරෙහිව විලම්බිත බදු වත්කම් හිලව් කිරීමට නීතිමය වශයෙන් බලාත්මක වූ අයිතියක් ඇත්තේ වී නම් හා විලම්බිත බදු එකම බදු අය කළ හැකි ආයතනයක් සම්බන්ධයෙන් වනවිට හා සමාන බදු අධිකාරියක් ඇති විටය.

### 3.5 දේපල, පිරියත හා උපකරණ

දේපල, පිරියත හා උපකරණ යනු නිෂ්පාදනය හෝ සේවා සැපයීම සඳහා භාවිතයට ගන්නා  වෙනත් අයට කුලියට ලබාදෙන හෝ පරිපාලන කටයුතුවලට යොදාගන්නා එක් කාල පරිච්ඡේදයකට වැඩි වාර ගණනක් භාවිත කිරීමට අපේක්ෂිත ස්පෘශ්‍ය විෂයන්ය. මෙම වත්කම් පිළිබඳ ගිණුම්කරණය සඳහා ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවල ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 16 (දේපළ, පිරියත හා උපකරණ) නියමයන් සමූහය විසින් යොදාගනු ලැබේ.

#### 3.5.1 හඳුනාගැනීම

වත්කම් සම්බන්ධිත අනාගත ආර්ථික ප්‍රතිලාභ සමූහයට ගලා ඒ නම් හා වත්කම්වල පිරිවැය විශ්වාසනීයව ගණනය කළ හැකි වේ නම් දේපල, පිරියත හා උපකරණ හඳුනාගනු ලැබේ.

#### 3.5.2 මිනුම්කරණය

වත්කමක් ලෙස හඳුනාගැනීමට සුදුසු වන දේපල, පිරියත හා උපකරණ විෂයයක් මූලිකව පිරිවැයට ගණනය කෙරේ. වත්කම අත්පත් කරගැනීමේදි සෘජුවම ආරෝපණය කළ හැකි වියදම පිරිවැයට ඇතුළත් වන අතර පසුව දේපල, පිරියත හා උපකරණ විෂයයක කොටසක් ආදේශ කිරීම සඳහා එයට එකතු කරන විට දරන ලද පිරිවැයද ඇතුළත් වේ. ස්වයං ඉදිකිරීම්වල වත්කම්වල පිරිවැය තුළ ද්‍රව්‍ය පිරිවැය හා සෘජු ශ්‍රමය හා වෙනත් පිරිවැය සහ වත්කම්, අරමුණු කළ භාවිත කිරීමේ තත්ත්වයට ගෙන ඒම සඳහා සෘජුවම ආරෝපණය කළ හැකි වෙනත් යම්කිසි පිරිවැය, වත්කමක් කඩා දැමීම හා විෂයයන් ඉවත් කිරීමේ පිරිවැය හා ඒවා ස්ථාන ගතවන ස්ථානයන්ට ප්‍රතිස්ථාපනය කිරීමේ පිරිවැයද ඇතුළත් වේ. අදාළ උපකරණවල ක්‍රියාකාරීත්වය සඳහා කොටසක් වන මිලදී ගත් මෘදුකාංග පරිගණක උපකරණයේ කොටසක් ලෙස ප්‍රාග්ධනිත කෙරේ.

දේපලක හෝ උපකරණ විෂයයක කොටස්වල වෙනස් ප්‍රයෝජනවත් ජීව කාලයක් ඇතිවිට, දේපල, පිරියත හා උපකරණවල වෙනත් විෂයයන් ලෙස (ප්‍රධාන සංරචක) ගිණුම්ගත කෙරේ.

##### 3.5.2.1 පිරිවැය ආකෘතිය

සමූහය විසින් සින්නක්කර ඉඩම් හා ගොඩනැගිලි හැර දේපල, පිරියත හා උපකරණ සඳහා පිරිවැය ආකෘතිය යොදා ගෙන ඇත. එවැනි දේපල සමුච්චිත ක්ෂය හා ඕනෑම හානිකරණ පාඩුවක් අඩුකළ ඕනෑම අනුෂාංගික වියදමක් සහිත මිලදී ගැනීම් හෝ ඉදිකිරීම් පිරිවැයට වාර්තා කරනු ලැබේ.

##### 3.5.2.2 ප්‍රත්‍යාගණන ආකෘතිය

සින්නක්කර ඉඩම් හා ගොඩනැගිලිවල සමස්ත පන්තිය සඳහාම ප්‍රත්‍යාගණන ආකෘතිය සමූහය විසින් යොදා ගනු ලැබේ. ඕනෑම පසු සමුච්චිත ක්ෂය සහ පසු සමුච්චිත හානිකරණ පාඩු අඩු කරන ලද ප්‍රත්‍යාගණන දිනයට ඒවායේ සාධාරණ අගය වශයෙන් එම දේපළ ධාරණය කරනු ලැබේ. ධාරණ අගයන් වාර්තාකරණ දිනයට සාධාරණ අගයෙන් ප්‍රමාණාත්මකව වෙනස් නොවන බවට තහවුරු කරගැනීම සඳහා සමූහයේ සින්නක්කර ඉඩම් ගොඩනැගිලි වර්ෂ 03 කට වරක් ප්‍රත්‍යාගණනය කරනු ලැබේ. වත්කමක් ප්‍රත්‍යාගණනයේදි ධාරණ අගයේ ඇති ඕනෑම වැඩිවීමත් වෙනත් විස්තීර්ණ ආදායමේ හඳුනාගන්නා අතර ප්‍රාග්ධන සංචිතය යටතේ ස්කන්ධයේ සමුච්චිත වේ නැතහොත් ලාභ හෝ පාඩු සඳහා අය කෙරෙන එම වත්කමට අදාළව පෙර ප්‍රත්‍යාගණන අඩුවීමක් ප්‍රතිවර්තනය සඳහා යොදා ගැනේ. මෙහිදි පෙර ලියා හැරීම් යම් දුරක් සඳහා ආදායම ලෙස අඩුවීම හඳුනා ගැනේ.

ධාරණ අගයේ ඕනෑම අඩුවීමක් ලාභ හෝ පාඩු සඳහා වියදමක් ලෙස හඳුනා ගැනේ නැතහොත් එම වත්කමට අදාළ ප්‍රාග්ධන සංචිතයේ පවත්නා ඕනෑම බැර ශේෂයක් සඳහා යම් දුරකට වෙනත් විස්තීර්ණ ආදායමේ හර කරනු ලැබේ. වෙනත් විස්තීර්ණ ආදායමේ හඳුනාගන්නා ලද අඩුවීම ප්‍රාග්ධන සංචිත යටතේ හිමිකම්වල සමුච්චිත ප්‍රමාණය අඩු කරයි. වත්කමක් සම්බන්ධයෙන් ප්‍රත්‍යාගණන සංචිතයේ ඉතිරි වන ඕනෑම ශේෂයක් වත්කමෙන් ඉවත් වීම හෝ අපහරණය මත රඳවාගත් ඉපැයුම් සඳහා සෘජුවම මාරු කෙරේ.

### 3.5.3 පසුව සිදුවන පිරිවැය

දේපලක, පිරියතක හා උපකරණ විෂයයක කොටසක් ප්‍රතිස්ථාපනය කිරීමේ පසුව සිදුවන පිරිවැය එහි ඇති අනාගත ආර්ථික ප්‍රතිලාභ සමූහයට අත්වීමට ඇති හැකියාව මත එහි පිරිවැය විශ්වාසනීය ලෙස මැනීම මත එම විෂයයේ ධාරණ අගයට හඳුනා ගැනේ. දේපල, පිරියත හා උපකරණවල එදිනෙදා සේවා කටයුතුවල පිරිවැය දරන ලද පරිදි ලාභ හෝ පාඩුවලට අය කෙරේ.

### 3.5.4 හඳුනාගත් වත්කම් පොත්වලින් ඉවත් කිරීම (De-recognition)

දේපල, පිරියත හා උපකරණ විෂයයක ධාරණ අගය බැහැර කිරීමේදී හෝ එහි යොදාගැනීමෙන් අනාගත ආර්ථික ප්‍රතිලාභ නොමැති වීම මත පොත්වලින් ඉවත් කෙරේ. දේපල, පිරියත හා උපකරණ විෂයයක පොත්වලින් ඉවත් කිරීමේදි පැන නගින ලාභය හෝ පාඩුව එම විෂයය පොත්වලින් ඉවත් කිරීමේදි ලාභ හෝ පාඩුවලට ඇතුළත් කෙරේ.

දේපල, පිරියත හා උපකරණ විෂයයකදි ධාරණ අගයේදි ආදේශන පිරිවැය හඳුනා ගැනීමේදි ආදේශනය කරන කොටසේ ඉතිරි වන ධාරණ මුදල පොත්වලින් ඉවත් කෙරේ. ප්‍රධාන පරීක්ෂණ පිරිවැය ප්‍රාග්ධනිත කෙරේ. එවැනි එක් එක් ප්‍රාග්ධනිතයකදි පරීක්ෂණවල පූර්ව පිරිවැයේ ඉතිරි ධාරණ මුදල ඉවත් කෙරේ.

### 3.5.5 ක්ෂය කිරීම

වත්කම් භාවිතයට ගත් දිනයේ සිට බැහැර කරන දිනය දක්වා ක්ෂයවීම සඳහා සමූහය විසින් ලබාගැනීමට අපේක්ෂිත වත්කමේ අනාගත ආර්ථික ප්‍රතිලාභවල ආකාරය මත පදනම් වූ ඇස්තමේන්තුගත ප්‍රයෝජනවත් ජීව කාලයට අදාල වන කාල පරිච්ඡේදයන් සඳහා සරල මාර්ග ක්‍රමය මත පදනම් වූ පහත සඳහන් අනුපාතයන්ට සමූහය විසින් ක්ෂය සඳහා ප්‍රතිපාදනය කිරීමට අපේක්ෂා කෙරේ. ඉඩම් සඳහා ක්ෂය ප්‍රතිපාදනය නොකෙරේ.

විකිණීම සඳහා තබා ඇති ලෙස වර්ගීකරණය කර ඇති හෝ වත්කම බවත් කරන දිනට වත්කමක ක්ෂය වීම් නියමිත දිනට පෙර අවසන් වේ. වත්කම සම්පූර්ණයෙන් ක්ෂය නොවන්නේ නම් වත්කම නිෂ්කාර්ය හෝ සක්‍රීය භාවිතයෙන් තොර වන විට ක්ෂය වීම අවසන් නොවේ.

සමූහය විසින් භාත කරන ලද ප්‍රධාන වාර්ෂික ක්ෂය අනුපාතයන් පහත පරිදි වේ.

| | |
|---|---|
| ගොඩනැගිලි | 2.5% |
| **යටිතල පහසුකම් සැපයීම** | |
| උපපොළවල්, උඩු රැහැන් සහ පළාත් පාලන ආයතන හා ලංකා විදුලි බලමණ්ඩලයෙන් ලබාගන්නා ලද සේවා රැහැන් | 10% |
| උපපොළවල්, උඩු රැහැන් සහ ලංවිස විසින් ඉදිකරන ලද සේවා රැහැන් | 4%-5% |
| මෝටර් වාහන | 5% - 20% |
| පරිගණක | 20% - 33 - 1/3% |
| කාර්යාල උපකරණ | 15% - 33 - 1/3% |
| පිරියත හා යන්ත්‍රෝපකරණ | 25% - 33 - 1/3% |

### 3.6 කල් බදු

සැලැස්මක් තිබීම හෝ ඇතුළත් කිරීම අවශ්‍ය වන්නේ දැයි තීරණය කිරීම සැලැස්ම ආරම්භක දිනයට තත්ත්වය මත කල් බදු තීරණය වේ. විශේෂිත වත්කමක් හෝ වත්කම් හෝ සැලසුමක් විශේෂිතව සඳහන් නොවන හිමිකමක් ඇති වුවද වත්කම භාවිතා කිරීමට හිමිකමක් දක්වන සැලසුම අනුව සැලසුම තක්සේරු නොවේ.

#### 3.6.1 මෙහෙයුම් කල්බදු

මෙහෙයුම් කල්බදු ගෙවීම් කල්බදු කාලය තුළ සරල රේඛීය පදනමින් ආදායම් ප්‍රකාශයෙහි මෙහෙයුම් වියදමක් ලෙස හඳුනා ගැනේ.

### 3.7 ආයෝජන දේපල

සමූහය විසින් ආයෝජන දේපල ලෙස ගිණුම්ගත කරන්නේ නිෂ්පාදනය හෝ භාණ්ඩ හා සේවා සැපයීම හෝ පරිපාලන කාර්යයන් සඳහා හෝ සාමාන්‍ය ව්‍යාපාරයේදී විකිණීම සඳහා හෝ යන අරමුණු වලට වැඩියෙන් කුලී ඉපැයීම් සඳහා හෝ ප්‍රාග්ධනය වැඩි කර ගැනීම සඳහා හෝ ඒ දෙකම සඳහා වන දේපලකි. ආයෝජන දේපල සින්නක්කර ඉඩම් හා ගොඩනැඟිලි වලින් සමන්විත වේ.

මුලිකව ආයෝජන දේපලක් පිරිවැයට ගණනය කරනු ලැබේ. මිලදී ගත් ආයෝජන දේපලක පිරිවැය, එහි මිලදී ගැනුම් වටිනාකම හා වෙනත් සෘජු ආරෝපණය කළ හැකි වියදම් වලින් සමන්විත වේ. ස්වයං ඉදිකිරීම් ආයෝජන දේපලක පිරිවැය ඉදිකිරීම හෝ සංවර්ධනය නිමකළ අවස්ථාවේ එදිනට පිරිවැය වේ.

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත (ශ්‍රීලංගිප්‍ර 40) "ආයෝජන දේපල" ප්‍රමිතියට අනුකූලව ආයෝජන දේපල සඳහා පිරිවැය ක්‍රමය සමූහය යොදා ගනී. ඒ අනුව කිසියම් සමුච්චිත හානිකරණ පාඩුවක් අඩුකර ආයෝජන දේපල ලෙස ඉඩම වර්ගීකරණය කරන අතර ගොඩනැඟිලි කිසියම් සමුච්චිත ක්ෂය හා කිසියම් හානිකරණ පාඩු අඩුකළ පිරිවැයට ආයෝජන දේපල ලෙස වර්ගීකරණය කරනු ලැබේ.

#### 3.7.1 ක්ෂය කිරීම

ආයෝජන දේපල ලෙස සලකන ඉඩම් මත ක්ෂය කිරීම් කරනු නොලැබේ.

සමූහයේ වෙනත් ආයෝජන මත ක්ෂය කිරීම සංගත පදනමකින් ප්‍රතිපාදනය කරනු ලැබේ. එය වත්කම්වල ඇස්තමේන්තුගත ප්‍රයෝජනවත් ජීව කාලය අදාළ වන කාල පරිච්ඡේදය සඳහා සරල මාර්ග ක්‍රමය යොදා ගනිමින් සිදුකෙරේ.

ගොඩනැඟිලි වර්ෂ 40

ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශනවල දේපල එනම් සමූහය ඇතුළත සමාගම් විසින් නිෂ්පාදනය හෝ භාණ්ඩ හා සේවා සැපයුම් සඳහා හෝ පරිපාලන කටයුතු සඳහා පරිහරණය කරන ලද දේපල, දේපල පිරියත හා උපකරණ ලෙස සලකනු ලැබේ. මේ අතර වත්කම් අයිතිවන සමාගමේ මූල්‍ය ප්‍රකාශනවල මෙම දේපල ආයෝජන දේපල ලෙස සලකනු ලැබේ.

### 3.8 ණයගැනීම් පිරිවැය

වත්කම අත්කර ගැනීම, ඉදිකිරීම හෝ නිෂ්පාදනය කිරීම සඳහා සෘජුවම ණය ගැනීම් පිරිවැය හඳුනාගත හැකිය. එය අරමුණු කළ භාවිතය හො විකණීම සඳහා සුදානම්වීමට ප්‍රමාණවත් කාලයක් අවශ්‍යයෙන්ම ගත යුතු වන අතර අදාළ වත්කම් වල පිරිවැයේ කොටසක් ලෙස ප්‍රාග්ධනිත කෙරේ. අනිකුත් සියලු ණය ගැනිම් පිරිවැය ඒවා සිදුවන කාල පරිච්ඡේදයේදීම වැය කෙරේ. අරමුදල් ණයට ගැනිම සම්බන්ධයෙන් අස්තිත්වයක් දරන පොලිය හා වෙනත් පිරිවැය වලින් ණය ගැනීම් පිරිවැය සමන්විත වේ.

### 3.9 අස්පෘශ්‍ය වත්කම්

අස්පෘශ්‍ය වත්කම් මුදල් නොවන වත්කමක් ලෙස හඳුනාගත හැකි වත්කමකි. වෙනත් අයට කුලියටදීම සඳහා හෝ පරිපාලන කටයුතු සඳහා හෝ නොවන එම වත්කම් නිෂ්පාදනයේදී හෝ භාණ්ඩ හා සේවා සැපයුමේදී භෞතිකව නොපවතී.

වෙනම අත්කර ගන්නා අස්පෘශ්‍ය වත්කම් ආරම්භක හඳුනා ගැනීමේදී පිරිවැයට ගණනය කරනු ලැබේ. අත්කර ගන්නා දිනයට පවත්නා සාධාරණ අගයට අස්පෘශ්‍ය වත්කම්වල පිරිවැය ව්‍යාපාර සංයෝජනයකදී අත් කරගනු ලැබේ. ආරම්භක හඳුනාගැනීම අනුගමනය කරමින් සමුච්චිත ක්‍රමක්ෂය හා සමුච්චිත හානිකරණ පාඩු අඩුකළ පිරිවැයට අස්පෘශ්‍ය වත්කම් පිරිවැයට ඉදිරියට ගෙන යනු ලැබේ. ප්‍රාග්ධනිත සංවර්ධන පිරිවැය අන්තර්ගත නොවී අභ්‍යන්තරිකව ජනනය කරන ලද අස්පෘශ්‍ය වත්කම් තිබේ නම් ඒවා ප්‍රාග්ධනිත නොකරන අතර වියදම් දරන ලද වර්ෂයේ ලාභ හෝ පාඩු වල වියදම නිරූපනය වේ.

අස්පෘශ්‍ය වත්කම් වල ප්‍රයෝජනවත් ජීව කාලය සීමිත හො අසීමිත ලෙස තක්සේරු කරනු ලැබේ.

සීමිත ජීවකාලයක් ඇති අස්පෘශ්‍ය වත්කම් ඒවායේ ප්‍රයෝජනවත් ආර්ථික ජීව කාලය තුළ ක්‍රමක්ෂය කරනු ලබන අතර අස්පෘශ්‍ය වත්කම හානිකරණය වේ යැයි ඇඟවීමක් තිබේ නම් එය හානිකරණය සඳහා තක්සේරු කරනු ලැබේ. සීමිත ප්‍රයෝජනවත් ජීව කාලයක් සහිත අස්පෘශ්‍ය වත්කමක් සඳහා ක්‍රමක්ෂය කාල පරිච්ඡේදය හා ක්‍රමක්ෂය ක්‍රමවේදය අවම වශයෙන් එක් එක් වාර්තාකරණ කාල පරිච්ඡේදය අවසානයට සමාලෝචනය කරනු ලැබේ. අපේක්ෂිත ප්‍රයෝජනවත් ජීව කාලය පිළිබඳ වෙනස්කම් හෝ වත්කමේ අන්තර්ගත අනාගත ආර්ථික ප්‍රතිලාභ පරිභෝජනයේ අපේක්ෂිත ආකාරය අදාළ පරිදි ක්‍රමක්ෂය කාල පරිච්ඡේදය හෝ ක්‍රමය වෙනස් කිරීම මඟින් ගිණුම්ගත කරනු ලැබේ. එසේම ගිණුම්කරණ ඇස්තමේන්තුවල වෙනස් කිරීම් ලෙස සලකනු ලැබේ. සීමිත ජීව කාලයක් සහිත අස්පෘශ්‍ය වත්කම් පිළිබඳ ක්‍රමක්ෂය වියදම, අස්පෘශ්‍ය වත්කම් කාර්යය සහිත වියදම් වර්ගයේ සංයුක්ත ලාභ හෝ පාඩුවල හඳුනා ගනු ලැබේ.

අසීමිත ප්‍රයෝජනවත් ජීවකාලයක් සහිත අස්පෘශ්‍ය වත්කම් ක්‍රමක්ෂය කරනු නොලැබේ. එහෙත් තනි තනිව හෝ මුදල් උපදවන ඒකක මට්ටමින් වාර්ෂිකව හානිකරණය සඳහා පරීක්ෂා කරනු ලැබේ. අසීමිත ජීව කාලයට සහයෝගය සඳහා අඛණ්ඩව පවතින්නේද යන්න තීරණය කිරීම සඳහා අසීමිත ජීව කාලය පිළිබඳ තක්සේරුව වාර්ෂිකව සමාලෝචනය කරනු ලැබේ. එසේ නොවේ නම්, ප්‍රයෝනවත් ජීව කාලය අසීමිත සිට සීමිත දක්වා වෙනස්වීම සාර්ථක පදනමකින් සිදුකරනු ලැබේ.

අස්පෘශ්‍ය වත්කමක නොපැළිගැනීම මත පැන නගින වාසි හෝ පාඩු ශුද්ධ බැහැර කරන මුදල හා වත්කමක ධාරණ මුදල අතර වෙනස ලෙස ගණනය කරනු ලබන අතර වත්කම ඉවත් කරන අවස්ථාවේදී එය ලාභ හෝ පාඩුවල හඳුනා ගැනේ.

### 3.10 වෙළඳ තොග

අඩුම පිරිවැයට හා ශුද්ධ උපලබ්ධි අගයට තොග වටිනාකම ගණනය කරනු ලැබේ.
එක් එක් නිෂ්පාදිතය වර්තමාන ස්ථානයට හා තත්ත්වයට ගෙන ඒමේදී දරන ලද පිරිවැය පහත පරිදි ගණනය කරනු ලැබේ.

- මෙහෙයුම් හා නඩත්තු භාණ්ඩ  බර තැබූ සාමාන්‍ය පදනම මත තථ්‍ය පිරිවැයට
- මාර්ගස්ථ බඩු හා වෙනත් තොග  තථ්‍ය පිරිවැයට

සාමාන්‍ය ව්‍යාපාරවලදී ඇස්තමේන්තු ගත නිම කිරීම් පිරිවැය හා ඇස්තමේන්තු ගත විකුණුම් පිරිවැය අඩුකළ ශුද්ධ උපලබ්ධි වටිනාකම ඇස්තමේන්තු ගත විකුණුම් මිල වේ.

### 3.11 මූල්‍ය උපකරණ

#### 3.11.1 මූල්‍ය වත්කම්

***මෙම ප්‍රතිපත්තිය 2018 ජනවාරි 01 සිට අදාළ වේ.***

##### 3.11.1.1 මූල්‍ය වත්කම්වල වර්ගීකරණය හා පසුකාලීන මිනුම්කරණය

මූලික හඳුනාගැනීමේදී මූල්‍ය වත්කමක් වර්ගීකරණය හා මිනුම්කරණය කරන්නේ; ක්‍රමක්ෂය පිරිවැය වෙනත් විස්තීර්ණ ආදායම තුළින් සාධාරණ අගය (Fair Value through other comprehensive income) (FVOCI) ණය ආයෝජන; වෙනත් විස්තීර්ණ ආදායම තුළින් සාධාරණ අගය (FVOCI) හිමිකම් ආයෝජන; හෝ ලාභ හෝ පාඩු තුළින් සාධාරණ අගය (FVTPL) ලෙසය.

ව්‍යාපාර ආකෘතියේ වෙනස්වීමෙන් පසු වාර්තා වූ පළමු කාලපරිච්ඡේදයේ පළමු දිනයේදී බලපෑමට ලක් වූ සියලුම මූල්‍ය වත්කම් නැවත වර්ගීකරණය කරනු ලැබුවහොත්, මූල්‍ය වත්කම් කළමනාකරනය සඳහා සමාගම/සමූහය තම ව්‍යාපාර ආකෘතිය හැර මූල්‍ය වත්කම් ඔවුන්ගේ මූලික පිළිගැනීමෙන් පසුව නැවත වර්ගීකරණය නොකෙරේ.

මූල්‍ය වත්කමක් පහත සඳහන් කොන්දේසි දෙකටම සරිලන ලෙස ලාභ හෝ පාඩු තුළින් සාධාරණ වටිනාකමට (FVTPL) නම් නොකෙරේ නම් මූල්‍ය වත්කම ක්‍රමක්ෂය පිරිවැය අනුව මනිනු ලැබේ.

- ගිවිසුම්ගත මුදල් ප්‍රවාහ එකතු කිරීම සඳහා වත්කම් තබා ගැනීම අරමුණු කරගත් ව්‍යාපාර ආකෘතියක් තුළ එය පවත්වනු ලැබේ.
- එහි ගිවිසුම්ගත කොන්දේසි මගින් නිශ්චිත දිනයන්හි මුදල් ප්‍රවාහයන් සඳහා ප්‍රධාන මුදල් සඳහා ගෙවීම් සහ හිඟ මුදල සඳහා පොලිය ගෙවනු ලැබේ.

වර්ගීකරණය කරන ලද හා ක්‍රමක්ෂය පිරිවැයට මනින ලද මූල්‍ය වත්කම් එහි වෙළඳ ණයගැනියන්ට, සම්බන්ධිත පාර්ශවයන්ගෙන් ලැබිය යුතු ශේෂ කෙටිකාලීන ආයෝජන වලට හා මුදල් හා මුදල් සමාන ශේෂ වලට සීමා වේ.

ණය ආයෝජනයක් පහත සඳහන් කොන්දේසි දෙකටම සරිලන ලෙස ලාභය හෝ අලාභය තුළින් සාධාරණ වටිනාකම (FVTPL) ලෙසට නම් නො කෙරේ නම් ණය ආයෝජනය වෙනත් විස්තීර්ණ ආදායම තුළින් සාධාරණ අගයට (FVOCI) මනිනු ලැබේ.

- එහි ගිවිසුම්ගත මුදල් ප්‍රවාහ එකතු කිරීම හා මූල්‍ය වත්කම් විකිණීම යන දෙකින්ම අරමුණ ඉටු කර ගත් ව්‍යාපාරික ආකෘතියක් තුළ එය පවත්වනු ලබයි. සහ,
- එහි ගිවිසුම්ගත කොන්දේසි මගින් නිශ්චිත දිනයන්හි මුදල් ප්‍රවාහයන් සඳහා ඒවා මූලික ගෙවීම් සහ ප්‍රධාන මුදල සඳහා හිඟ පොලිය ගෙවනු ලැබේ.

වෙළඳාම් කිරීම සඳහා නොපවත්වන හිමිකම් ආයෝජනය මූලික පිළිගැනීම මත, වෙනත් විස්තීර්ණ ආදායමහි (OCI) ආයෝජනවල සාධාරණ වටිනාකම් පසුකාලීන වෙනස්කම් ඉදිරිපත් කිරීමට සමාගමට/සමූහයට ආපසු හැරවිය නොහැකි ලෙස තෝරා ගත හැකිය. මෙම තෝරාගැනීම ආයෝජනයෙන් ආයෝජනයට වෙන වෙනම සිදු කළ යුතුය.

ඉහත විස්තර කර ඇති පරිදි ක්‍රමක්ෂය පිරිවැයෙන් හෝ වෙනත් විස්තීරණ ආදායම තුළින් සාධාරණ අගයෙන් මනිනු ලබන වර්ගීකරණය නොකරන ලද සියලුම මූල්‍ය වත්කම් වෙනත් ලාභ හෝ පාඩු ප්‍රකාශනය (FVTPL) තුළින් සාධාරණ අගයට මනිනු ලැබේ. මෙය සියලු ව්‍යුත්පන්න මූල්‍ය වත්කම්වල ඇතුළත් වේ. මූලික හඳුනාගැනීම මත, සමාගම විසින් ආපසු හැරවිය නොහැකි ලෙස මූල්‍ය වත්කමක් නම් කළ හැකි අතර එය වෙනත් ආකාරයකින් ක්‍රමක්ෂය කළ පිරිවැයකින් හෝ ලාභ හෝ පාඩු තුළින් සාධරණ අගයෙහි මෙන් වෙනත් විස්තීර්ණ ආදායම තුළින් සාධාරණ අගයෙහි මැනිය යුතුය. එසේ කිරීමෙන් වෙනත් ආකාරකින් පැන නගින ගිනුම්කරණ නොගැලපීම ඉවත් කරයි හෝ සැලකිය යුතු ලෙස අඩු කරයි.

හිමිකම් ආයෝජනවල සමාගමේ ආයෝජන වෙනත් විස්තීර්ණ ආදායම තුළින් සාධාරණ අගයට වර්ගීකරණය කෙරේ.

**මූල්‍ය වත්කම් - ව්‍යාපාර ආකෘති තක්සේරුව**

සමාගම/සමූහය විසින් මූල්‍ය වත්කමක් ව්‍යාපාර කලසක් (Portfolio) මට්ටමින් පවත්වාගෙන යනු ලබන අවස්ථාවක ව්‍යාපාර ආකෘතියේ මොඩලයෙන් තක්සේරු කරයි. එනම් මෙය ව්‍යාපාරය කළමනාකරණය කරන ආකාරය සහ කළමනාකරණයට තොරතුරු සපයන වඩාත් හොඳින් පිළිබිඹු කරන හෙයිනි. සලකා බලන ලද තොරතුරු පහත ඇතුළත් වේ.

- ව්‍යාපාර කළඹ සඳහා ප්‍රකාශිත ප්‍රතිපත්ති හා අරමුණු සහ ප්‍රායෝගිකව එම ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම කළමනාකරණ උපායමාර්ගය කොන්ත්‍රාත් පොලී ආදායම උපයා ගැනීම, විශේෂිත පොලී අනුපාත පැතිකඩක් පවත්වා ගෙනයාම, මූල්‍ය වත්කම්වල කාල සීමාව හා සම්බන්ද ඕනෑම වගකීම් කාලයකට ගැලපීම හෝ වත්කම් විකිණීමෙන් අපේක්ෂිත මුදල් ප්‍රවාහ හෝ උපලබ්ධිවන මුදල් ප්‍රවාහ පිළිබඳ යොමු වන්නේද යන්න මෙහි ඇතුළත්ය.
- කලසෙහි කාර්යසාධනය ඇගයීම් කරන්නේ හා සමාගමේ/සමූහයේ කළමනාකරණයට වාර්තා කරනේ කෙසේද යන්න;
- ව්‍යාපාර ආකෘතියේ කාර්ය සාධනයට බලපාන අවදානම් (සහ එම ව්‍යාපාරය ඇතුළත පවතින මූල්‍ය වත්කම්) සහ එම අවදානම් කළමනාකරණය කෙරෙන්නේ කෙසේද යන්න;
- ව්‍යාපාරයේ කළමනාකරුවන් ප්‍රතිපූරණය වන්නේ කෙසේද උදා: කළමනාකරණය කෙරෙන වත්කම්වල සාධාරණ අගය මත ප්‍රතිපූරණය පදනම්වේද හෝ ගිවිසුම්ගත මුදල් ප්‍රවාහ එකතු කෙරේද; සහ
- ඉකුත් කාල පරිච්ඡේදවල මූල්‍ය වත්කම් විකුණුම්වල වාර ප්‍රමාණය හා කාලය, එම විකුණුම්වලට හේතු සහ අනාගත විකුණුම් කාර්යයන් පිළිබඳ අපේක්ෂාවන්.

ඉවත් කිරීම සඳහා සුදුසුකකම් නොලබන ගනුදෙනුවල තුන්වන පාර්ශවයන් සඳහා මාරු කරන ලද මූල්‍ය වත්කම් මෙම කාර්යය සඳහා විකුණුම් ලෙස සලකනු නොලබන අතර වත්කම් පිළිබඳ සමාගමේ/ සමූහයේ අඛණ්ඩ හඳුනා ගැනීමට අනුකූල විය යුතුය.

වෙළඳාම සඳහා පවතින හෝ කළමනාකරණය කෙරෙන මූල්‍ය වත්කම් හා සාධාරණ අගය පදනම්ව එහි කාර්යය සාධනය ඇගයීම් කිරීම ලාභ හෝ පාඩු ප්‍රකාශනය තුළින් සාධාරණ අගයට (FVTPL) මනිනු ලැබේ.

**මූල්‍ය වත්කම් - ගිවිසුම්ගත මුදල් ප්‍රවාහයන් මෙම තක්සේරුකරණයේ අරමුණු තනිකරම මූලික මුදල හා පොලිය ගෙවීමක්ද යන්න තක්සේරු කිරීම**

මූලික හඳුනාගැනීම මත මූල්‍ය වත්කමේ සාධාරණ අගය ලෙස 'මූලික මුදල' නිර්වචනය කරනු ලැබේ. පොලිය නිර්වචනය වන්නේ, මුදල්වල කාල වටිනාකම සහ න්ශ්චිත කාල සීමාවන් තුළ ගෙවිය යුතු මූලික හිඟ මුදල හා සම්බන්ධ ණය අවදානම සඳහා සහ වෙනත් මූලික ණය අවදානම් හා පිරිවැය (උදා: ද්‍රවශීලතා අවදානමසහ පරිපාලන පිරිවැය) මෙන්ම ලාභ ආන්තිකය සඳහා සලකා බැලීම ලෙසය. ගිවිසුම්ගත මුදල් ප්‍රවාහයන් තනිකරම මූලික මුදල හා පොලිය ගෙවීමද යන්න තක්සේරු කිරීමේදී, සමාගම/සමූහය උපකරණයේ ගිවිසුම්ගත කොන්දේසි සලකා බලයි. මූල්‍ය වත්කමෙහි මෙම කොන්දේසිය සපුරාලිය නොහැකි වන පරිදි ගිවිසුම්ගත මුදල් ප්‍රවාහයේ කාලය හෝ ප්‍රමාණය වෙනස් කළ හැකි ගිවිසුම්ගත කොන්දේසියක් තිබේද යන්න තක්සේරු කිරීම මෙයට ඇතුළත් වේ. මෙම තක්සේරුව කිරීමේදී සමාගම/සමූහය පහත දෑ සලකා බලයි.

— මුදල් ප්‍රවාහයේ ප්‍රමාණය හෝ කාලය වෙනස් කරන අසම්භාව්‍ය සිදුවීම්.
— විචල්‍ය අනුපාත ලක්ෂණ ඇතුලුව ගිවිසුම්ගත කූපන් අනුපාතය වෙනස් කළ හැකි කොන්දේසි.
— පූර්ව ගෙවීම් හා දීර්ඝ කිරීම් ලක්ෂණ; සහ
— නිශ්චිත වත්කම්වලින් සමාගමේ/ සමූහයේ මුදල් ප්‍රවාහයට හිමිකම් සීමාකරන කොන්දේසි (උදා: ආපසු නොගෙවීම)

පෙර ගෙවුම් මුදල තනිකරම මූලික මුදල හා පොලිය ගෙවීමේ නිර්ණායකයන් වන්නේ; ගිවිසුම කලින් අවලංගු කිරීම සඳහා සාධාරණ අතිරේක වන්දි මුදලක් ඇතුළත් වන පූර්ව ගෙවීම් මුදල, නොගෙවූ මූලික මුදල හා මූලික මුදල මත හිඟ පොලිය විශාල ලෙස නියෝජනය වන්නේ නම්ය. මීට අතිරේකව එහි ප්‍රබල ගිවිසුම්ගත වට්ටමකට හෝ වාරිකයකට අත්කරගත් මූල්‍ය වත්කමක් සඳහා ගිවිසුම්ගත මුදලට එකතු උපචිත (එහෙත් නොගෙවූ) ගිවිසුම්ගත පොලිය (කලින් අවලංගු කිරීම සඳහා අතිරේක සාධාරණ වන්දි මුදල ක් ද ඇතුළත් වන) සැලකිය යුතු ලෙස නිරූපණය කරන පෙර ගෙවුම් මුදලකට ගෙවීම් කිරීමට අවසර හෝ මූලික හඳුනාගැනීමේදී පූර්ව ගෙවීම් අංගයේ සාධාරණ වටිනාකම වැදගත් නොවන්නේ නම්, මෙම නිර්ණායකට අනුකූල බවට සලකනු ලැබේ.

**3.11.1.2 මූල්‍ය වත්කම් - පසුකාලීන මිනුම්කරණය හා ලාභ සහ පාඩු**

| | |
|---|---|
| ක්‍රමක්ෂය පිරිවැයට මූල්‍ය වත්කම් | මෙම වත්කම් සඵල පොලී අනුපාතය යොදා ගනිමින් ක්‍රමක්ෂය පිරිවැය හානිකරණ පාඩු මගින් අඩු කරයි. පොලී ආදායම, විදේශ විනිමය ලාභ හා පාඩු සහ හානිකරණය ලාභ හෝ පාඩුවල හඳුනා ගනු ලැබේ. ඉවත් කිරීම මත ඕනෑම පාඩුවක් හෝ ලාභයක්, ලාභ හෝ පාඩුවල හඳුනාගැනේ. |
| හිමිකම් ආයෝජන වෙනත් විස්තීර්ණ ආදායම තුලින් සාධාරණ අගයට | මෙම වත්කම් සාධාරණ අගයට පසුව මිනුම් කෙරේ. ලාභාංශ පැහැදිලිවම ආයෝජන පිරිවැයෙන් කොටසක් අයකර ගැනීමට අකමැති නම් ලාභ හෝ පාඩුවල ආදායම ලෙස ලාභාංශ හඳුනාගැනේ. ලාභ හා පාඩු වෙනත් විස්තීර්ණ ආදායමේ හඳුනාගන්නා අතර ලාභ හෝ පාඩුවලට ප්‍රතිවර්ගීකරණය නොකෙරේ. |

**3.11.1.3 හානිකරණය**

**මූල්‍ය උපකරණ හා කොන්ත්‍රාත් වත්කම්**

අපේක්ෂිත ණය පාඩු (ECLS) සඳහා සමාගම/සමූහය පාඩුදීමනා හඳුනා ගනී.
— ක්‍රමක්ෂය පිරිවැයට මනින ලද මූල්‍ය වත්කම්
— වෙනත් විස්තීර්ණ ආදායම තුළින් සාධාරණ අගයට මනින ලද ණය අයෝජන සහ
— කොන්ත්‍රාත් වත්කම්

පහත සඳහන් මාස 12ක අපේක්ෂිත ණය පාඩුවලට මනින ලද අවස්ථා හැර, සමාගම/සමූහය විසින් පාඩු දීමනාව ජීවිත කාලය තුළ අපේක්ෂිත ණය පාඩු මුදලට සමාන මුදලකින් මනිනු ලැබේ.

— වාර්තා කරන දිනයට අඩු ණය අවදානමක් ඇති වීමට තීරණය කරන ණය සුරැකුම් සහ
— මූලික හඳුනාගැනීමේ සිට සැලකිය යුතු ලෙස ණය අවදානම වැඩි නොවූ වෙනත් ණය සුරැකුම් හා බැංකු ශේෂ (එනම්, මූල්‍ය උපකරණයේ අපේකෂිත කාලයට වැඩියෙන් සිදුවන පැහැර හැරී අවදානම)

ලැබිය යුතු වෙළඳ ශේෂ සඳහා ණය දීමනා සෑම විටම අපේක්ෂිත ණය පාඩු සම්පූර්ණ කාලයට සමාන මුදලකට මනිනු ලැබේ. මූල්‍ය වත්කමක ණය අවදානම එහි මූලික හඳුනාගැනීමේ සිට සැලකිය යුතු ලෙස වැඩි වී ඇති බව තීරණය කිරීමේදී හා අපේක්ෂිත ණය පාඩු ඇස්තමේන්තු කිරීමේදී අදාළ හා අධික පිරිවැය හා පරිශ්‍රමය නොමැතිව ලබා ගත හැකි සාධාරණ හා සහයෝගාත්මක තොරතුරු සමාගම/සමූහය සලකා බලයි. මෙහි ප්‍රමාණාත්මක හා ගුණාත්මක තොරතුරු හා විශ්ලේෂණ ඇතුළත් වන අතර එහි සමාගමේ/සමූහයේ ඓතිහාසික පළපුරුද්ද පදනම්ව හා දන්වන ලද ණය තක්සේරුව හා ඉදිරිය දකින තොරතුරු ඇතුළත්ය.

පැහැර හැරිය හැකි අවදානම් සහිත මූල්‍ය වත්කමක් සමාගම/සමූහය පහත අවස්ථාවලදී සලකා බලයි.

— ණය ගැණුම්කරු ඔහුගේ ණය වගකීම් සම්පූර්ණයෙන් සමාගමට/සමූහයට ගෙවිය නොහැකි විට සමාගම/සමූහය විසින් සුරැකුම් (තිබේනම්) උපලබ්ධි කිරීම වැනි කාර්යයන්ගෙන් ආධාර කිරීමෙන් තොරව හෝ
— මූල්‍ය වත්කම දින 90කට වැඩි කාලයක් ඉකුත් විට සම්පූර්ණ ජීවකාලයේ අපේක්ෂිත ණය පාඩු වන්නේ, මූල්‍ය උපකරණයක අපේක්ෂිත ජීව කාලය තුළ සිදුවිය හැකි පැහැර හැරීම් අවස්ථාවන් වලය.

**අපේක්ෂිත ණය පාඩු මිනුම්කරණය**

ණය පාඩුවල විය හැකි බර තැබූ ඇස්තමේන්තුවක් අපේක්ෂිත ණය පාඩු වේ. සියලු මුදල් ඌණතාවල වර්තමාන අගය ලෙස ණය පාඩු මනිනු ලැබේ. (එනම් ගිවිසුමට අනුකූලව ආයතනයේ මුදල් ප්‍රවාහ සහ සමාගම අපේක්ෂා කරන ලැබිය යුතු මුදල් ප්‍රවාහයන්හි වෙනසයි.)

අපේකෂිත ණය පාඩු මූල්‍ය වත්කමේ සඵල පොලී අනුපාතයට වට්ටම් කෙරේ.

**මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ අපේක්ෂිත ණය පාඩු සඳහා වෙන්කිරීම් ඉදිරිපත් කිරීම.**

ක්‍රමක්ෂය පිරිවැයට මනින ලද මූල්‍ය වත්කම් සඳහා පාඩු දීමනා වත්කම් වල දළ ධාරණ අගයන් අඩු කරනු ලැබේ.

වෙනත් විස්තීරණ ආදායම තුළින් සාධාරණ අගයට පෙන්වනු ලබන ණය සුරැකුම් සඳහා, පාඩු සඳහා වෙන්කිරීම් ලාභ හෝ පාඩු වලට අය කරන අතර වෙනත් විස්තීරණ ආදායම් ලෙස හඳුනාගනු ලැබේ.

**ලියා හැරීම**

සමාගම මූල්‍ය වත්කමක් සම්පූර්ණයෙන් හෝ එහි කොටසක් අයකර ගැනීමේ සාධාරණ අපේක්ෂාවන් සමාගමට නොමැති විට, මූල්‍ය වත්කමක දළ ධාරණ අගය ලියා හරිනු ලැබේ. තනි පාරිභෝකයන් සඳහා, සමාන වත්කම් වල අය කිරීම් පිළිබඳ ඓතිහාසික පළපුරුද්ද මත පදනම්ව ලැබිය යුතු දින 360 ක් පසු වූ මූල්‍ය වත්කමකදී දළ ධාරණ අගය ලියා හැරීමේ ප්‍රතිපත්තියක් සමාගමට ඇත. ඒකාබද්ධ පාරිභෝගිකයන් සඳහා, අයකිරීමේ සාධාරණ අපේක්ෂාවන් තිබේද යන්න මත පදනම්ව කාලය හා ලියා හැරීමේ මුදල සම්බන්ධයෙන් තක්සේරුවක් සමාගම විසින් සිදු කරනු ලබයි. ලියා හරින ලද මුදලෙන් කිසිදු සැලකිය යුතු අය කිරීමක් සමාගම අපේක්ෂ නොකෙරේ. කෙසේ වුවද ලැබිය යුතු මුදල් අය සඳහා සමාගම් ප්‍රතිපත්ති වලට අනුකූල වීම සඳහා ලියා හරින ලද මූල්‍ය වත්කම් තවමත් බලාත්මකව අයකර ගැනීමේ කාර්යයන්හි යෙදිය හැක.

**2018 ජනවාරි 01 ට පෙර කාලපරිච්ඡේදයට අදාළ ප්‍රතිපත්තිය**

**3.11.1.4 මූලික හඳුනා ගැනීම හා මිනුම්කරණය**

ශ්‍රීලංගිප්‍ර 39 ප්‍රකාරව මූල්‍ය වත්කම්, ලාභ හෝ පාඩු, ණය හා ලැබිය යුතු ශේෂ, කල්පිරීමට ඇති ආයෝජන හා විකිණීමට ඇති මූල්‍ය වත්කම් අදාළ පරිදි මූල්‍ය වත්කම් ලෙස වර්ගීකරණය කෙරෙන අතර මූලික හඳුනාගැනීම මත එහි මූල්‍ය වත්කම් වර්ගීකරණය තීරණය කෙරේ.

සියලු මූල්‍ය වත්කම් සාධාරණ අගයට වැඩි අගයට ආරම්භකව හඳුනා ගැනෙන අතර ආයෝජන වලදී ලාභ හෝ පාඩු මඟින් සාධාරණ අගයට නොව ගනුදෙනු පිරිවැයට සෘජුවම ආරෝපණය වේ.

මූල්‍ය වත්කම් වලට මුදල් හා කෙටි කාලීන තැන්පතු , වෙළඳ හා වෙනත් ලැබිය යුතු ශේෂ හා වෙනත් මූල්‍ය වත්කම් ඇතුළත් වේ.

**3.11.1.5 පසුකාලීන මිනුම්කරණය**

මූල්‍ය වත්කම්වල පසු කාලීන මිනුම්කරණය පහත සඳහන් පරිදි ඒවායේ වර්ගීකරණය මත රඳා පවතී.

**3.11.1.6 ණය හා ලැබිය යුතු ශේෂ**

ණය හා ලැබිය යුතු ශේෂ ව්‍යුත්පන්න නොවන මූල්‍ය වත්කම් වන අතර ඒවා ක්‍රියාකාරී වෙළඳපොළක මිල ප්‍රකාශිත නොවන ස්ථාවර හෝ තීරණාත්මක ගෙවීම් සහිත වේ. මූලික මිනුම්කරණයෙන් පසුව, එවැනි මූල්‍ය වත්කම් හානිකරණය අඩුකළ සඵල පොලී අනුපාතය (EIR) යොදා ගනිමින් ක්‍රමක්ෂය පිරිවැයට පසුකාලීනව ගණනය කරනු ලැබේ. ක්‍රමක්ෂය පිරිවැය, අත්කර ගැනීමේදී කිසියම් මට්ටමකට හෝ වාරිකයකට හා සඵල පොලී අනුපාතයේ කොටසක් වන ගාස්තු හෝ පිරිවැයට ගිණුම්වලට ගැනීම මඟින් ගණනය කරනු ලැබේ. ලාභ හෝ පාඩුවල මූල්‍ය ආදායම තුළ සඵල පොලී අනුපාතය ක්‍රමක්ෂය කිරීම ඇතුළත් කරනු ලැබේ. හානිකරණයෙන් පැන නගින පාඩු ලාභ හෝ පාඩුවල හඳුනා ගනු ලැබේ.

**3.11.1.7 විකිණීම සඳහා ඇති මූල්‍ය ආයෝජන**

විකිණීම සඳහා ඇති මූල්‍ය ආයෝජන තුළ හිමිකම් හා ණය සුරැකුම් ඇතුළත් වේ. විකිණීම සඳහා ලෙස වර්ගීකරණය කරන ලද හිමිකම් ආයෝජන වෙළඳාම සඳහා වර්ගීකරණය නොකළ හෝ ලාභ හෝ පාඩු මඟින් සාධාරණ අගයට නිශ්චය නොකළ ආයෝජන වේ. මෙම වර්ගයේ ණය සුරැකුම්, අසීමිත කාල පරිච්ඡේදයක් සඳහා පැවතිය යුතු බවට අදහස් කළ හා ද්‍රවශීලතාවය සඳහා අවශ්‍යතාවන් සඳහා ප්‍රතිචාර වලදී විකිණිය හැකි හෝ වෙළඳපොළ තත්ත්වයෙහි වෙනස්කම් වලට ප්‍රතිචාර වලදී වන ණය සුරැකුම් වේ.

මූලික මිනුම්කරණයෙන් පසුව ආයෝජනය ඉවත් කරන තුරු විකිණීමට ඇති සංචිතයේ විස්තීර්ණ ආදායම ලෙස හඳුනාගත් උපලබ්ධි නොවූ ලාභ හෝ පාඩු සමඟ විකිණීමට ඇති මූල්‍ය ආයෝජන පසුව සාධාරණ අගයට ගණනය කරනු ලැබේ. එය වෙනත් මෙහෙයුම් ආදායමේ සමුච්චිත ලාභය හෝ පාඩුව (හඳුනාගන්නා අවස්ථාවේදී හෝ හානිකරණය කළ යුතු බවට තීරණය කිරීමේදී) වෙනත් මෙහෙයුම් ආදායමක් එසේ නොමැති නම් සමුච්චිත පාඩුව ආදායම් ප්‍රකාශනයේ ප්‍රතිවර්ගීකරණය කළ සහ විකිණීම සඳහා ඇති සංචිතයෙන් ඉවත් කළ හානිකරණය වූ ලෙස තීරණය කළ ලෙස හඳුනා ගැනේ. විකිණීම සඳහා වූ ණය සුරැකුම්පත් වල පොලී ආදායම සඵල පොලී ක්‍රමය යොදා ගනිමින් ගණනය කෙරෙන අතර ලාභ හෝ අලාභ ලෙස හඳුනා ගැනේ.

විකිණීම සඳහා ඇති මූල්‍ය වත්කම් අදාළ වන නුදුරු කාලයේදී සුදුසු ලෙස විකුණා දැමීමට ඇති හැකියාව හා අභිප්‍රාය තීරණය කිරීම සඳහා සමූහය විසින් ඇගයීම් කෙරේ. අක්‍රිය වෙළඳපොළ හේතුවෙන් මෙම මූල්‍ය වත්කම් වෙළඳාම් කිරීම සඳහා සමූහයට නොහැකි විට හා කලින් දැනගත් ඉදිරි කාලයේදී ප්‍රධාන වෙනස්කම් සිදුකිරීමට කළමනාකාරිත්වය තීරණය කිරීමේදී සමූහයට මෙම මූල්‍ය වත්කම් විකිණීමට නොහැකි වූ අවස්ථාවක සමූහය මෙම මූල්‍ය වත්කම් වෙනත් ක්‍රම මඟින් ප්‍රතිවර්ගිකරණය කිරීමට තෝරා ගනී. ණය හ ලැබිය යුතු ශේෂ පිළිබඳ අර්ථ දැක්වීම මූල්‍ය වත්කමට ඇති විට ප්‍රතිවර්ගීකරණය සඳහා අනුමැතිය ලැබෙන අතර කලින් දැනගත් ඉදිරි කාලයක් සඳහා හෝ කල් පිරීම දක්වා මෙම වත්කම් තබා ගැනීමට සමූහයට අරමුණක් හා හැකියාවක් ලැබේ.

ඒ අනුව මූල්‍ය වත්කම තබා ගැනීම සඳහා හැකියාව හා අරමුණ ආයතනයට ඇති විට පමණක් කල් පිරීම තෙක් තබා ගැනීමේ වර්ගය සඳහා ප්‍රති වර්ගීකරණය සඳහා අනුමැතිය ලැබේ.

විකිණීම සඳහා තබා ඇති වර්ගයෙන් බැහැරව, මූල්‍ය වත්කමක ප්‍රතිවර්ගීකරණය සඳහා, ස්කන්ධයක හඳුනාගන්නා ලද එම වත්කමේ යම් කිසි පෙර වාසියක් හෝ පාඩුවක් ඇත්නම්, සඵල පොලී අනුපාතය යොදා ගනිමින් ආයෝජනයේ ඉතිරි ජීව කාල සඳහා ලාභ හෝ පාඩුවලට ක්‍රමක්ෂය කරනු ලැබේ. නව ක්‍රමක්ෂය පිරිවැය හා අපේක්ෂිත මුදල් ප්‍රවාහයන් අතර වෙනස්කමක් තිබේ නම් එයද සඵල පොලී අනුපාතය යොදා ගනිමින් වත්කමේ ඉතිරි ජීව කාලය තුළ ක්‍රමක්ෂය කරනු ලැබේ. වත්කමක් හානිකරණය කිරීම සඳහා පසුව තීරණය කරන්නේ නම් ස්කන්ධයේ වාර්තා කරන ලද මුදල ලාභ හෝ පාඩුවට ප්‍රතිවර්ගීකරණය කෙරේ.

### 3.11.1.8 ඉවත් කිරීම

මූල්‍ය වත්කමක් (හෙවත් අදාළ වන පරිදි මූල්‍ය වත්කමක කොටසක් හෝ සමාන මූල්‍ය වත්කම් සමූහයකින් කොටසක් ) ඉවත් කරනුයේ,

i) වත්කමෙන් මුදල් ප්‍රවාහයන් ලබාගැනීමේ අයිතිය කල් ඉකුත්වී ඇති අවස්ථාවක
ii) සමූහය විසින් වත්කමෙන් මුදල් ප්‍රවාහ ලබාගැනීමේ සිය අයිතිය පැවරීම හෝ ලැබී තිබෙන මුදල් ප්‍රවාහයන් සැලකිය යුතු ප්‍රමාදයකින් තොරව පරික්‍රමණ (Pass Through) වැඩ පිළිවෙලක් යටතේ තෙවන පාර්ශ්වයකට සම්පූර්ණයෙන් ගෙවීමට බැඳීමක් කර ගෙන තිබෙන විට සහ පහත සඳහන් දෙකෙන් එකක්.

- සමූහය විසින් වත්කමේ සියලුම අවදානම් හා ප්‍රතිලාභ සැලකිය යුතු ලෙස මාරු කිරීම හෝ
- සමූහය විසින් වත්කමේ සියලුම අවදානම් හා ප්‍රතිලාභ සැලකිය යුතු ලෙස මාරු කර නොමැති හෝ සැලකිය යුතු ලෙස රඳවා ගෙන නොමැතිව වත්කම් පාලනය මාරු කිරීම.

වත්කමකින් මුදල් ප්‍රවාහ ලබාගැනීමේ සිය අයිතිය පවරා ඇත්නම් හෝ පරික්‍රමණ (Pass)Through) වැඩ පිළිවෙලකට එළඹී ඇත්නම්, සහ සමූහය විසින් වත්කමේ සියලූ ආදායම් හා ප්‍රතිලාභ සැලකිය යුතු ලෙස මාරුකර හෝ රඳවා ගෙන නොමැති නම්, වත්කම හඳුනා ගනු ලබන්නේ ඒ ගැන සමාගමේ තිබෙන අඛණ්ඩ සහභාගීත්වයේ විස්තරය අනුවය. එවන් අවස්ථාවකදී සමූහය විසින් ආශ්‍රිත බැඳියාවක්ද හඳුනා ගනී. මාරු කරන ලද වත්කම් හා ආශ්‍රිත බැඳියාව මනිනු ලබන්නේ, සමූහය විසින් රඳවා ගෙන තිබෙන අයිතිවාසිකම් හා බැඳියාවන් පිළිබිඹු වන ආකාරයටය.

මාරු කරන ලද වත්කම සම්බන්ධයෙන් වූ ඇප සහතිකයක ස්වරූපය ගන්නා වූ අඛණ්ඩ සහභාගීත්වය මනිනු ලබන්නේ වත්කමේ මුල් ධාරණ අගයක් සමූහයට ගෙවීමට නියමිත විය හැකි උපරිම මුදලත් යන දෙකෙන් අඩු අගයටය.

### 3.11.1.9 මූල්‍ය වත්කම් හානිකරණය

මූල්‍ය වත්කමක් හෝ මූල්‍ය වත්කම් සමූහයක් හානිකරණය වී තිබෙන බවට කිසියම් වාස්තවික සාක්ෂියක් තිබේ දැයි වාර්තාකරණ සෑම දිනයකටම සමූහය විසින් තක්සේරු කරනු ලබයි. මූල්‍ය වත්කමක් හෝ මූල්‍ය වත්කම් සමූහයක් හානිකරණය වී තිබෙන බවට සලකනු ලබන්නේ, වත්කමේ මූලික හඳුනාගැනීමෙන් පසු හටගත් සිදුවීම් එකක හෝ වැඩි ගණනක ප්‍රතිඵලයක් වශයෙන් වන අතර එම පාඩු සිද්ධිය මූල්‍ය වත්කමේ හෝ මූල්‍ය වත්කම් සමූහයේ ඇස්තමේන්තු කළ අනාගත මුදල් ප්‍රවාහවලට විශ්වාසවන්තව ඇස්තමේන්තු කළ හැකි බලපෑමක් කළ විටය.

ණයකරුවන් හෝ ණයකරුවන් සමූහයක් සැලකිය යුතු මූල්‍ය දුෂ්කරතා පොලී හෝ ප්‍රාග්ධන ගෙවීම් වලදී පැහැර හැරීම් හෝ සුළු සුළු වැරදි සැලකිය යුතු ලෙස අත්විඳින බවට වූ ඇඟවීම්, ඔවුන් බුන්වත්භාවය හෝ වෙනත් මූල්‍යමය ප්‍රතිසංවිධානයකට එළඹීමේ සම්භාවිතාවය සහ ඇස්තමේන්තුගත අනාගත මූල්‍ය ප්‍රවාහවල මැකිය හැකි අඩුවීමක් තිබෙන බවට නිරීක්ෂණය කළ හැකි දත්ත වලින් පෙන්වීමද හානිකරණ සාක්ෂි වලට අයත් විය හැක.

#### 3.11.1.9.1 ක්‍රමක්ෂය කළ පිරිවැය මත වූ මූල්‍ය වත්කම්

ක්‍රමක්ෂය කළ පිරිවැය මත ඉදිරියට ගෙනයන ලද මූල්‍ය වත්කම් සම්බන්ධයෙන් තනි වශයෙන් ගත් කළ වැදගත් වන මූල්‍ය වත්කම් තනි වශයෙන්ද, තනි වශයෙන් ගත් කල වැදගත් නොවන මූල්‍ය වත්කම් සාමූහිකවද හානිකරණයවීමේ වාස්තවික සාක්ෂි තිබේ දැයි

සමූහය විසින් මුලින්ම තක්සේරු කරනු ලැබේ. තනි වශයෙන් තක්සේරු කරන ලද මූල්‍ය වත්කමක් සම්බන්ධයෙන් වැදගත් වුවද නොවුවද හානිකරණය වීමේ වාස්තවික සාක්ෂි නොතිබෙන බව සමූහය විසින් නිශ්චය කරනු ලබන්නේ නම්, එම වත්කම සමාන ණය අවදානම් ලක්ෂණ සහිත සමූහයට ඇතුළත් වන අතර, හානිකරණය සඳහා සාමූහිකව තක්සේරුවට ලක් වේ. හානිකරණය ගැන තනි වශයෙන් තක්සේරුවට භාජනය වන වත්කම්වල හානිකරණ අලාභයක් හඳුනාගෙන තිබේ නම් හෝ හඳුනා ගැනීම අඛණ්ඩව පවතී නම් ඒවා සාමූහිකව හානිකරණ තක්සේරුවකට ඇතුළත් නොකෙරේ.

හානිකරණ අලාභයක් සිදුවූ බවට වාස්තවික සාක්ෂි තිබේ නම්, වත්කමේ ධාරණ මුදල හා ඇස්තමේන්තුගත අනාගත මුදල් ප්‍රවාහයන් වල වත්මන් අගය (තවමත් දරා නොමැති අනාගතයේදී අපේක්ෂිත ණය පාඩු හැර) අතර වූ වෙනස පාඩු වශයෙන් ගණනය කරනු ලැබේ. ඇස්තමේන්තුගත අනාගත මුදල් ප්‍රවාහයන්හි වත්මන් අගය මූල්‍ය වත්කමේ මුල් සඵල පොලී අනුපාතය මත වට්ටම් කෙරේ. ණය මුදලකට විචල්‍ය පොලී අනුපාතයක් තිබේ නම්, කිසියම් හානිකරණ පාඩුවක් මැනීම පිණිස යොදා ගනු ලබන්නේ ප්‍රවර්තන සඵල පොලී අනුපාතයයි.

දීමනා ගිණුමක් යොදා ගැනිම මඟින් වත්කමේ ධාරණ මුදල අඩුවන අතර ආදායම් ප්‍රකාශනයේ පාඩු වූ මුදල හඳුනා ගැනේ. අඩු වූ ධාරණ මුදලට අදාළ වූ පොලී ආදායම උපචිත කිරීම අඛණ්ඩව කෙරෙන අතර හානිකරණ අලාභයක් මැනීම සඳහා අනාගත මුදල් ප්‍රවාහයක් වට්ටම් කිරීමට යොදා ගන්නා පොලී අනුපාතය යොදා ගනිමින් උපචිත කෙරේ. පොලී ආදායම මූල්‍ය ආදායමේ කොටසක් වශයෙන් ආදායම් ප්‍රකාශනයේ සටහන් කරනු ලැබේ. අනාගතයේදී ආපසු ලබාගැනීමේ තාත්වික අපේක්ෂාවක් නොමැති විට හා සියලු සමපාර්ශ්වීයයන් ලබාගෙන ඇත්නම් හෝ සමූහය වෙත මාරු කර තිබේ නම් ආශ්‍රිත දීමනාද සහිත ණය මුදල් කපා හරිනු ලැබේ. හානිකරණය හඳුනාගැනීමෙන් පසු සිද්ධියක් ඇතිවීම නිසා ඇස්තමේන්තුගත හානිකරණ අලාභය වැඩි වේ නම් හෝ අඩු වේ නම් දීමනා ගිණුමට ගැලපීම් කර පෙර හඳුනාගත් හානිකරණ පාඩුව වැඩි කිරීම හෝ අඩු කිරීම කරනු ලැබේ. අනාගත කපා හැරීමක් පසුව අය කෙරේ නම් ලාභ හෝ පාඩුවල මූල්‍ය පිරිවැයට බැර කරනු ලැබේ.

### 3.11.1.6.2 විකිණීමට තිබෙන මූල්‍ය ආයෝජන

විකිණීමට තිබෙන මූල්‍ය ආයෝජන සම්බන්ධයෙන් ආයෝජනයක් හෝ ආයෝජන සමූහයක් හානිකරණය වී තිබෙන බවට කිසියම් වාස්තවික සාක්ෂි තිබේ දැයි එක් එක් වාර්තාකරණ දිනයට සමූහය විසින් තක්සේරු කරනු ලැබේ.

ස්කන්ධ ආයෝජන විකිණීම සඳහා පවත්නා මූල්‍ය වත්කම් ලෙස වර්ගීකරණය කරන විට එම ආයෝජනයේ පිරිවැයට වඩා අඩුවෙන් සාධාරණ අගයේ සැලකිය යුතු හා දිගුකාලීන අඩුවීමක් ඇති බවට වාස්තවික සාක්ෂි ඇතුළත් විය යුතුය. හානිකරණය සඳහා සාක්ෂි ඇති අවස්ථාවකදී සමුච්චිත පාඩුව ගණනය කරනු ලබන්නේ අත්පත් කර ගැනිමේ පිරිවැයත් වර්තමාන සාධාරණ අගයත් අතර වෙනසින් ලාභය හෝ පාඩුව තුළ කලින් හඳුනා ගන්නා ලද ආයෝජන වල යම් හානිකරණ පාඩු අඩු කිරීමෙනි. මෙය අනෙකුත් විස්තීරණ ආදායම් වලින් ඉවත් කර ලාභ හෝ පාඩු වලට හඳුනා ගැනේ.

ස්කන්ධ ආයෝජන වලට අදාළ හානිකරණ පාඩු, ලාභ හෝ පාඩු ප්‍රකාශනය හරහා ප්‍රතිවර්තනය වීමක් සිදු නොවේ. හානිකරණය විමෙන් පසු ඒවායේ සාධාරණ අගය වැඩිවීම් වෙනත් විස්තීර්ණ ආදායම් යටතේ සෘජුව හඳුනා ගැනේ.

විකිණීමට ඇති ලෙස වර්ගීකරණය කරන ලද ණය උපකරණ වලදී හානිකරණය මූල්‍ය වත්කම් වලදී මෙන් එම නිර්ණායකයම පදනම් කර ගෙන ක්‍රමක්ෂය පිරිවැයට තක්සේරු කරනු ලැබේ. කෙසේ වුවද, හානිකරණය සඳහා වාර්තා කරන ලද මුදල වනුයේ පාඩු හෝ ලාභවල කලින් හඳුනාගන්නා ලද එම ආයෝජන මත කිසියම් හානිකරණ පාඩුවක් අඩුකර ක්‍රමක්ෂය පිරිවැය හා ප්‍රවර්තන සාධාරණ අගය අතර වෙනස ලෙස ගණනය කරන ලද සමුච්චිත පාඩුව වේ.

හානිකරණ පාඩුව ගණනය කිරීම සඳහා අනාගත මුදල් ප්‍රවාහයන් වට්ටම් කිරීම සඳහා යොදා ගන්නා පොලී අනුපාතය යොදා ගනිමින් වත්කමේ අඩු කරන ලද ධාරණ අගය පදනම් කර ගෙන උපචිත කිරීම සඳහා අනාගත පොලී ආදායම අඛණ්ඩව පවත්වා ගෙන යනු ලැබේ. මූල්‍ය ආදායමේ කොටසක් ලෙස පොලී ආදායම වාර්තා කරනු ලැබේ. පසු කාලීන වර්ෂයකදී, ණය උපකරණයක සාධාරණ අගය වැඩිවන අතර එම වැඩිවීම ලාභ හෝ පාඩුවල හඳුනාගත් හානිකරණ පාඩුවෙන් පසු සිදුවන සිද්ධියකට වාස්තවිකව අදාළ කිරීමට හැකිවන අතර හානිකරණ පාඩුව ලාභ හෝ පාඩු මඟින් ප්‍රතිවර්තනය වේ.

### 3.11.2 මූල්‍ය වගකීම්

#### 3.11.2.1 මූලික හඳුනා ගැනීම හා මිනුම්කරණය

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 39 විෂය ක්ෂේත්‍රය ඇතුළත මූල්‍ය වගකීම් වර්ග කරනු ලබන්නේ ලාභ හෝ පාඩු සහ ණය ගැනීම්, වෙනත් මූල්‍ය වගකීම් හෝ අදාළ පරිදි සඵල ඉදිරි රැකුමක, ඉදිරි රැකුම් උපකරණ ලෙස නම් කළ ව්‍යුත්පන්න ලෙසටය. සමූහය විසින් සිය මූල්‍ය වගකීම් වර්ගීකරණය නිශ්චය කරනු ලබන්නේ මූලික හඳුනාගැනීමේදීය.

සියලුම මූල්‍ය වගකීම් මූලික වශයෙන් හඳුනා ගනු ලබන්නේ සාධාරණ අගය මත වන අතර ණය හා ණය ගැනීම් හා වෙනත් මූල්‍ය වගකීම් ඉදිරියට ගෙන යනු ලබන්නේ ක්‍රමක්ෂය කළ පිරිවැය මතය මෙය සෘජුව ආරෝපණය කළ හැකි ගනුදෙනු පිරිවැය ඇතුළත්ය.

වාර්තාකරණ දිනයට සමූහයේ මූල්‍ය වගකීම් වලට වෙළඳ හා වෙනත් ගෙවිය යුතු මුදල් හා බැංකු අයිරා ඇතුළත් වේ.

#### 3.11.2.2 පසු කාලීන මිනුම්කරණය

මූල්‍ය වගකීම් පිළිබඳ මිනුම්කරණය රැඳී තිබෙනුයේ පහත පරිදි ඒවායේ වර්ගීකරණය මතය.

#### 3.11.2.3 ණය සහ ණය ගැනීම්

මූලික හඳුනා ගැනීමෙන් පසු, සඵල පොලී අනුපාත ක්‍රමය යොදා ගැනීම මඟින් පොලී සහිත ණය හා ණය ගැනීම් පසු කාලීනව ක්‍රමයක්ෂය පිරිවැය මත මනිනු ලැබේ. ලාභ හෝ පාඩුවල වාසි හා පාඩු හඳුනා ගනු ලබන්නේ වගකීම් ඉවත් කරන විට හා එසේම ක්‍රමක්ෂය ක්‍රියාවලියේ සඵල පොලී අනුපාත ක්‍රමය (EIR) මඟිනි.

ක්‍රමක්ෂය පිරිවැය ගණනය කරනු ලබන්නේ අත්පත් කර ගැනීමේ ගාස්තු හෝ පිරිවැයට අදාළ සඵල පොලී අනුපාත ක්‍රමයේ වැදගත් කොටසක් වන කිසියම් වට්ටම් හෝ අධිමිල සැලකිල්ලට ගැනීමෙනි. සඵල පොලී අනුපාත ක්‍රමක්ෂය මූල්‍ය පිරිවැයෙහි ඇතුළත්ය.

#### 3.11.2.4 හඳුනාගත් මූල්‍ය වත්කම් ඉවත් කිරීම. (De recognition)

වගකීමක් යටතේ බැඳීමකදී මූල්‍ය වගකීමක් ඉවත් කරනු ලබන්නේ එම වගකීම ඉටුවූ විට හෝ අවලංගු වූ විට හෝ එහි කල් ඉකුත් වූ විටය.

පවත්නා මූල්‍ය බැඳීමක් සැලකිය යුතු වෙනස් නියමයන් මත එම ණය දෙන්නාගෙන්ම ප්‍රතිස්ථාපනය වුවහොත් හෝ පවත්නා බැඳීම සැලකිය යුතු ලෙස විකරණයක් වුවහොත් එවැනි හුවමාරුවක් හෝ විකරණයක් මුල් වගකීමේ හඳුනා ගැනීම ඉවත් කරනු ලැබීමක් හා නව වගකීමක් හඳුනා ගැනීමක් වශයෙන් සලකන අතර අදාළ ධාරණ අගයන්වල වෙනස ලාභ හෝ පාඩුවල හඳුනාගනු ලැබේ.

### 3.11.3 මූල්‍ය උපකරණ හිලව් කිරීම

හඳුනාගත් මුදල් ප්‍රමාණයන් හිලව් කිරීමට දැනට බලාත්මක කළ හැකි නීතිමය අයිතියක් තිබෙන විට හා ශුද්ධ පනමක් මත පියවීමට හෝ වත්කම් උපලබ්ධි කිරීමට හා සමගාමීව වගකීම් පියවීමට අභිප්‍රායක් තිබෙන විට පමණක් මූල්‍ය වත්කම් හා මූල්‍ය වගකීම් හිලව් කරන අතර ශුද්ධ මුදල මූල්‍ය තත්ත්ව ප්‍රකාශණයේ වාර්තා කරනු ලැබේ.

### 3.11.4 මූල්‍ය උපකරණ වල සාධාරණ අගය

එක් එක් වාර්තාකරණ දිනයට සක්‍රිය වෙළඳපොළේ වෙළඳාම් වන මූල්‍ය උපකරණ වල සාධාරණ අගය මිල ප්‍රකාශිත වෙළඳපොළ මිල ගණන්වලට හෝ ගනුදෙනු කරුවන්ගේ මිල ගණන් වලට අනුව ගනුදෙනු පිරිවැය සඳහා කිසිම අඩුකිරීමක් නොකර නිශ්චය කරනු ලැබේ. (දිගු කාලීන තත්ත්වයන් සඳහා ලංසු මිල හා කෙටි කාලීන තත්ත්වයන් සඳහා ඉල්ලා සිටින මිල)

සක්‍රිය වෙළඳපොළක වෙළඳාම් නොවන මූල්‍ය උපකරණ සඳහා උචිත තක්සේරු ශිල්පීය ක්‍රම යොදා ගනිමින් සාධාරණ අගය නිශ්චය කරනු ලැබේ. එවැනි ශිල්පීය ක්‍රම සඳහා මෑත කාලීන අතේ දුරින් සිදුවන වෙළඳපොළ ගනුදෙනු, සැලකිය යුතු ලෙස එයම වන වෙනත් උපකරණයක පවත්නා සාධාරණ අගය, වට්ටම් කල මුදල් ප්‍රවාහ විග්‍රහයක් හෝ වෙනත් තක්සේරු ආකෘති අඩංගු විය හැක.

### 3.12 මූල්‍ය නොවන වත්කම් හානිකරණය

වත්කමක් හානිකරණයවී තිබෙන බවට කිසියම් ඇඟවීමක් තිබේ දැයි වාර්තා කරන සෑම දිනකටම සමූහය විසින් තක්සේරු කරනු ලබයි. එවැනි කිසියම් ඇඟවීමක් තිබේ නම්, හෝ වත්කමක් සම්බන්ධයෙන් වාර්ෂික හානිකරණය පරීක්ෂණයක් සිදුකිරීමට අවශ්‍ය වූ විට, සමූහය විසින් අයකර ගත හැකි මුදල ඇස්තමේන්තු කරනු ලැබේ. වත්කමක නැවත අයකර ගත හැකි මුදල වනුයේ, වත්කමේ හෝ මුදල් ජනන ඒකකයේ (CGU) සාධාරණ අගයෙන් අලෙවි කිරීමේ පිරිවැය අඩුකර ලැබෙන අගයත් ප්‍රයෝජන අගයත් යන දෙකින් වැඩි අගයටය. වත්කම මුදල් ගලා ඒම ජනනය වන්නේ නම් මිස ඒවා වෙනත් වත්කම්වලින් හෝ වත්කම් සමූහයකින් විශාල ලෙස ස්වාධීන වේ. වත්කමක ධාරණ අගය හෝ මුදල් එම වත්කම හානිකරණය වුවක් ලෙස සලකා එහි නැවත අයකර ගත හැකි අගය දක්වා අඩු කරනු ලැබේ. ප්‍රයෝජ්‍ය අගය තක්සේරු කිරීමේදී මුදලේ කාලීන අගයේ වත්මන් වෙළඳපොළ තක්සේරුව සහ වත්කමට සුවිශේෂී අවදානම් පිළිබිඹු වන බදු ගෙවීමට පෙර වට්ටම් අනුපාතයක් උපයෝගී කර ගෙන ඇස්තමේන්තු කළ අනාගත මුදල් ප්‍රවාහයන් ඒවායේ වර්තමාන අගය දක්වා වට්ටම් කරනු ලැබේ. විකිණීම සඳහා පිරිවැය අඩුකළ සාධාරණ අගය තීරණය කිරීමේදී මෑත වෙළඳපොළ ගනුදෙනු තිබේ නම් ඒවා සැලකිල්ලට ගනී.  හඳුනා ගත හැකි එවැනි ගනුදෙනු නොවේ නම්, උචිත තක්සේරු ආකෘතියක් භාවිතා කරනු ලැබේ. තක්සේරු ගුණාකාරයන් පොදුවේ වෙළඳාම් වන පරිපාලිතයන් හෝ වෙනත් ලබාගත හැකි සාධාරණ අගය දර්ශකයන් සඳහා මිල ප්‍රකාශිත කොටස් මිල මඟින් මෙම ගණනය කිරීම් තහවුරු කෙරේ.

පෙර ප්‍රත්‍යාගණනය කර එම ප්‍රත්‍යාගණනය වෙනත් විස්තීර්ණ ආදායම් වලට ඇතුළත්ව ඇති දේපළක් හැර අඛණ්ඩ මෙහෙයුම් වල හානිකරණ පාඩු ඉන්වෙන්ටරි මත හානිකරණය ඇතුළත්ව හානිකරණය වූ වත්කමේ ක්‍රියාකාරිත්වය සහිත එම වියදම් වර්ගයන් ලාභ හෝ පාඩු යටතේ හඳුනා ගනී. මෙම අවස්ථාවේදී, කිසියම් පූර්ව ප්‍රත්‍යාගණනයක මුදල දක්වා වෙනත් විස්තීර්ණ ආදායමේ හානිකරණයද හඳුනා ගනී.

කීර්තිනාමය හැර, වෙනත් වත්කම් සඳහා පෙර හඳුනා ගනු ලැබූ හානිකරණ පාඩු තවදුරටත් නොතිබෙන බවට හෝ අඩුවී තිබෙන බවට කිසියම් ඇඟවීමක් තිබේදැයි සෑම වාර්තා කරන දිනකටම තක්සේරුවක් කරනු ලැබේ. එවැනි ඇඟවීමක් තිබේ නම්, වත්කමේ හෝ මුදල් ජනන ඒකකයේ අයකරගත හැකි මුදල සමූහය විසින් ඇස්තමේන්තු කරනු ලැබේ. පෙර කාල පරිච්ඡේදයන් සඳහා හඳුනා ගන්නා ලද හානිකරණ පාඩු තක්සේරු කරනුයේ, එක් එක් වාර්තාකරණ දිනයට පාඩුව අඩු වූ බවට හෝ තවදුරටත් පවත්නා බවට කිසියම් ඇඟවීම් සඳහාය. අයකර ගත හැකි මුදල තීරණය කිරීම සඳහා යොදා ගන්නා ඇස්තමේන්තුවල වෙනසක් තිබුණහොත් හානිකරණ පාඩුවක් ප්‍රතිවර්තනය කෙරේ. පෙර වර්ෂ වලදී වත්කම සම්බන්ධයෙන් හානිකරණ පාඩුවක් හඳුනාගෙන තිබුණේ නම්, ක්ෂය අඩු වත්කමේ ධාරණ අගය එහි ආපසු අයකර ගැනීමේ අගය ඉක්මවා නොයන තෙක් හෝ තීරණය කළ හැකි ධාරණ අගය ඉක්මවා නොයන තෙක් ප්‍රතිවර්තනය සීමා වේ.

ප්‍රත්‍යාගණිත අගයට වත්කම ඉදිරියට ගෙන නොගියහොත් එවැනි ප්‍රතිවර්තනයක් ලාභ හෝ පාඩු වල හඳුනා ගනු ලබන අතර ප්‍රතිවර්තනය ප්‍රත්‍යාගණන වැඩිවීමක් ලෙස සලකනු ලැබේ.

### 3.13 මුදල් හා කෙටි කාලීන තැන්පතු

මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ මුදල් හා කෙටි කාලීන තැන්පතු බැංකුවේ හා අතැති මුදල් සහ මාස 03 ක් හෝ ඊට අඩු කලෙයක් තුළ කල් පිරෙන කෙටි කාලීන තැන්පතුවලින් සමන්විත වේ.

සමූහයේ මුදල් ප්‍රවාහ ප්‍රකාශන, මුදල් සමාන ශේෂ ඉහත නිර්වචනය කරන ලද පරිදි හිඟ බැංකු අයිරා අඩු කළ මුදල් හා කෙටි කාලීන තැන්පතුවලින් සමන්විත වේ.

### 3.14 ප්‍රතිපාදන

අතීත සිද්ධියක ප්‍රතිඵලයක් ලෙස සමූහයට වර්තමාන බැඳීමක් තිබෙන විට (නීතිමය හෝ සම්ප්‍රයුක්ත) බැඳීම නිරවුල් කිරීම පිණිස ආර්ථික ප්‍රතිලාභ සහිත සම්පත් පිටතට ගලා යෑමේ සම්භාවිතාවයක් පවතී නම් සහ බැඳීමට අදාළ මුදල ගැන විශ්වාසය තැබිය හැකි ඇස්තමේන්තුවක් සකස් කළ හැකි විට ප්‍රතිපාදන හඳුනාගනු ලැබේ. ප්‍රතිපාදනයේ කොටසක් හෝ මුළු මුදලම ප්‍රතිපූර්ණය වීම සමූහය විසින් අපේක්ෂා කරනු ලැබුවහොත් උදාහරණ වශයෙන් රක්ෂණ ගිවිසුමකට අදාළව වැනි, ප්‍රතිපූර්ණය වෙනම වත්කමක් ලෙස හඳුනාගනු ලබන අතර, එසේ කරනුයේ ප්‍රතිපූර්ණය සත්‍ය වශයෙන්ම නියත නම් පමණි. කිසියම් ප්‍රතිපාදනයකට අදාළව වියදම කිසියම් ප්‍රතිපූර්ණයක් අඩු කළ ලාභ හෝ පාඩුවල ඉදිරිපත් කරනු ලැබේ.

මුදලේ කාලීන අගයේ බලපෑම ප්‍රමාණාත්මක වේ නම්, වර්තමාන බදු පූර්ව අනුපාතයක් යොදා ගනිමින් උචිත පරිදි වගකීමට විශේෂිත වූ අවදානම පිළිබිඹු වන අයුරින් ප්‍රතිපාදන වට්ටම් කරනු ලැබේ. වට්ටම් කිරීම යොදා ගැනීමේදී කාලය ඉකුත්වීම හේතුවෙන් ප්‍රතිපාදනයේ වැඩිවීම මූල්‍ය පිරිවැය වශයෙන් හඳුනාගනු ලැබේ.

### 3.15 විශ්‍රාම ප්‍රතිලාභ වගකීම

#### 3.15.1 නිශ්චිත දායකත්ව සැලසුම් - සේවක අර්ථසාධක අරමුදල සහ සේවක භාරකාර අරමුදල

සේවක අර්ථසාධක අරමුදල් දායකයට හා සේවක භාරකාර අරමුදල් දායකයට අදාල ව්‍යවස්ථා හා රෙගුලාසිවලට අනුකූලව සේවකයන් හිමිකම් ලබා ඇත. සේවක අර්ථසාධක අරමුදලට හා සේවක භාරකාර අරමුදලට දළ පඩිනඩිවලින් පිළිවෙලින් 15% ක් හා 3% ක් සමාගම දායකත්වය සපයයි.

#### 3.15.2 නිශ්චිත ප්‍රතිලාභ සැලැස්ම - පාරිතෝෂික

සැලසුම් කළ ප්‍රතිලාභ අගය කිරීමේ ක්‍රමය යොදා ගනිමින් ආයු ගණකයක උපදේශය සහිතව නිශ්චිත ප්‍රතිලාභ සැලැස්මක් වූ ගිවිසුම්ගත විශ්‍රාම ප්‍රතිලාභවල වර්තමාන අගය සමාගම විසින් ගණනය කරනු ලැබේ. නිශ්චිත ප්‍රතිලාභ සැලසුම් සඳහා වාසි හා පාඩු වෙනත් විස්තීර්ණ ආදායමේ ආදායම හෝ වියදම ලෙස එය පැන නැඟි මූල්‍ය වර්ෂය තුළ හඳුනා ගනු ලැබේ.

කෙසේ වුවද, 1983 අංක 12 දරන පාරිතෝෂික පනතේ ගෙවීම් අනුව, වර්ෂ 5 ක අඛණ්ඩ සේවයක් සම්පූර්ණ කිරීමේදී මෙම වගකීම පැන නඟී.
පාරිතෝෂික වගකීම බාහිරව මූල්‍යයනය කරනු නොලැබේ.

### 3.16 පාරිභෝගික දායකය මත විලම්බිත ආදායම

නව සේවා සම්බන්ධතා ස්ථාපිත කිරීම සඳහා වත්කම් පිරිවැය පියවීම සඳහා පාරිභෝගිකයන්ගේ දායකය විලම්බිත වගකීම් ලෙස හඳුනාගනු ලැබේ. නව සේවා වත්කම් වර්ෂ 20 ක කාලයක් තුළ ක්ෂය කරනු ලැබේ. අදාළ පාරිභෝගික දායකය වර්ෂ 20 ක සමාන කාලපරිච්ඡේදයක් තුළ ලාභ හෝ පාඩුවලට ක්‍රමක්ෂය කරනු ලැබේ.

## 4 මෙතෙක් අනුගමනය නොකළ නව ප්‍රමිති, සංශෝධන හා අර්ථ නිරූපණයන්

අනාගතයේදී බලපානු ලබන දිනයක් ඇති ශ්‍රී ලංකා වරකත් ගණකාධිකාර ආයතනය විසින් (CA Sri Lanka) නිකුත් කරන ලද පහත සඳහන් ශ්‍රී ලංකා මූල්‍ය වාර්ථා කරන ප්‍රමිත (ශ්‍රීලංමූවාප්‍ර) මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී යොදා නොගන්නා ලදී. සමාගම විසින් වර්තමානයේදී අනුගමනය කරන ගිණුම් කරන ප්‍රතිපත්ති සඳහා මෙම නව ශ්‍රිලංමූවාප්‍ර බලපෑමක් ඇති අතර අනාගත මූල්‍ය ප්‍රකාශන සඳහා ද බලපෑමක් ඇති වේ.

සමාගමේ මූල්‍ය ප්‍රකාශන සඳහා පහත සඳහන් නව ප්‍රමිතිය සැලකිය යුතු බලපෑමක් ඇති නොකරයි.

#### 4.1.1.1 ශ්‍රිලංමූවාප්‍ර 16 - කල්බදු

ශ්‍රිලංමූවාප්‍ර 16 මඟින් ශේෂ පත්‍රයේ මූල්‍ය කල් බදු සහ ශේෂ පත්‍ර මෙහෙයුම් කල්බදු අතර වෙනස හඳුනා ගන්නා බදු කරුවන් සඳහා වර්තමාන ද්විත්ව ගිණුම්කණ අකෘතිය ඉවත් කරයි. ඒ වෙනුවට වත්මන් මූල්‍ය කල්බදු ගිණුම්කරණයට සමාන ශේෂපත්‍ර ගිණුම් ආකෘතියක් ඇති වනු ඇත. 2019 ජනවාරි හෝ ඊට පසු ආරම්භ වන වාර්ෂික වාර්ථාකරණ කාල පරිච්ඡේදයන් සඳහා ශ්‍රිලංමූවාප්‍ර 16 බලපවත්වයි.

#### 4.1.1.2 ගිණුම්කරණ ප්‍රතිපත්ති වෙනස්වීම

සමාගම ජාත්‍යන්තර මූල්‍ය වාර්ථාකරණ ප්‍රමිත 15 ((අ) බලන්න) හා ප්‍රමිති 9 ((ආ) බලන්න)2018 ජනවාරි 01 සිට අනුගමනය කරයි. මෙම ප්‍රමිති යොදාගැනීමේදී සමාගම විසින් තෝරා ගන්නා ලද මාරුවීම් ක්‍රම හේතුවෙන් මෙම මූල්‍ය ප්‍රකාශන පුරාම සංසන්දනාත්මක තොරතුරු, නව ප්‍රමිතින්හි අවශ්‍යතාවයන් නිරූපනය කිරීම සඳහා නැවත සකස් කර නොතිබිණි.

**(අ) ශ්‍රිලංමූවාප්‍ර 15 පාරිභෝගිකයින් සමඟ ගිවිසුම් වලින් ආදායම**

ශ්‍රිලංමූවාප්‍ර 15 අදායම හඳුනාගෙන තිබේද කොපමණද කවදාද යන්න තිරණය කිරීම සඳහා පුළුල් රාමුවක් ස්ථාපිත කරයි. එය ශ්‍රිලංගිප්‍ර 18 ආදායම ශ්‍රිලංගිප්‍ර 11 ඉදිකිරීම් කොන්ත්‍රාත්තු හා ආශ්‍රිත අර්ථ නිරූපනයන් ආදේශකරයි. ශ්‍රිලංගිප්‍ර 15 යටතේ පාරිභෝගිකයා භාණ්ඩ හෝ සේවාවල පාලනය ලබාගත් විට ආදායම හඳුනා ගනු ලැබේ. පාලනය මාරු කිරීමේ වේලාව තිරණය කිරීම එක් අවස්ථාවක හෝ කාලයත් සමඟ විනිශ්චය අවශ්‍ය වේ. මෙම මූල්‍ය ප්‍රකාශන සඳහා ශ්‍රිලංමූවාප්‍ර 15 අනුගමනය කිරීම හේතුවෙන් සැලකිය යුතු මූල්‍ය බලපෑමක් නොවී ය.

**(ආ) ශ්‍රිලංමූවාප්‍ර 09 මූල්‍ය උපකරණ**

ශ්‍රිලංමූවාප්‍ර 09 මූල්‍ය නොවන විෂයයන් මිලදී ගැනීමට හෝ විකිණීම සඳහා මූල්‍ය වත්කම් මූල්‍ය වගකීම් හා වෙනත් ගිවිසුම් සඳහා නියමයන් සකස් කරඇත. නව ශ්‍රිලංමූවාප්‍ර 09 සමූහය සඳහා හඳුන්වාදීම තුළින් මූල්‍ය ප්‍රකාශන සඳහා සැලකිය යුතු බලපෑමක් කර නොමැත.

ශ්‍රිලංගිප්‍ර 39 යටතේ මූලික ගිණුම්කරණ වර්ගයන් සහ 2018 ජනවාරි 01 දිනට සමාගමේ මූල්‍ය වත්කම් හා මූල්‍ය වගකිම් එක් එක් පන්තිය සඳහා ශ්‍රිලංමූවාප්‍ර 09 යටතේ නව මිනුම් කරණ වර්ගයන් පහත වගුවේ විස්තර කෙරේ.

| **මූල්‍ය වත්කම්** | **ශ්‍රිලංගිප්‍ර 39 යටතේ මූලික වර්ගීකරණය** | **ශ්‍රිලංගිප්‍ර 9 යටතේ නව වර්ගීකරණය** |
|---|---|---|
| හිමිකම් අයෝජන | විකිණිම සඳහා තිබෙන | FVOCI හිමිකම් ආයෝජන |
| ලැබිය යුතු වෙළඳ ශේෂය | ණය හා ලැබිය යුතු ශේෂය | ක්‍රමක්ෂය පිරිවැය |
| සම්බන්ධිත පාර්ශවයන්ගෙන් ලැබිය යුතු මුදල් | ණය හා ලැබිය යුතු ශේෂය | ක්‍රමක්ෂය පිරිවැය |
| කෙටිකාලීන ආයෝජන | ණය හා ලැබිය යුතු ශේෂය | ක්‍රමක්ෂය පිරිවැය |
| මුදල් හා මුදල් සමාන ශේෂය | ණය හා ලැබිය යුතු ශේෂය | ක්‍රමක්ෂය පිරිවැය |
| මුළු මූල්‍යය වත්කම් | | |
| **මූල්‍ය වගකිම්** | | |
| ගෙවිය යුතු වෙළඳ ශේෂය | වෙනත් මූල්‍ය වගකිම් | වෙනත් මූල්‍ය වගකිම් |
| බැංකු අයිරාව | වෙනත් මූල්‍ය වගකිම් | වෙනත් මූල්‍ය වගකිම් |
| මුළු මූල්‍ය වගකිම් | | |

| | | සමූහය | | සමාගම | |
|---|---|---|---|---|---|
| | දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා | **2018** | 2017 | **2018** | 2017 |
| | | **රු. 000** | රු. 000 | **රු. 000** | රු. 000 |
| **5** | **ආදායම** | | | | |
| | කර්මාන්ත හා හෝටල් | **5,603,033** | 5,402,059 | **5 ,603,033** | 5,402,059 |
| | ගෘහස්ත | **12,049,541** | 11,851,248 | **12,049,541** | 11,851,248 |
| | වාණිජ | **13,186,571** | 12,569,106 | **13,186,571** | 12,569,106 |
| | වීථි ආලෝකකරණය | **6,553** | 9,072 | **6 ,553** | 9,072 |
| | ආගමික ස්ථාන | **88,245** | 85,511 | **88,245** | 85,511 |
| | තාවකාලික සම්බන්ධතා | **9,946** | 13,228 | **9,946** | 13,228 |
| | මීටර් විකුණුම් | **883,201** | 643,460 | - | - |
| | විදුලි බලය විකුණුම් | **31,827,090** | 30,573,686 | **30,943,889** | 29,930,225 |
| **6** | **වෙනත් මෙහෙයුම් ආදායම** | | | | |
| | පාරිභෝගික දායකය ක්‍රමක්ෂය කිරීම | **362,256** | 348,361 | **362,256** | 348,361 |
| | රජයේ ප්‍රදාන ක්‍රමක්ෂය කිරීම | **5,562** | 16,939 | **5,562** | 16,939 |
| | පාරිභෝගිකයන්ගෙන් අයකර ගැනීම් | **360,025** | 295,032 | **360,025** | 295,032 |
| | දේපල, පිරියත හා උපකරණ ඉවත් කිරීම/ බැහැර කිරීම මත වන ලාභ/ (පාඩු) | **(14,655)** | 54,533 | **(14,655)** | 54,533 |
| | දේපල, පිරියත හා උපකරණ මත ප්‍රත්‍යාගණන වාසිය | - | 5,036 | - | 5,036 |
| | විවිධ ආදායම් | **3,436** | 17,248 | **2,842** | 16,008 |
| | ලාභාංශ ආදායම | **1,165,881** | | **1 ,169,326** | 4,806 |
| | | **1,882,505** | 737,148 | **1 ,885,356** | 740,714 |
| **7** | **ශුද්ධ මූල්‍ය ආදායම** | | | | |
| | **මූල්‍ය ආදායම** | | | | |
| | සේවක ණය පොලී සහ පාරිභෝගිකයන් සඳහා දුන් සහනදායී ණය මත පොලී | **60,916** | 36,270 | **60,702** | 36,007 |
| | කාලීන තැන්පතු මත පොලී | **1,247,720** | 1,250,501 | **1,241,799** | 1,231,023 |
| | භාණ්ඩාගාරය විසින් ලබාගත් පරිපාලන ණය මත පොලී | - | 1,525 | - | - |
| | ඇප ලෙස උකස් කරන ලද කාලීන තැන්පතු මත පොලී | **23,461** | 20,787 | **23,461** | 20,787 |
| | රජයේ සුරැකුම් මත පොලී | **458** | - | - | - |
| | | **1,332,554** | 1,309,082 | **1,325,962** | 1,287,817 |
| | **මූල්‍ය පිරිවැය** | | | | |
| | පාරිභෝගික තැන්පතු මත පොලී වියදම | **13,680** | 16,902 | **13,680** | 16,902 |
| | බැංකු අයිරා මත පොලී වියදම හා බැංකු ගාස්තු | **6,627** | 2,333 | **2,746** | 2,333 |
| | විදේශ මුදල් ගනුදෙනුවලින් ලද පාඩුව | - | 1,974 | - | 1,974 |
| | ජා.ඉ.බැ. සූර්ය බල සංග්‍රාමය ණය යෝජනා ක්‍රමයේ වගකීම වෙනුවෙන් පොලිය සඳහා ප්‍රතිපාදන | **40,318** | - | **40,318** | - |
| | | **60,624** | 21,209 | **56,744** | 21,209 |
| | ශුද්ධ මූල්‍ය ආදායම | **1,271,930** | 1,287,873 | **1,269,218** | 1,266,608 |

## 8 බදුවලට පෙර ලාභය

පහත සඳහන් ආයතමයන් ඇතුළත්ව සියලු වියදම් අය කිරීමෙන් පසුව බදු පෙර ලාභය දක්වා ඇත.

| | | සමූහය | | සමාගම | |
|---|---|---|---|---|---|
| දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා | | **2018** | 2017 | **2018** | 2017 |
| | | **රු. 000** | රු. 000 | **රු. 000** | රු. 000 |
| **ආදායම** | | | | | |
| අධ්‍යක්ෂවරුන්ගේ පාරිශ්‍රමික | | **4,034** | 2,785 | **3,999** | 2,785 |
| විගණන ගාස්තු | | **3,152** | 3,139 | **2 ,700** | 2,700 |
| දේපල, පිරියත හා උපකරණ මත ක්ෂය | | **896,603** | 946,082 | **872,398** | 940,149 |
| අස්පෘශ්‍ය වත්කම් මත ක්‍රමක්ෂය | | **16,756** | 13,385 | **14,923** | 11,552 |
| ආයෝජන දේපල මත ක්ෂය | | **-** | - | **1 ,817** | 1,025 |
| පරිත්‍යාග හා දායක | | **1,548** | 1,974 | **-** | - |
| මහජන සම්බන්ධතා හා ප්‍රචාරණය | | **28,457** | 28,747 | **28,457** | 28,747 |
| යල්පැනගිය හා සෙමින් චලනය වන වෙළඳ තොග හානිකරණය | | **49,898** | (3,260) | **49,898** | (3,260) |
| ලැබිය යුතු වෙළඳ ශේෂ හානිකරණය | | **(2,026)** | 13,205 | **3,710** | 11,798 |
| සේවක පිරිවැය | 8.1 | **3,188,212** | 2,835,367 | **3,178,961** | 2,783,961 |

## 8.1 සේවක පිරිවැය

| | | | | |
|---|---|---|---|---|
| වැටුප් හා වේතන | **1,787,790** | 1,570,479 | **1,782,941** | 1,507,207 |
| කාර්ය මණ්ඩලයට අදාළ වෙනත් පිරිවැය | **349,314** | 390,006 | **346,842** | 393,125 |
| ප්‍රසාද දීමනා | **222,143** | 173,421 | **221,746** | 182,060 |
| අතිකාල දීමනා | **388,090** | 333,222 | **387,740** | 334,253 |
| සේවක අර්ථසාධක අරමුදල් දායකය (EPF) | **248,081** | 201,740 | **247,423** | 201,235 |
| සේවක භාර අරමුදල් දායකය (ETF) | **49,893** | 40,947 | **49,752** | 40,824 |
| විශ්‍රාම ප්‍රතාලාභ වගකීම් (පාරිතෝෂිත) | **142,901** | 125,552 | **142,517** | 125,257 |
| | **3,188,212** | 2,835,367 | **3,178,961** | 2,783,961 |

| | | සමූහය | | සමාගම | |
|---|---|---|---|---|---|
| | දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා | **2018** | 2017 | **2018** | 2017 |
| | | **රු. 000** | රු. 000 | **රු. 000** | රු. 000 |
| **9** | **ආදායම් බදු වියදම** | | | | |
| **අ)** | **ප්‍රවර්තන ආදායම් බදු වියදම** | | | | |
| | වර්ෂය සඳහා ලාභය මත බදු (සටහන් 9.1) | **644,202** | 707,587 | **644,202** | 688,287 |
| | පෙර වර්ෂයට අදාළව ආශ්‍රිත/ පරිපාලිත සමාගම් වලින් ලාභාංශ මත රඳවාගැනීම් බදු/ (අධි) ඌණ බදු ප්‍රතිපාදන | **(18)** | (2,394) | **-** | (2,776) |
| | **ප්‍රවර්තන ආදායම් බදු වියදම් එකතුව** | **644,184** | 705,193 | **644,202** | 685,511 |
| **ආ)** | **විලම්බිත බදු වියදම/ (ප්‍රතිවර්තිත)** | | | | |
| | තාවකාලික වෙනස්කම් ඇතිවීම/ (ප්‍රතිවර්තිත) (සටහන් 9.2) | **(408,055)** | (258,882) | **(396,779)** | (259,613) |
| | **ආදායම් බදු වියදම/ (ප්‍රතිවර්තිත)** | **236,129** | 446,311 | **247,423** | 425,898 |

**9.1 බදු වියදම (ආදායම) සහ ගිනුම්කරණ/ ලාභය (පාඩුව) අතර සංඛ්‍යාමය සැසඳීම.**

ගණනය කළ යොදා ගත හැකි බදු පදනම හෙළිදරව් කරන යොදා ගන්නා බදු අනුපාතය මගින් ගුණ කරන ලද බදු වියදම (ආදායම) සහ ගිනුම්කරණ ලාභය/ (පාඩුව) ගුණිතය අතර සංඛ්‍යාමය සැසඳීම් කිරීම පහත දැක්වේ.

| | | | | |
|---|---|---|---|---|
| බදු පෙර ලාභය | **3,173,831** | 2,281,690 | **3,217,304** | 2,217,885 |
| ව්‍යාපාර නොවන ආදායම | **(2,863,923)** | (1,713,912) | **(2,857,544)** | (1,692,690) |
| **ආදායම් බදු වලට පෙර ගලපන ලද ලාභය** | **309,908** | 573,206 | **359,760** | 525,195 |
| ඉඩ දිය හැකි වියදම් එකතුව | **(921,988)** | (660,322) | **(858,351)** | (656,100) |
| ඉඩ දිය නොහැකි වියදම් එකතුව | **1,142,687** | 1,115,560 | **1,114,841** | 1,106,534 |
| **වර්ෂය සඳහා ගලපන ලද ව්‍යාපාර ලාභය** | **530,606** | 1,023,017 | **616,250** | 975,630 |
| පොලී ආදායම | **1,332,341** | 1,269,204 | **1,325,962** | 1,268,711 |
| බදු අයකළ යුතු පාරිභෝගික දායක ආදායම | **358,509** | 378,107 | **358,509** | 378,107 |
| වෙනත් ආදායම් ප්‍රභවයන් | **-** | 73,001 | **-** | 51,780 |
| **ව්‍යාපාරවලින් ව්‍යවස්ථාපිත ආදායම** | **2,221,456** | 2,743,330 | **2,300,721** | 2,674,228 |
| *අඩුකලා* | | | | |
| වර්ෂය තුළ උපයෝජනය කළ බදු පාඩුව | **(6,336)** | (173) | **-** | |
| **බදු අය කළ යුතු ආදායම** | **2,215,119** | 2,743,157 | **2,300,721** | 2,674,228 |
| **බදු අය කළ යුතු ආදායම** | | | | |
| බදු අය කළ යුතු ආදායම 12% | - | 378,107 | - | 378,107 |
| බදු අය කළ යුතු ආදායම 28% | **2,266,991** | 2,365,050 | **2,300,721** | 2,296,120 |
| | **2,266,991** | 2,743,157 | **2,300,721** | 2,674,228 |
| **ආදායම් බදු අය කළ යුතු** | | | | |
| විශේෂ අනුපාතය 12% | **-** | 45,373 | **-** | 45,373 |
| විශේෂ අනුපාතය 14% | - | | - | |
| සම්මත අනුපාතය 28% | **644,202** | 662,214 | **644,202** | 642,914 |
| **වර්ෂය සඳහා ලාභය මත බදු** | **644,202** | 707,587 | **644,202** | 688,287 |

සමූහය තුළ තනි සමාගම්වල බදු අය කළ යුතු ලාභය මත සමූහයේ බදු වියදම පදනම් වේ. වර්තමානයේ ශ්‍රී ලංකාවේ බදු නීතියෙන් සමූහ සඳහා බදු ප්‍රතිපාදන සලසා නොමැත.

අදාළ දේශීය ආදායම් පනතේ විධිවිධානවලට අනුකූලව බදු කටයුතු සඳහා සකස් කර ඇති පරිදි වර්ෂය සඳහා ගිනුම්කරණ ලාභයේ පදනම මත බදු සඳහා ප්‍රතිපාදන සලසා ඇත. එම ප්‍රතිපාදන ඇස්තමේන්තු කිරීමේදී, 2006 අංක 10 දරන දේශීය ආදායම් පනත සහ 2018 මාර්තු 31 දක්වා එයට කරන ලද සංශෝධන සමූහය විසින් යොදාගෙන ඇති අතර 2018 අප්‍රේල් 01 දිනෙන් පසු කාල පරිච්ඡේදය සඳහා 2017 අංක 24 දරන දේශීය ආදායම් පනත හා එයට කරන ලද සංශෝධන යොදා ගෙන ඇත.

| | | සමූහය | | සමාගම | |
|---|---|---|---|---|---|
| | දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා | **2018** | 2017 | **2018** | 2017 |
| | | **රු. 000** | රු. 000 | **රු. 000** | රු. 000 |
| 9.2 | **විලම්බිත බදු වියදම්** | | | | |
| | ආරම්භය හා තාවකාලික වෙනස්කම් ප්‍රතිවර්තනය | **(232,549)** | 381,644 | **(221,273)** | 380,924 |
| | **විලම්බිත බදු වියදමේ කොටස්** | | | | |
| | ***වියදම් හඳුනාගැනීම*** | | | | |
| | ලාභය හෝ පාඩුව | **(408,055)** | (258,882) | **(396,779)** | (259,613) |
| | වෙනත් විස්තීර්ණ ආදායම | **175,506** | 640,526 | **175,506** | 640,537 |
| | | **(232,549)** | 381,644 | **(221,273)** | 380,924 |

**9.3** නව සේවා සම්බන්ධතාවලින් ලැබුණු ආදායම් මුළු ප්‍රමාණය හඳුනා ගැනීමෙන් 1995/96 වර්ෂවලට අදාළව ආදායමම් බදු තක්සේරුවක් එම ආදායම් උපදවන ලද කාල පරිච්ඡේදය සඳහාම දේශීය ආදායම් දෙපාර්තමේන්තුව විසින් මතු කරන ලදී. එහෙත් එම ආදායම වර්ෂ 20 පුරා විලම්බිත පදනමින් ආදායම් ලෙස ගිනුම් ගත කිරීම ගිනුම් ප්‍රතිපත්තිය වේ.

සමාලෝචන මණ්ඩලයක් ඉදිරියේ මෙම කරුණු අභියාචනයකට ලක් කරන ලද අතර එම සමාලෝචන මණ්ඩලයේ විමර්ශනයේ නිගමනය මත අතිරේක ආදායමක් නොමැති බවත් 1995/96 තක්සේරු වර්ෂය සම්බන්ධයෙන් මතු කරන ලද ආදායම් බදු තක්සේරුව වලංගු නොවන බවත් තීරණය කරන ලදී. එබැවින් මෙම වගකීම සඳහා ප්‍රතිපාදනය කරන ලද රු. මිලියන 407.703 ක් 2008 වර්ෂයේදී ගිනුම්වලින් ඉවත් කරන ලදී.

2007/2008 තක්සේරු වර්ෂය සඳහා නිකුත් කරන ලද තක්සේරු දැන්වීමට එරෙහිව අභියාචනා පෙත්සම නිරවුල් කිරීම සඳහා 2010 වර්ෂයේදී දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ පැවැත් වූ රැස්වීමේදී පහත සඳහන් පදනම මත පාරිභෝගික දායකය සඳහා ක්‍රියා කරන ලෙස දේශීය ආදායම් දෙපාර්තමේන්තුව විසින් එකඟ වන ලදී.

- 2007/2008 තක්සේරු වර්ෂයේ සිට ලැබීම් ප්‍රාග්ධන දීමනා අනුපාතයට අනුරූප වන පරිදි වර්ෂ 8 ක කාලයක් විලම්බිත පදනම මත බදු වලට යටත් වේ.

- 2007/2008 තක්සේරු වර්ෂය ආරම්භයේදී පවත්නා පාරිභෝගික දායක ශේෂය එනම් විලම්බිත පදනම මත ඉදිරියට ගෙන එන ලද ප්‍රමාණය එනම්, වර්ෂ 20 ක කාලයක් විලම්බිත පදනම මත ආදායමට එකතු වේ.

ඒ අනුව 2011 වර්ෂය තුළදී නව සේවා සම්බන්ධතා වලින් ලැබුණු පාරිභෝගික දායකයන් ප්‍රාග්ධන දීමනා අනුපාතයට අනුකූලව වර්ෂ 3 ක කාලයක් විලම්බිත පදනම මත බදුවලට යටත් වේ.

**10 කොටසකට මූලික ඉපැයුම**

**10.1** වර්ෂය තුළ නිකුත් කළ සාමාන්‍ය කොටස් සංඛ්‍යාවේ බර තැබූ සාමාන්‍යය මගින් සමාගමේ සාමාන්‍ය කොටස් හිමියන් සඳහා වර්ෂයට අදාළ ශුද්ධ ලාභය බෙදීම මගින් කොටසකට මූලික ඉපැයුම ගණනය කරනු ලැබේ.

**10.2** කොටසකට මූලික ඉපැයුම ගණනය කිරීමේදී, ආදායම හා යොදා ගන්නා ලද දත්ත පදහත සඳහන් දත්තවලින් නිරූපණය වේ.

| | **සමූහය** | | **සමාගම** | |
|---|---|---|---|---|
| දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා | **2018**<br>**රු. 000** | 2017<br>රු. 000 | **2018**<br>**රු. 000** | 2017<br>රු. 000 |
| සාමාන්‍ය කොටස් හිමියන්ට වර්ෂයට අදාළ ශුද්ධ ලාභය | **2,946,320** | 1,820,981 | **2,969,881** | 1,791,987 |
| නිකුත් කළ බර තැබූ සාමාන්‍ය කොටස් සංඛ්‍යාව | **114,507** | 114,507 | **114,507** | 114,507 |
| **කොටසකට මූලික ඉපැයුම** | **25.73** | 15.90 | **25.94** | 15.65 |

සමාලෝචිත වර්ෂයේ කිසිදු අවස්ථාවක සාමාන්‍ය කොටස් බවට පරිවර්තනය කළ හැකි වෙනත් කොටස් නොවූයෙන් තනුක කරන ලද කොටසක ඉපැයුමම් අනුපාතය කොටසක මූලික ඉපැයුම් අනුපාතයට සමාන වේ.

11 දේපල, පිරියත හා උපකරණ

11.1 සමූහය

| | සින්නක්කර ඉඩම් එකතුව | සින්නක්කර ගොඩනැඟිලි | මෝටර් වාහන | පරිගණක | කාර්යාල උපකරණ | පිරියත හා යන්ත්‍රෝපකරණ | යටිතල පහසුකම් සැපයීම | කෙරීගෙන යන ප්‍රාග්ධන වැඩ | එකතුව |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | රු. 000 | රු. 000 | රු. 000 | රු. 000 | රු. 000 | රු. 000 | රු. 000 | රු. 000 |
| ***පිරිවැය*** | | | | | | | | | |
| 2018 ජනවාරි 01 දිනට ශේෂය | 2,659,514 | 795,209 | 1,401,734 | 333,000 | 364,099 | 67,136 | 21,397,783 | 816,343 | 27,834,817 |
| මාරු කිරීම්/ ප්‍රත්‍යාගණනය මත | 155,234 | (44,993) | (36,640) | | 36,640 | - | 1,111,311 | (1,111,311) | 110,241 |
| එකතු කිරීම් | 21,109 | 156,451 | 91,861 | 25,898 | 35,019 | 84,776 | - | 1,218,557 | 1,633,671 |
| නඩත්තු කොන්ත්‍රාත්තු සඳහා මාරුකිරීම් | - | - | - | - | - | - | - | (39,048) | (39,048) |
| ඉවත් කිරීම් | | | | | | | (54,929) | | (54,929) |
| **2018 දෙසැම්බර් 31 දිනට ශේෂය** | **2,835,857** | **906,667** | **1,456,955** | **358,898** | **435,758** | **151,912** | **22,454,165** | **884,541** | **29,484,753** |
| ***ක්ෂය*** | | | | | | | | | |
| 2018 ජනවාරි 01 දිනට ශේෂය | - | - | 692,379 | 275,705 | 316,699 | 59,103 | 14,099,388 | - | 15,443,274 |
| මාරු කිරීම් - ප්‍රත්‍යාගණනය මත | - | 12,627 | (56) | | 56 | - | - | - | 12,627 |
| වර්ෂය සඳහා ක්ෂය | - | 22,025 | 141,906 | 20,957 | 47,598 | 17,264 | 646,881 | - | 896,631 |
| ඉවත් කිරීම් | - | - | - | - | - | - | (35,967) | - | (35,967) |
| **2018 දෙසැම්බර් 31 දිනට ශේෂය** | **-** | **34,652** | **834,229** | **296,662** | **364,353** | **76,367** | **14,710,301** | **-** | **16,316,565** |
| **ලියා අඩු කළ අගය** | | | | | | | | | |
| **- 2018 දෙසැම්බර් 31 දිනට** | **2,835,857** | **872,014** | **622,725** | **62,236** | **71,405** | **75,545** | **7,743,863** | **884,541** | **13,168,188** |
| 2017 දෙසැම්බර් 31 දිනට | 2,659,514 | 795,209 | 709,354 | 57,295 | 47,400 | 8,033 | 7,298,395 | 816,343 | 12,391,543 |

## 11 දේපල, පිරියත හා උපකරණ

### 11.2 සමාගම

| | සින්නක්කර ඉඩම් | සින්නක්කර ගොඩනැඟිලි | මෝටර් වාහන | පරිගණක | කාර්යාල උපකරණ | යටිතල පහසුකම් සැපයීම | කෙරීගෙන යන ප්‍රාග්ධන වැඩ | එකතුව |
|---|---|---|---|---|---|---|---|---|
| | රු. 000 | රු. 000 | රු. 000 | රු. 000 | රු. 000 | රු. 000 | රු. 000 | රු. 000 |
| ***පිරිවැය*** | | | | | | | | |
| 2017 දෙසැම්බර් 31 දිනට ශේෂය | 2,630,985 | 683,465 | 1,397,126 | 330,832 | 331,059 | 21,397,783 | 730,662 | 27,501,911 |
| මාරු කිරීම්/ ප්‍රත්‍යාගණනය මත | 155,234 | (44,993) | (36,640) | | 36,640 | 1,111,311 | (1,111,311) | 110,241 |
| එකතු කිරීම් | 21,109 | 87,508 | 91,861 | 25,043 | 35,019 | - | 1,304,265 | 1,564,804 |
| නඩත්තු කොන්ත්‍රාත් සඳහා මාරු කිරීම් | - | - | - | - | - | - | (39,048) | :39,048) |
| ඉවත් කිරීම් | | | | | | (54,929) | - | (54,929) |
| **2018 දෙසැම්බරර් 31 දිනට ශේෂය** | **2,807,328** | **725,980** | **1,452,347** | **355,874** | **402,718** | **22,454,165** | **884,568** | **29,082,979** |
| ***ක්ෂය*** | | | | | | | | |
| 2017 දෙසැම්බර් 31 දිනට ශේෂය | - | - | 687,767 | 273,932 | 297,639 | 14,099,388 | - | 15,358,725 |
| මාරු කිරීම්/ ප්‍රත්‍යාගණනය මත | - | 12,627 | (56) | | 56 | - | - | 12,627 |
| වර්ෂය සඳහා ක්ෂය | - | 15,974 | 141,906 | 20,545 | 47,092 | 646,881 | | 872,398 |
| ඉවත් කිරීම් | - | - | - | - | - | (35,967) | - | (35,967) |
| **2018 දෙසැම්බර් 31 දිනට ශේෂය** | **-** | **28,601** | **829,617** | **294,477** | **344,787** | **14,710,302** | **-** | **16,207,783** |
| ලියා අඩු කළ අගය | | | | | | | | |
| **2018 දෙසැම්බර් 31 දිනට** | **2,807,328** | **697,379** | **622,730** | **61,397** | **57,931** | **7,743,863** | **884,568** | **12,875,196** |
| 2017 දෙසැම්බර් 31 දිනට | 2,630,985 | 683,465 | 709,359 | 56,900 | 33,420 | 7,298,395 | 730,662 | 12,143,184 |
| සම්පූර්ණයෙන් ක්ෂය කරන ලද වත්කම් | | | | | | | | |
| **2018 දෙසැම්බර් 31 දිනට** | **-** | **-** | **264,732** | **226,953** | **195,954** | **6,045,474** | **-** | **6,733,114** |
| 2017 දෙසැම්බර් 31 දිනට | - | - | 162,275 | 105,015 | 124,053 | 5,743,497 | - | 6,134,840 |

11.3 ඉඩම් හා ගොඩනැගිලිවල සාධාරණ අගය තක්සේරු දෙපාර්තමේන්තුව විසින් තීරණය කරන ලදී. තක්සේරුව 2017 දෙසැම්බර් 31 දිනට සිදු කරන ලදී.

සමාගමේ ඉඩම් හා ගොඩනැගිලි කැළණිය, කලුතර, නුගේගොඩ, මොරටුව, නාරාහේන්පිට, මීගමුව, ගාල්ල, කෝට්ටේ, නුවරඑළිය, වස්කඩුව, ඒකල, ජා ඇල, හික්කඩුව, පෑලියගොඩ, රාජගිරිය, අම්බලන්ගොඩ, බණ්ඩාරගම හා මහරගම පිහිටා ඇත.

මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් කළ යුතුව තිබුණු ප්‍රත්‍යාගණිත වත්කම් වල ඉදිරියට ගෙන යන අගය ක්ෂය අඩුකළ පිරිවැය වටිනාකමට වත්කම් පහත පරිදි වේ.

| | ඉඩම් | | ගොඩනැගිලි | | එකතුව | |
|---|---|---|---|---|---|---|
| | **2018** | 2017 | **2018** | 2017 | **2018** | 2017 |
| | **රු. 000** | රු. 000 | **රු. 000** | රු. 000 | **රු. 000** | රු. 000 |
| පිරිවැය | **604,051** | 582,942 | **458,331** | 370,823 | **1,062,382** | 953,765 |
| *අඩුකලා* | | | | | | |
| සමුච්චිත ක්ෂය | **-** | - | **135,238** | 125,603 | **135,238** | 125,603 |
| ධාරන අගය | **604,051** | 582,942 | **323,093** | 245,221 | **927,144** | 828,163 |

11.4 සමාගමේ දේපල, පිරියත හා උපකරණවල දළ ධාරණ අගය රු. බිලියන 6.7 ක් වූ සම්පූර්ණයෙන් ක්ෂය කරන ලද වත්කම් ඇතුළත් වේ.

11.5 සමාගමේ ඉඩම් සඳහා ඇතුල් කෝට්ටේ, ශ්‍රී ජයවර්ධනපුර මාවතේ අංක 953/1 දරන ස්ථානයේ ඉඩමක් ඇතුළත් වන අතර එහි ධාරණ අගය රු. මිලියන 69.5 ක් වේ.

2014 ජුලි 01 දිනැති අංක 1869/1 දරන ගැසට් නිවේදනය අනුව, ඉහත ඉඩම මහජනතාවගේ ප්‍රයෝජනය සඳහා අත්කර ගැනීමට රජය අදහස් කරන බව ඉඩම් අත්කර ගැනීම් නිවේදනවල දක්වා තිබුණි. කෙසේ වුවද පසුව ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ ප්‍රාදේශීය ලේකම් විසින් නිකුත් කරන ලද ලිපියක් මගින් එය ලංකා විදුලි (පෞද්ගලික) සමාගමට ආපසු භාර දෙන බව දන්වා තිබුණි.

## 12 ආයෝජන දේපල

| | සමාගම | |
|---|---|---|
| | **2018** | 2017 |
| | **රු. 000** | රු. 000 |
| ***පිරිවැය*** | | |
| ජනවාරි 01 දිනට | **63,281** | 63,281 |
| වර්ෂය තුළ එකතු කිරීම් | **68,943** | |
| දෙසැම්බර් 31 දිනට | **132,224** | 63,281 |
| ***සමුච්චිත ක්ෂය*** | | |
| ජනවාරි 01 දිනට | **2,560** | 1,535 |
| වර්ෂය සඳහා අය කිරීම් | **1,817** | 1,025 |
| දෙසැම්බර් 31 දිනට | **4,377** | 2,560 |
| **ලියා හළ අගය** | **127,847** | 60,721 |

ආයෝජන දේපලත් ලෙස වර්ගීකරණය කර ඇති ඉඩම් හා ගොඩනැගිලි එහි පර්පාලිත සමාගමට කුලියට දී ඇති අතර එය සමාග මේ ආයෝජන දේපලක් ලෙස වර්ගීකරණය කර ඇත. ගොඩනැගිල්ලේ පිරිවැය රු. මිලියන 110.195 ක් වූ අතර එහි ප්‍රයෝජනවත් ජීව කාලය වර්ෂ 40 කි. අත් කරගත් ඉඩම් පිරිවැය රු. මිලියන 22 කි.

2018 දෙසැම්බර් 31 දිනට ඉඩම් හා ගොඩනැගිලි වටිනාකමේ සාධාරණ අගයේ හොඳම ඇස්තමේන්තුව වත්කම්වල ලිය හළ අගයෙන් නියෝජනය බව අධ්‍යක්ෂවරු විශ්වාස කරයි.

